## 2021/03/09 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/03/09 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2021.03.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, අද දින සභා වාරයට පැමිණි උප සභාපතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ඉතාම ගෞරවයෙන් පිළිගන්නවා. අපි නැවත නැවත කිව යුතු නැහැ. සභා වාරය 9.30 නම් 9.30 ට සියලුම මන්ත්‍රීවරුන්ගේ පැමිණීම වගකීමක්. එයත් නිසියාකාරව ඉටු වෙන්නෙ නැහැ. මහජන නියෝජිතයෙක් හැටියට ඒක තමන්ගෙ වගකීම. ඒක හිතට ගන්නවනම් වඩා හොඳයි කියල මම හිතනවා. මාසෙකට එක සභා වාරයයි යෙදෙන්නෙ. ඒ නිසා අදත් සිහිපත් කරනවා. පළමුවෙන්ම සභා වාරයට නියමිත වේලාවට පැමිණ අසුන් ගත්තොත් ඒක වඩා හොඳයි කියලා. මම උප සභාපතිතුමා ඇතුලුව සියළුම මන්ත්‍රීවරු පිළිගනිමින්, විශේෂයෙන්ම අද සිහිපත් කළ යුතු කරුණක් තියෙනවා. මීට වසර 30 කට උඩදි මේ සභාවෙ සභාපතිත්වය දැරූ, මීට දින කීපයකට උඩදි අභවප්‍රාප්ත වුනු, නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ප්‍රථම ප්‍රාදේශීය සභා ගරු සභාපති, ඒ වගේම දකුණු පළාත් සභාවේ සභා නායක, ඒවගේම අමාත්‍ය ධූර ගණනාවක් හොබවමින්, වැඩ බලන මහ ඇමති ධූරයත් දරමින්, විශාල සමාජ සේවාවක් කරපු මේ ගමෙන් බිහි වුන දේශපාලන නායකත්වයක් වුනු යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා වෙනුවෙන් නාගොඩ ප්‍රාදේශීය සභාවෙත් ශෝක යෝජනාවක් මම පළමුවෙන්ම මේ අවස්ථාවෙ ඉදිරිපත් කරනවා. ඒ වෙනුවෙන් අප සියලු දෙනාම නැගිට එතුමාට ගෞරවයක් හැටියට විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් නැවත වරක් පුද කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ සභාවෙ ප්‍රථම සභාපති හැටියට එතුමා අවුරුදු තුනක සේවාවක් ඉටු කරලා, තමයි පළාත් සභාවට ගියේ. එහෙමනම් අද මේ අවස්ථාවෙ පැමිණි සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගනිමින්, අද සභාවෙ කටයුතු ආරම්භ කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. වර්ථමානය වන විටත් අපට නිදහස් නොවුන මේ වසංගත තත්වය තවමත් මේ අවස්ථාවෙත් බල ප්‍රදේශයේ, උඩුගම, උඩලමත්ත, තල්ගස්වල ප්‍රදේශවලත් මේ කොවිඩ් වසංගත තත්වය මේ වෙන කොටත් ඇතිවෙල තියෙනවයි කියලා අපි දැනුවත් වුනා. ඒ අනුව අපි ඒවයින් ප්‍රවේසම් වෙලා, අපේ සභා වාරය ආරම්භ කරන්න ඕන. අද සභාවාරය හොඳ සභාවාරයක් හැටියට පවත්වාගෙන යාමට, සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙන මෙන් මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**(අ)01. 2021.02.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත**

2021.02.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම මැයෙන් පළාත් පාන දෙපාර්තමේන්තුව. දකුණු පළාත් විසින් 2021.03.01 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. උනන්විටිය නැගෙනහිර බෝගහ අසළ පිහිටි ප්‍රජා මණ්ඩල දෙමහල් ගොඩනැගිල්ල සඳහා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සළසා දෙන මෙන් ඉල්ලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් 2021.03.02 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

03. විනිමුල්ලකන්ද කිරිමැටිය මාර්ගය, කැකිල්ල කැටියකන්ද මාර්ගය, බීඩී5 දුමින්ද මහතාගේ නිවස අසළ සිට පන්සල පාර දක්වා කෙටි මාර්ගය ජේසීබී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

04. මානගොඩ පාර නො.20 මාර්ගයේ 3 වන පටුමඟ, අතුල මාවත, රණවිරුගම කොස්ගහබංගලාව මාර්ගය, කැන්දගස්දූව මාර්ගය, දියවරගම 5 වන පටුමඟ, කළුකොත මානම්පිට මාර්ගය, ගොරකගස්තුඩුව කලුවැල්දෙණිය මාර්ගය, කුඹුරුහේන කණිෂ්ඨ විද්‍යාල මාර්ගය, නො.20 කුඹුරුහේන පාර, නාවින්න ටැංකි 12 මාර්ගය යන මාර්ගයන් සඳහා හියුම් පයිප්ප ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් 2021.03.01 දිනැතිව යොමු කරන ලද ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

05. 2021 ජනවාරි මස 18 සහ 25 යන දිනයන් දෙක හා 2021 පෙබරවාරි මස 01 වන දින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් උඩුගම සති පොළ පැවැත්වීමට නොහැකි වූ බැවින් එම දින තුනට අදාළව පොළ බදු මුදල් වලින් නිදහස් කර දෙන ලෙස ඉල්ලා පොළ බදු කරු වන ඩබ්.ඒ.ටී.කේ.වීරසිංහ මහතා විසින් 2021.02.16 දිනැතිව යොමු කරන ලද ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

**ආදායම් පරීක්ෂකගේ නිරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කිරීමට එකඟතාවය හිමි විය.**

06. 2021 ජනවාරි මස 06 සහ 13 යන දිනයන් දෙක තුල කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් තල්ගස්වල සති පොළ පැවැත්වීමට නොහැකි වූ බැවින් එම දින දෙකට අදාළව පොළ බදු මුදල් වලින් නිදහස් කර දෙන ලෙසත්, ජනවාරි මස 20, 27 හා පෙබරවාරි 03,10,17 සහ 24 යන දිනයන්හි සති පොළ පැවැත්වුවද, වෙළඳුන්ගේ හා ජනතාවගේ පැමිණීම 50% ක් පමණ අඩු වූ බැවින් සභාවට බැදිය යුතු මාසික වාරික මුදලින් 50% ක මුදලක් පමණක් අය කර ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලා පොළ බදු කරු වන මාලනී බණ්ඩාරිගොඩ මහත්මිය විසින් 2021.03.01 දිනැතිව යොමු කරන ලද ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

**ආදායම් පරීක්ෂකගේ නිරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කිරීමට එකඟතාවය හිමි විය.**

07. PF 7360 දරණ කැබ් රථයේ පිටුපස ෂොකැබ් ෂෝබර් දෙක ගෙවී ඇති බැවින් එය අලුතින් යොදා අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා එම්.ඒ. වසන්ත , රියදුරු විසින් යොමු කරන ලද 2021.02.22 දිනැති ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

08. යටලමත්ත, 70කන්ද, පංසල් භූමියට ඉදිරිපස පාරට යටිපස ඇති ඉඩම් හා නිවාසවලට පාරට උඩ පිහිටි ඉඩම්වලින් ගලා එන වැසි ජලය හේතුවෙන් පාරට යටිපස නිවැසියන් අපහසුතාවයට පත්වන බවත්, ඉඩම් සෝදා පාළුවට ලක්වන බවත්, දන්වා ඒ සඳහා කඩිනම් විසඳුමක් යොදන ලෙස ඉල්ලා බන්දුසේන නාගොඩවිතාන මහතා විසින් 2021.02.18 දිනැතිව යොමු කරන ලද ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 36 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**2021.03.09 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2021 පෙබරවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 9197.20 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු.1173.30 |
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2813189405 | -තල්ගස්වල පෙර පාසල | - රු. 294.90 |
| 4507357802 | - සමනල පෙර පාසල | - රු. 258.30 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු.1374.60 |
| 4509082908 | - උක්ඹිට පෙර පාසල | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 294.90 |

**2021 ජනවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු.1466.10 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |

**02. 2021 ජනවාරි මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 5515.84 |
| ii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |

iii. 0912296537 - සභාපතිතුමාගේ නිල කාමරය - රු. 3892.11

**03. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

මාපලගම උප කාර්යාලයේ හිඟ දුරකථන බිල්පත් පියවීම

| | |
|---|---|
| 2016 ජනවාරි | - රු. 440.05 |
| 2016 පෙබරවාරි | - රු. 440.05 |
| 2016 මාර්තු | - රු. 696.63 |

තුතූ

**04. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම 091-5701722

(2021.01.16- 2021.02.15) - රු. 613.01

**05.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2021.01.20 – 2021.02.19) -රු. 1559.70

33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2021.01.20- 2021.02.19)-රු. 1630.73

**06 .2021 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සදහා)**

| | | |
|---|---|---|
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.එල්.එන්.ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 4360.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**07. 2021 ජනවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| ඩබ්.ඒ. ශාන්ත මයා | - සංවර්ධන නිලධාරී | - රු. 2400.00 |
| යූ.වී.මදුර ප්‍රභාත් | - කාර්යාල කාර්ය සහායක | -රු. 2930.00 |
| ඩබ්.එස්.සී.මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 3620.00 |
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3620.00 |

**2021 පෙබරවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 510.00 |
| පී.ඩී.යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 520.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 2100.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 2058.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 988.00 |
| පී.ජී.අයි.ලක්මාලි මිය | - සංවර්ධන නිලධාරී (පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය) | - රු. 1856.00 |
| ඩබ්.එස්.සී.මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 390.00 |
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 390.00 |

**2021 මාර්තු මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 2326.00 |
| පී.කේ.එම්.වාසනා මෙය | - කළමණාකරණ සහකාර | - රු. 4594.00 |

**<u>08. අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2021 පෙබරවාරි මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.ඩී.චන්ද්‍රප්‍රභා මිය | - කළමනාකරණ සහකාර | - රු. 2069.28 |
| බී.ඩී.රුවිනි චතුරිකා මිය | - කළමණාකරණ සහකාර | - රු. 1989.33 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.04 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8560.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8666.40 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 4546.80 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කර | - රු. 2431.60 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8346.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 6982.69 |
| කේ.එච්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - අනියම් රියදුරු | - රු. 7597.00 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 3931.25 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 2047.50 |

**<u>අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2021 ජනවාරි මස</u>**

| | | |
|---|---|---|
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 2362.50 |

**09. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 පෙබරවාරි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

ii. 2021.02.10 දින පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සහභාගී වූ නිලධාරීන් සඳහා දීමනා ගෙවීම - රු. 3000.00

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 ජනවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 599ක් | - රු. 62296.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 270 ක් | - රු. 28080.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 145 ක් | - රු. 15080.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 150 ක් | - රු. 15600.00 |
| පවර් ඔයිල් ලීටර් ½ | - රු. 400.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 210 ක් | - රු. 27550.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 30 ක් | - රු. 3120.00 |
| DS 40 Oil 1L | - රු. 750.00 |
| ජලභීතිකා රෝගය මර්ධනය කිරීම වෙනුවෙන් පෙට්‍රල් ලීටර් 5 | - රු. 685.00 |
| ගබඩාව පෙට්‍රල් ලීටර් 25 | - රු. 4025.00 |
| 2T Oil ලීටර් 1 | - රු. 620.00 |

**එකතුව** **- <u>රු.163406.00</u>**

**11. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 පෙබරවාරි - රු. 5230.00

**12. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 පෙබරවාරි - රු. 6090.00

**13. යූ.ජී. චානක ප්‍රියංග මයා, සන්සේයා ස්ටුඩියෝ, නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ පත්වූ ගරු මන්ත්‍රී මණ්ඩලයේ
සමූහ ඡායාරූපය ලබා දීම සඳහා යන වියදම පියවීමේ බිල්පත - රු. 40500.00

**14. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා මාර්තු මස මාසික කුලීය ගෙවීම- රු. 5000.00

**15. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
2021 පෙබරවාරි 04 නිදහස් උත්සවය වෙනුවෙන් නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන
කාර්යාලයේ ආලේප කිරීම සඳහා අවශ්‍ය 5 වොට් බල්බ් ලබා ගැනීමේ බිල්පත- රු. 2625.00

**16. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**
i. ප්‍රාදේශීය සභාවේ 2021.02.09 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ
සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 7135.00

**17. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.20160.00

**18. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
ගරු උප සභාපතිතුමාගේ නිල කාමරය සඳහා දුරකථනයක් ලබා ගැනීමේ බිල්පත - රු. 2955.00

**19. විගණකාධිපති, විගණන කාර්යාලය**
i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**20. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 පෙබරවාරි) - රු.13000.00

**21. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**
i. ප්‍රාදේශීය සභාවේ 2021.02.09 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ
සංග්‍රහ බිල්පත - රු. 4444.00

**22.කේ.ජී.බන්දුල ප්‍රියන්ත මයා, නාගොඩ**
මාපලගම වෙලද සංකීර්ණයේ විදුලි මීටරය ස්ථාපිත ආරක්ෂිත ගෘහය සඳහා
වීදුරුවක් සහ අගුළු යොදා අළුත්වැඩියා කිරීම - රු. 1429.00

**23. ජී.එච්.චමින්ද ලක්මාල් මයා, ලක්මාල් ට්‍රේලර්ස්, මත්තක**
සෞඛ්‍ය කම්කරුවන් හා රියදුරන් සඳහා මුඛ ආවරණ ලබා ගැනීමේ බිල්පත - රු. 1250.00

**24. කේ.එම්.ටී. ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල**
වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය LED බල්බ් මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 45500.00
වීථි පහන් උපාංග මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 78400.00

**25. එම්.ඒ.ආරියවංශ මයා ආරියවංශ මෝටර්ස්, නාගොඩ**
වතු මෝටරයේ රාමුව පැස්සීම හා එන්ජිමේ ඔයිල් මාරු කර අළුත්වැඩියා
කිරීමේ බිල්පත - රු. 1450.00

**26. දිලිනි දිසානායක මිය, තාක්ෂණ නිලධාරී**
කර්මාන්ත ඉදිකිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා සති අන්ත දිනයන්හි රාජකාරි කටයුතු කිරීම
වෙනුවෙන් ගෙවීම් - රු. 3326.00

**27. අරුණ ඉලෙක්ට්‍රිකල්ස්, ගාල්ල**
වීථි පහන් උපාංග ලබා ගැනීමේ බිල්පත - රු. 39000.00

**28. පී.එල්.රංජන් මයා, ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල**
නවක තාක්ෂණ නිලධාරීතුමාගේ හා තාක්ෂණ නිලධාරීතුමියගේ නිල මුද්‍රා සකස්
කිරීමේ බිල්පත - රු. 2000.00

**29. ගෙස්ටෙට්නර් ඔෆ් සීඑල්සී, කොළඹ 02**
එම් පී 2001 එල් ඡායා පිටපත් යන්ත්‍රයේ අමතර කොටස් යොදා අළුත්වැඩියා
කිරීමේ බිල්පත - රු. 17118.00

**30. එක්සලන්ට් ඇඩ්ස් ඇන්ඩ් කා(ර්) කෙයාර්**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සභාපති යූ.ජී.ඩී.ආරියතිලක මැතිතුමාගේ අභාවය
වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමේ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදාළ බිල්පත පියවීම- රු. 2900.00

**31. ඊබේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම**
නාගොඩ මහජන පුස්තකාලයේ අලුත් පරිගණක සඳහා මෘදුකාංග
ඇතුල් කිරීමේ බිල්පත - රු.1350.00

**32. කේ.ඩී.ජයලාල් මයා, මගහේනවත්ත, යටලමත්ත**
තුන්හවුල් කැල්ල මහගෙදරවත්ත ලැලි පාලම කිතුල් පටි යොදා අලුත්වැඩියා
කිරීමට අදාළව මුදල් ගෙවීම - රු. 24000.00

**33. ඩී.ආර්.ශ්‍යාමන් සෝමසිරි මයා, ඉංජිනේරු කාර්යාලය, උඩුගම ඩිපෝව**
වාහන අළුත්වැඩියා සඳහා නිර්දේශ වාර්තා ලබා දීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 2000.00

**34. නිව් විජය මෝටර්ස්, ගාල්ල**
LL 7103 ටිපර් රථය සඳහා බැටරි 02 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 53600.00

**35.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2021.02.05 දින කැඳවූ එල් SP 138 දරණ නඩුවට අදාළව
නීතිඥ හා පෙනී සිටීමේ, ගාස්තු - රු. 5000.00

ii. 2021.02.10 දින කැඳවීමට නියමිත පී 15977 දරණ නඩුවට අදාළව වෙනුවෙන් නීතිඥ හා
පෙනී සිටීමේ, ගාස්තු - රු. 3000.00

**36.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2021 පෙබරවාරි මස
දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2021 පෙබරවාරි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන්
ගෙවීම් - රු.1995.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. 222/B, ඌරල මධ්‍යම ග්‍රාම නිලධාරී වසමට අයත් කොතේගොඩකන්ද මාර්ගයේ ඒ.කේ. කමලාවතී මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය හරහා සිළිංඩර් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. 222/B, ඌරල මධ්‍යම ග්‍රාම නිලධාරී වසමට අයත් ගමගේවත්ත මාර්ගයේ ගිලා බැස ඇති ස්ථානය සඳහා සිළිංඩර් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 222 ඌරල උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් ඉහල කටඹුරාව වතු නිවාස සංකීර්ණයට ගමන් ගන්නා මාර්ගයේ ගිලා බැස ඇති සිළිංඩරය වෙනුවට නව සිළිංඩරයක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. ගයාන් මදුසංක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. 214/D , මාරකන්ද ග්‍රාම නිලධාරී වසමට අයත් නාවින්න කුඩමලාන මාර්ගය සඳහා අවශ්‍ය කරන බෝක්කු ලබා දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.ජී.ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. 217/C ගම්මැද්දේගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් එකම පොදු ගොඩනැගිල්ල වන ප්‍රජා ශාලාව ඉදි කර ඇති ඉඩමේ අයිතිය නීත්‍යානුකූල කර ගැනීමට පියවර ගන්නා ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. හෝමදොල ජන උදාන ගම්මානයේ මැද පාර යූ.ජී.ඩී.ආරයතිලක මාවත නමින් නම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| | |
|---|---|
| 01. සඳරුස්ගම 59 හේන වතු මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | -රු. 100,000.00 |
| 02. කුරුන්ද දාවුල්හේන මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | -රු. 50,000.00 |
| 03. සඳරුස්ගම බටහේන්ගොඩ මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | -රු. 50,000.00 |
| 04. මැණික්දොළකන්ද මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | -රු. 100,000.00 |
| 05. උඩලමත්ත හඟරන්වල මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | -රු. 50,000.00 |
| 06. උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල මුක්තවිල මාර්ගය කොරිපස් දමා සංවර්ධනය කිරීම | - රු. 72,000.00 |
| 07. හෝමදොල 65 මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | - රු. 42,500.00 |
| 08. ජන උදාන ගම්මානය මැද මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | - රු. 25,000.00 |
| 09. හෝමදොළ හිල්සයිඩ් කන්ද මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | - රු. 25,000.00 |
| 10. නො.20 4 වන පටුමඟ JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | - රු. 15,000.00 |
| 11. කළුකොත මානම්පිට මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | - රු. 37,500.00 |
| 12. රණවිරුගම කොස්ගහබංගලාව මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | -රු.37,500.00 |
| 13. නාවින්න වැව මායිම මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | - රු. 30,000.00 |
| 14. ගොරකගස්තුඩුව කළුවැල්දෙණිය මාර්ගයේ කොටසක් JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම | - රු. 30,000.00 |
| 15. ඇටඹගහවිල කෘෂි මාර්ගයේ දොලේකඩේ පිවිසුම අසළ සපත්තු පාලම ඉදි කිරීම | - රු.200,000.00 |

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

16. උඩුගම සතිපොළේ නව කඩකාමර ඉදිකිරීම අදියර 2 - රු.500,000.00
17. උඩුගම සතිපොළ සංවර්ධනය කිරීම ප්‍රාග්ධන වැඩසටහන - 2021 - රු.500,000.00
18. හෝමදොල මැණික්කඩේ අසළ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදි කිරීම -රු. 106,579.76

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

19. උනන්විටිය ක්‍රීඩාංගනයෙහි නව දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩා පිටිය ඉදි කිරීම - රු. 1,500,000.00
20. උඩුගම දකුණ ක්‍රීඩාංගනයෙහි නව දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩාපිටිය ඉදිකිරීම - රු. 1,500,000.00
21. බෝගහහංදිය අසළ ක්‍රීඩා පිටිය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම -රු. 50,000.00
22. තල්ගස්වල රාජ්‍ය වැවිලි සංස්ථාව මැද කොටස ක්‍රිඩා පිටිය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 50,000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ මංසන්ධි ආලෝකකරණ වීථිපහන් සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය<br>කෝබ්‍රා ටයිප් | අරුණ ඉලෙක්ට්‍රිකල්ස්, යක්කලමුල්ල - වගකීම මාස 6 රු. | ජෙම් ලයිට්, කලුතර වගකීම - අවු.03 රු. | කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල වගකීම අවු.02 ප්‍රවාහනය නොමිලේ රු. |
|---|---|---|---|
| LED 150W | 9950.00 | 10700.00 | 10600.00 ඔරේන්ජ් |
| LED 100W | 7800.00 | 8200.00 | 8150.00 ඔරේන්ජ් |
| LED 50W | 4450.00 | 4950.00 | 4950.00 ඔරේන්ජ් |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ මංසන්ධි ආලෝකකරණ වීථිපහන් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ජෙම් ලයිට්, කලුතර මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ මංසන්ධි ආලෝකකරණ වීථිපහන් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය පොදු ආකෘති පත්‍ර මිළදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය<br>පොදු ආකෘති පත්‍ර | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව<br>රු. |
|---|---|

| | |
|---|---|
| පොදු 232 කොල 100 | 100.00 |
| පොදු 185 කොල 100 | 100.00 |
| සෞඛ්‍ය 169 කොල 100 | 250.00 |
| 157අ(7)161 කොල 100 | 150.00 |
| පොදු 18 පොත් 01 | 200.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය පොදු ආකෘති පත්‍ර මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව එකම මිළ ගණන් ඉදිරිපත් කල රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය පොදු ආකෘති පත්‍ර මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**පුස්තකාල ලිපිද්‍රව්‍ය සඳහා වන මිළ ගණන්**

| **විස්තරය**<br>**පුස්තකාල ලිපිද්‍රව්‍ය** | **ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, අධ්‍යාපන අමාත්‍යාංශය රු.** |
|---|---|
| දින පත්‍රිකා (සිංහල දෙමල) 100 | 50.00 |
| පොත් තුණ්ඩු (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) 100 | 150.00 |
| සාමාජික බලපත්‍ර (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) 100 | 200.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලවලට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව එකම මිළ ගණන් ඉදිරිපත් කල **ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, අධ්‍යාපන අමාත්‍යාංශය** මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලවලට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ඉල්ලුම්පත් මුද්‍රණය කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| **විස්තරය** | **පන්සිළු ක්‍රියේෂන්ස්, ගාල්ල** | **ජයන්ත ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, බෙලිගහ** | **ජේ.පී. කමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ට් ෂොප්, නාගොඩ** |
|---|---|---|---|
| **ඉල්ලුම්පත් මුද්‍රණය A4 ඩුප්ලෝ ගේජ් 70** | **තනිපැත්ත - 2.60**<br>**දෙපැත්ත -2.85** | **තනිපැත්ත - 2.50**<br>**දෙපැත්ත -2.75** | **තනිපැත්ත - 2.55**<br>**දෙපැත්ත -2.80** |
| **A3 ඩුප්ලෝ ගේජ් 70** | **තනිපැත්ත - 3.60** | **තනිපැත්ත - 3.50** | **තනිපැත්ත - 3.60** |

| | දෙපැත්ත -3.80 | දෙපැත්ත -3.75 | දෙපැත්ත -3.90 |
|---|---|---|---|

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍යා ඉල්ලුම්පත් මුද්‍රණය කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ජයන්ත ඔප්සෙට් ප්‍රින්ටර්ස්, බෙලිගහ මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍යා ඉල්ලුම්පත් මුද්‍රණය කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>වීථි පහන් උපකරණ සදහා මිල ගණන් කැඳවීම - 2021 සාරාංශය</u>**

| | විස්තරය | අරුණ ඉලෙක්ට්‍රිකල්ස් - යක්කලමුල්ල | ප්‍රභාත් ඉලෙක්ට්‍රොනික්ස් - තල්ගම්පල | දයානි ට්‍රේඩ්සෙන්ටර් මාපලගම | කේ.එම්.ටී. ඩිස්ට්‍රිබියුටර්ස් - යක්කලමුල්ල | ජයනි ඉලෙක්ට්‍රිකල්ස් - ඉමදූව |
|---|---|---|---|---|---|---|
| 1. | 16 Amp වීදි ලාම්පු වහරු (metal clad) | 1150.00 | 2260.00 | 950.00 | 2250.00 | 2300.00 |
| 2. | 32 Amp වීදි ලාම්පු වහරු (metal clad) | | | 1650.00 | | |
| 3. | B22/E27 18 W/20W CFL බල්බ SLS 1231 අවම තරු 4 සහ වගකීම් කාල සීමාව මාස 18 | | 395.00 ඔරේන්ජ් වගකීම අවු 1.5 | 575.00 ඔරේන්ජ් 610.00 ඔරේන්ජ් | 380.00 ඔරේන්ජ් වගකීම අවු 1.5 | 390.00 ඔරේන්ජ් වගකීම අවු 1.5 |
| 4. | 23 උ සතබ බල්බ - SLS 1231 අවම තරු 04 සහ වගකීම් කාල සීමාව මාස 18 | | 550.00 ඔරේන්ජ් වගකීම අවු 1.5 | 610.00 ඔරේන්ජ් | 500.00 ඔරේන්ජ් වගකීම අවු 1.5 | 520.00 ඔරේන්ජ් වගකීම අවු 1.5 |
| 5. | 110 W සෝඩියම් වේපර් බල්බ් E 27 | 2390.00 | | | | |
| 6. | 150 වොට් සෝඩියම් බල්බ් | 1190.00 | | | | |
| 7. | 125 W MV චෝක් කොයිල් (Ballast) | 790.00 | | | | |
| 8. | 150 වොට් චෝක් Ballast) | 1490.00 | | | | |
| 9. | E 27 – පෝසිලේන් සෙරමික් හෝල්ඩර් | 120.00 | | 100.00 | | |
| 10 | E 40 - – පෝසිලේන් සෙරමික් හෝල්ඩර් | 250.00 | | 400.00 | | |
| 11 | 150 වොට් ඉග්නේටර් | 490.00 | | 550.00 | | |
| 12 | කනෙක්ටර් බාර් (10Amp 400 V) යුගල | 90.00 | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 06 | | | | | |
| 13 | ටූ පින් හෝල්ඩර් | 90.00 | 120.00 ඔරේන්ජ් | 100.00 | 90.00 ඔරේන්ජ් කෙව්ල්ටන් | 110.00 ඔරේන්ජ් /කෙව්ල් ටන් |
| 14 | පී. වී. සී. 1/1.13 වයර් SLS 733 (කොයිල් 01) | 2250.00 | 2550.00 ඔරේන්ජ්/ඒසී එල් | 2900.00 ඔරේන්ජ් | 2300.00 ඔරේන්ජ් කෙව්ල්ටන්/ඒ සී එල් | 2350.00 ඔරේන්ජ් /වයර්ම න් |
| 15 | ඒරියල් බන්ඩල් කනෙක්ටර්ස් (T- Off Connectors) | 165.00 | 275.00 | | 260.00 | 270.00 |
| 16 | ටම්බලර් ස්විච් 10 (Tumbler switch) SLS 1000 | 165.00 | 190.00 ඔරේන්ජ් වගකීම ආයු කාලය | 180.00 | 160.00 ඔරේන්ජ් වයර්මන් වගකීම ආයුකාලය | 185.00 ඔරේන්ජ් /වයර්ම න් වගකීම ආයුකා ලය |
| 17 | පී. වී. සී. ඉලෙක්ට්‍රිකල් ඉන්සියුලේෂන් ටේප් රෝල් SLS ප්‍රමිතිය)1.90cmx9.14m x0.125mm | 70.00 නො 01 | 75.00 ඔරේන්ජ් | 70.00 | 65.00 ඔරේන්ජ් | 70.00 ඔරේන්ජ් |
| 18 | 12W -12.5 W LED E 27 බල්බ -(1200-1250 lumens) Day Light /Warm White වගකීම් කාල සීමාව අවම වසර 2 ක් විය යුතුය. | 575.00 කැළණි | 700.00 ඔරේන්ජ් වගකීම අවු 2 | 700.00 | 570.00 ඔරේන්ජ් වගකීම අවු 2 | 650.00 ඔරේන්ජ් වගකීම අවු 2 |
| 19 | 20W LED E 27 බල්බ - (Warm White)(1900- -2000 lumens) වගකීම් කාල සීමාව අවම වසර 2ක් විය යුතුය.*IP 65 | 1150.00 කැළණි | 1400.00 ඔරේන්ජ් වගකීම අවු 2 | | 1125.00 ඔරේන්ජ් වගකීම අවු 2 | 1375.00 ඔරේන්ජ් වගකීම අවු 2 |
| 20 | 40W LED E 27 බල්බ - (Day light/Warm white)(1900- -2000 lumens)අවම ලූමන 4000 ක් සහ වසර 02ක අවම වගකීම් කාලයක් සහිත විය යුතුය.*IP 65 | 1750.00 කැළණි | 1950.00 ඔරේන්ජ් වගකීම අවු 2 | | 1700.00 ඔරේන්ජ් වගකීම අවු 2 | 1800.00 ඔරේන්ජ් වගකීම අවු 2 |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වීදි පහන් උපකරණ මිලදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් අයිතම අංක

1,5,6,7,8,9,10,11,12,14,15 යන උපකරණ අරුණ ඉලෙක්ට්‍රිකල්ස්, යක්කලමුල්ල වෙතින්ද අයිතම

| | **ලිපි ද්‍රව්‍යයේ නම** | ඒ.ජේ.ජී. ස්ටේෂනරි - ගාල්ල | දුලාරා ස්ටේෂනරි- ගාල්ල | රෙනුල ස්ටේෂනරි - ගාල්ල | ජයවර්ධන ට්‍රේඩර්ස් - ගින්තොට |
|---|---|---|---|---|---|

අංක 3,4,13,16,17,18,19,20 යන උපකරණ කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල වෙතින්ද මිළදී ගැනීම සුදුසු බවත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත එම එක් එක් වීජී පහන් අයිතම ඒ අදාළ ආයතනයෙන් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**ලිපිද්‍රව්‍ය සඳහා ලැබී ඇති මිළ ගණන්**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 4 සුදු පාට ෆොටෝ කොපි පැකට්01 (ඇවලොන්) ගේජ් 80 | 570.00 NK 80<br>580.00 JK 80 | 585.00 jk 80 | 575.00 nk 80<br>585.00 jk 80 | 565.00 |
| 2. | 4 විවිධ පාට ෆොටෝ කොපි පැකට්01 ගේජ් 80 | 500.00 | 510.00 rainbow | 510.00 rainbow | |
| 3. | 4 පාට ෆොටෝ කොපි පැකට්01 ගේජ් 80 | 975.00 light co<br>1075.00 dark co | 980.00 light co<br>1080.00 dark co | 985.00 light co<br>1175.00 dark co | |
| 4. | පෑන් | 16.50 atlas<br>8.50max<br>8.50ten | 8.70 max | 17.00 atlas<br>9.00 max | |
| 5. | සයින් පෙන් | 55.00 snow white<br>37.50 mrico point | 60.00 snowhit | 58.00 snowhit | |
| 6. | පර්මනන්ට් මාකර් පෙන් | 50.00 gxin<br>130.00 monami | 135.00 monami | 65.00 gxin | |
| 7. | රෝනියෝ ශීට් | 350.00 | 370.00 | 360.00 | |
| 8. | රාජකාරි ගමන් මලු (කාන්තා-පිරිමි) | 9750.00 | 9870.00 | 9850.00 | |
| 9. | පාට ඩිමයි කොල | 8.00 | 10.00 | 10.00 | |
| 10. | පොලිතින් අගල් 12 පීපී | 13.00 1m | 14.00 1m | 15.00 | |
| 11. | වයිට්බෝඩ් පෙන් | 50.00 gxin<br>130.00 monami | 135.00 monami | 65.00 gxin | |
| 12. | ෆයිල් කවර සාමාන්‍ය (100) | 425.00 | 430.00 nalaka | 430.00 nalaka | |
| 13. | CR පිටු 40 පොත් (ඇට්ලස් ) | 52.50 atlas | 60.00 atlas | 53.00 | |
| 14. | CR පිටු 80 පොත් (ඇට්ලස් | 82.00 atlas | 85.00 atlas | 83.00 | |
| 15. | CR පිටු 120 පොත් (ඇට්ලස් ) | 120.00 atlas | 130.00 atlas | 125.00 | |
| 16. | CR පිටු 160 පොත් (ඇට්ලස් ) | 157.50 atlas | 160.00 atlas | 159.00 | |
| 17. | CR | 189.00 atlas | 195.00 atlas | 192.00 | |
| 18. | 3 x 6 ලිපි කවර (නො 01) | 75.00indian manila 100 nos | 80.00 indian manila 100 nos | 78.00 | |
| 19. | 9 x 4 ලිපි කවර (නො 01) | 140.00 indian manila 100 nos | 150.00 indian manila 100 nos | 150.00 | |
| 20. | 9 X 4 X චෙක් කවර (නො 01) | 175.00 indian manila 100 | 190.00 indian manila 100 | 185.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | nos | nos | | |
| 21. | 12 x 10 ලිපි කවර (නො 01) | 450.00 indian manila 100 nos | 470.00 | 460.00 | |
| 22. | 15 x 10 ලිපි කවර (නො 01) | 550.00 indian manila 100 nos | 560.00 indian manila 100 nos | 560.00 | |
| 23. | 9 x 6 ලිපි කවර (නො 01) | 260.00 indian manila 100 nos | 270.00 indian manila 100 nos | 270.00 | |
| 24. | වීප් බෝඩ් | 35.00 | 38.00 | 38.00 | |
| 25. | පෝස්ට් ස්ටික් (කුඩා No 1) | 65.00 strip | 70.00 strip | 68.00 strip | |
| 26. | ටිපෙක්ස් | 52.50 primium | 70.00 atlas | 54.00 primium | |
| 27. | ඔයිල් පේපර් | 5.00 | 7.00 | 6.00 | |
| 28. | සෙලෝ ටේප් අගල් 2 | 130.00 100m 35.00 normal | 140.00 100m | 135.00 100m 40.00 normal | |
| 29. | ෆයිල් කටු පෙට්ටි | 25.00 | 30.00 | 30.00 | |
| 30. | ෆයිල් ලේස් (පොඩි No 2) (ලොකු No 1* | 375.00 velona 190.00plastic | 210.00 plastic 24 | 385.00 velona 200.00 plastic | |
| 31. | ෆැක්ස් රෝල (No-210x30x12'5) | 200.00 30m control | 205.00 30m control | 210.00 30m control | |
| 32. | හයලයිට් පෙන් | 55.00 frie fly | 120.00 monami | 50.00 frie fly | |
| 33. | හාෆ් ශීට් පැකට් | 425.00 nalaka | 430.00 nalaka | 430.00 nalaka | |
| 34. | ලීගල් ෆොටෝ කොපි පැකට් 01 | 800.00 75gsm | 810.00 75gsm | 810.00 75 gsm | |
| 35. | කබන් තනිපිට පැකට් 01 | 385.00 universal | 395.00 universal | 390.00 universal | |
| 36. | කාබන් දෙපිට පැකට් 01 | 400.00 universal | 410.00 universal | 410.00 universal | |
| 37. | ෆීල්ඩ් නෝට් බුක් 01 | 55.00 nalaka | 58.00 nalaka | 60.00 nalaka | |
| 38. | බයින්ඩර් ගම් 250 ග්‍රෑම් | 90.00 supper hit | 100.00 supper hit | 100.00 supper hit | |
| 39. | බයින්ඩර් ගම් 500 ග්‍රෑම් | 130.00 supper hit | 140.00 supper hit | 140.00 supper hit | |
| 40. | පැන්සල් | 18.00 atlas 15.00 ricon | 19.00 atlas | 20.00 atlas | |
| 41. | සෙලෝටේප් අගල් 1 | 65.00 100m 20.00 normal | 70.00 100m | 70.00 100m 25.00 normal | |
| 42. | බයින්ඩින් ටේපි අගල් 2 | 135.00 | 140.00 | 140.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 43. | පෑඩ් තින්ත බොතල් | 75.00 hero | 80.00 hero | 85.00 hero | |
| 44. | .ස්ටෙපිලර් කටු පැකට් නො 10 | 15.00 great wall | 17.00 great wall | 20.00 great wall | |
| 45. | ෆයිල් පාස්නර් පෙට්ටි | 120.00 | 130.00 | 130.00 | |
| 46. | පින්ස් පෙට්ටි | 27.00 | 30.00 | 28.00 | |
| 47. | අඩිරුල් (පලාස්ටික්) | 15.00 | 20.00 | 30.00 | |
| 48. | ස්ටෑම්ප් පෑඩ් ලොකු | 120.00 art line<br>130.00 lancer | 140.00 lancer | 130.00 artline | |
| 49. | රබර් බෑන්ඩ් (මධ්‍යම) | 250.00 250g | 260.00 250g | 260.00 250g | |
| 50. | ස්ටෙපිලර් මැෂින් නො 369 (කැන්ගරු) | 250.00 cangaru | 270.00 cangaru | 270.00 | |
| 51. | කතුරු (මධ්‍යම) | 140.00 rexon<br>120.00 pilot | 150.00 rexon | 150.00 rexon | |
| 52. | මකන කෑලි ලෙකෙ | 10.00 | 10.00 | 15.00 | |
| 53. | බොක්ස් ෆයිල් | 210.00 benson<br>195.00 apex | 220.00 benson | 220.00 benson | |
| 54. | කැල්කියුලේටර් (CASIO MJ – 120TG) Two way power | 1550.00 casio mj120d<br>1250.00 casio mj12sb | 1650.00 casio mj120d | 1560.00 casio mj120d<br>1270.00 casio mj12sb | |
| 55. | සාමාන්‍ය ගම් 200 මිලි | 40.00 | 45.00 | 50.00 | |
| 56. | ඩොව්න් පින්ස් පැකට් 01 | 15.00 | 20.00 | 20.00 | |
| 57. | .A3 සුදු පාට ෆොටෝ කොපි පැකට්01 (ඇවලොන්) ගේජ් 80 | 1280.00 jk 80gsm | 1290.00 jk 80gsm | 1285.00 jk 80gsm | |
| 58. | ස්ටෙප්ලර් කටු නො 10 | 15.00 great wall | 25.00 rexon | 20.00 | |
| 59. | ස්ටෙප්ලර් කටු නො 369 | 25.00 great wall | 35.00 rexon | 30.00 great wall | |
| 60. | ස්ටෙප්ලර් මැෂින් නො 10 | 110.00 kangaru | 120.00 kangaru | 115.00 kangaru | |
| 61. | ස්ටෙප්ලර් මැෂින් නො 369 | 250.00 kangaru hd 45 | 270.00 kangaru | 260.00 kangaru hd 45 | |
| 62. | පන්චර් | 330.00 kangaru dp 600 | 342.00 kangaru dp | 340.00 kangaru dp600 | |
| 63. | බ්‍රිස්ටල් බෝඩ් | 20.00 | 25.00 | 22.00 | |
| 64. | මාකින් ටේප් | 45.00<br>77.00 | 48.00 | 48.00<br>78.00 | |
| 65. | ෆයිල් කලිප් | 24.00 | 25.00 | 25.00 | |
| 66. | පුද්ගලික ලිපිගොනු කවර | 90.00 benson<br>67.50 apex | 100.00 benson | 100.00 benson | |
| 67. | රූල් සහිත ෆීල්ඩ් නෝට් බුක් | 50.00 nalaka 160p | 60.00 nalaka | 55.00 nalaka 160p | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 68. | Empty CD | 22.00 normal 40.00 sony | 45.00 sony | 45.00 sony | |
| 69. | පෝස්ට් ස්ටික් | 45.00 full sheet | 48.00 full sheet | 48.00 full sheet | |
| 70. | ෆීල්ඩ් නෝට් බුක් (ස්පයිරල්) | 80.00 | 90.00 | 90.00 | |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් මිළ ගණන් ඉදිරිපත් කල ඒ.ජේ.ජී.ස්ටේෂනරි, ගාල්ල විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බව, ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඒ.ජේ.ජී.ස්ටේෂනරි, ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීවිජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ප්‍රාදේශීය සභා හිටපු මහජන නියෝජිතයින්ගේ ඡායාරූපය සකස්කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්</u>

| විස්තරය | ලක්මාල් ස්ටුඩියෝ ගින්තොට - ගාල්ල | සන්සේයා ස්ටුඩියෝ නාගොඩ - ගාල්ල | යූ.කේ. වීඩියෝ - යටලමත්ත |
|---|---|---|---|
| ජායා රූපය ලබාගෙන සකස් කර රාමුව සහිතව සම්පූර්ණ කර ලබා දීමට එක් ජායාරූපයක් සඳහා 12X 15 ප්‍රමානය | 2500.00 | 2100.00 | 2250.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ හිටපු මහජන නියෝජිතයන්ගේ ඡායාරූපය සකස් කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් මිළ ගණන් ඉදිරිපත් කල සන්සේයා ස්ටුඩියෝ, නාගොඩ විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ හිටපු මහජන නියෝජිතයන්ගේ ඡායාරූපය සකස් කිරීම සුදුසු බව, ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව සන්සේයා ස්ටුඩියෝ, නාගොඩ වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ හිටපු මහජන නියෝජිතයන්ගේ ඡායාරූපය සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රි වසන්ත කුමාරගේ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල වල නාම කරන පුවරු සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | රන්ජන් ඇල්බට් ආර්ට්ස් ගාල්ල | රෂ් ඇඩ්ස් - ගාල්ල | බන්දුල එන්ටප්‍රයිසස් ඉමදූව |
|---|---|---|---|
| **පලාස්ටික් නාම පුවරු 9 අහල් 12 X13** | 5400.00 | 6750.00 | 6300.00 |

| | | | |
|---|---|---|---|
| **දින දක්න සෙ.මී. 14 X6** | 18600.00 | 27900.00 | 24800.00 |
| **ඩිවි දශම වර්ගීකරණ පුවරු 13** | 11000.00 | 13000.00 | 12500.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල වල නාම කරන පුවරු සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් රන්ජන් ඇල්බට් ආර්ට්ස්, ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල වල නාම කරන පුවරු මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත පුස්තකාල වල නාම කරන පුවරු එම ආයතනයෙන් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ නිළ මුද්‍රා සකස්කිරීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>**

| <u>විස්තරය</u> | <u>රජ් ඇඩ්ස් - ගාල්ල</u> | <u>රන්ජන් ඇල්බට් ආර්ට්ස් ගාල්ල</u> | <u>බන්දුල එන්ටප්‍රයිසස් ඉමදූව</u> |
|---|---|---|---|
| **<u>Flash seal</u>** | | | |
| **22x43 mm** | 1000.00 | 950.00 | 1000.00 |
| **22x55mm** | 1100.00 | 1000.00 | 1100.00 |
| **27x55mm** | 1100.00 | 1000.00 | 1100.00 |
| **22x67mm** | 1300.00 | 1200.00 | 1300.00 |
| **රවුම් සීල්** | 1300.00 | 1200.00 | 1300.00 |
| **ඕවල් සීල්** | 1300.00 | 1200.00 | 1300.00 |
| **<u>Polymer Seal</u>** | | | |
| **Date Seal** | 2200.00 | 2100.00 | 2200.00 |
| **Box Seal** | 1300.00 | 1200.00 | 1300.00 |
| **60x20mm** | 500.00 | 450.00 | 500.00 |
| **50x20mm** | 500.00 | 450.00 | 500.00 |
| **60x30mm** | 550.00 | 500.00 | 550.00 |
| **60x40mm** | 850.00 | 750.00 | 850.00 |
| **රවුම් සීල්** | 650.00 | 600.00 | 650.00 |
| **ඕවල් සීල්** | 650.00 | 600.00 | 650.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ නිල මුද්‍රා සකස් කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් රන්ජන් ඇල්බට් ආර්ට්ස්, ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ නිල මුද්‍රා සකස් කිරීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත සභාවට අවශ්‍ය නිල මුද්‍රා සකස් කිරීම රන්ජන් ඇල්බට් ආර්ට්ස්, ගාල්ල වෙතින් සිදු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා

කල අතර, ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගනකයන්ත්‍ර උපාංග හා මෘදුකාංග සදහා ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | <u>ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම</u> | <u>අරුණ කම්පියුටර් ඇන්ඩ් ඔරික්මො ටෙක්නොලජී - බෙලිගහ</u> | <u>කම්පියුටර් හවුස් - උඩුගම</u> |
|---|---|---|---|
| **Internet Security 2021** | 3400.00 | 3410.00 | 3410.00 |
| **UPS** | 4950.00 | 5150.00 | 5200.00 |
| **Key bord** | 1200.00 | 1350.00 | 1350.00 |
| **Mouse** | 1100.00 | 1200.00 | 1250.00 |
| **Wifi Adapter** | 1450.00 | 1500.00 | 1550.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගනකයන්ත්‍ර උපාංග හා මෘදුකාංග සදහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට පරිගනකයන්ත්‍ර උපාංග හා මෘදුකාංග ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත සභාවට අවශ්‍ය පරිගනකයන්ත්‍ර උපාංග හා මෘදුකාංග , ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම වෙතින් ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගනකයන්ත්‍ර මුද්‍රණ යන්ත්‍ර ටෝනර් සදහා ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | <u>මෙට්‍රොපොලිටන් - මාතර</u> | <u>අරුණ කම්පියුටර් ඇන්ඩ් ඔරික්මො ටෙක්නොලජී</u> | <u>කම්පියුටර් හවුස් - උඩුගම</u> | <u>ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම</u> | <u>ජයවර්ධන ට්‍රේඩර්ස් - ගිංතොට</u> |
|---|---|---|---|---|---|

| | | - බෙලිගහ | | | |
|---|---|---|---|---|---|
| **Canon LBP6030 HP 85 A** | Canon325 LBP6030 **15984.00** | Canon325 LBP6030 **14950.00** HP 85 A **11500.00** | Canon325 LBP6030 - **14950.00** HP 85 **A11850.00** | Canon325 LBP6030**14950.00** HP 85 **11250.00** | CW **7000.00** |
| **HP 1536dnf 78A** | | HP 78A **11950.00** | HP 78A **11950.00** | HP 78A **11500.00** | CW **8500.00** |
| **HP 10054 35A** | | HP 35A **11950.00** | HP 35A **11850.00** | HP 35A **11250.00** | CW **7000.00** |
| **Canon LBP 14dw 052** | Canon 052 **28188.00** Canon 052H **48168.00** | | | Canon LBP 14dw 052 **25500.00** | CW **9000.00** |
| | | | | | |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගනකයන්ත්‍ර මුද්‍රණ යන්ත්‍ර ටෝනර් සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් සාම්පල පරික්ෂා කොට ජයවර්ධන ට්‍රේඩර්ස් -ගිංතොට වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට පරිගනකයන්ත්‍ර මුද්‍රණ යන්ත්‍ර ටෝනර් මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත සභාවට අවශ්‍ය පරිගනකයන්ත්‍ර මුද්‍රණ යන්ත්‍ර ටෝනර් ජයවර්ධන ට්‍රේඩර්ස් -ගිංතොට වෙතින් ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රි විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාල උපාංග සදහා ලැබී ඇති මිල ගනන්**

| අනු අංකය | විස්තරය | නිල්කමල් - පිලියන්දල | දම්රෝ ඉන්ඩස්ට්‍රීස් උඩුගම | වර්ණපාල ඒජන්සීස් - ගාල්ල |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| **01** | **4 x2 ලිපිකරු මේස දකුණු පස ලාච්චුව හා ලොකරය සහිත** | **11239.00** | **14737.50** | 9550.00 |
| **02** | **උස පිටුපස සහිත අත් ඇදි දෙක සහිත ලිපිකරු පුටු** | | **10507.50** | 8950.00 |
| **03** | **පරිගණක පුටු** | 6330.00 | **7177.50** | **7700.00** |
| **04** | **පරිගණක මේස කුඩා** | 7210.00 | **6547.50** | **6450.00** |
| **05** | **පොත් රාක්කඋස අඩි 6 පලල අඩි 2.5 තට්ටු 5** | | 16177.50 | 12500.00 |
| **06** | **පොත් රාක්කඋස අඩි 6 පලල අඩි 2තට්ටු 6** | | 11227.50 | |
| **07** | **ළමා පොත් රාක්ක** | | 7897.50 | 8700.00 |
| **08** | **සඟරා රාක්ක** | | | |
| **09** | **ලිපිගොණු කබඩ් 1.5x 6 තට්ටු 4** | 18435.00 | 17797.50 | 17860.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාල උපාංග සදහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් අයිතම අංක 01,02,04,5 යන උපාංග වර්ණපාල ඒජන්සීස් - ගාල්ල වෙතින්ද, අයිතම අංක 03 නිල්කමල් - පිලියන්දල වෙතින්ද, අයිතම අංක 07,09 උපාංග දම්රෝ ඉන්ඩස්ට්‍රීස්, උඩුගම වෙතින්ද මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත ඒ ඒ අයිතමය අදාළ ආයතනවලින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සදහා පත්තර රාක්කවෙනුවෙන් ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | චන්දන ලී බඩු - යටලමත්ත | ධම්මික ලී බඩු - වලකුඹුර | බිම්සර ලී බඩු - නාගොඩ |
|---|---|---|---|
| පත්තර රාක්ක ඇල උස | **6500.00** | **7200.00** | 6800.00 |

| | | | |
|---|---|---|---|
| **අඩි 3.3,3.9 පලල අඩි 2.5 දිග අඩි 3 සාදා පොලිෂ්කර දීමට** | | | |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සඳහා පත්තර රාක්ක වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් වන්දන ලී බඩු -යටලමත්ත වෙතින්, නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සඳහා පත්තර රාක්ක මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත පුස්තකාල සඳහා පත්තර රාක්ක, වන්දන ලී බඩු -යටලමත්ත වෙතින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා බැටරි වෙනුවෙන් ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | <u>නිව් විජය මෝටර්ස් ගාල්ල</u> | <u>ගෝල් බැටරි හවුස් - ගාල්ල</u> | <u>හසිත ටයර් සර්විස් - ගාල්ල</u> |
|---|---|---|---|
| **එන්.ටී 700එච් 29 ආර් බැටරි** | **26800.00** | **27100.00** | 27100.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා බැටරි වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින්, නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා බැටරි මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත වාහන සඳහා බැටරි, නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**ආරක්ෂිත පාවහන් සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | **සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව** |
|---|---|
| **ආරක්ෂිත පාවහන්** | රු. **4200.0** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ විදුලි කටයුතු සිදු කිරීම සඳහා ආරක්ෂිත පාවහන් වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව එකම මිළ ගණන ඉදිරිපත් කල සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ විදුලි කටයුතු සිදු කිරීම සඳහා ආරක්ෂිත පාවහන් මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ විදුලි කටයුතු සිදු කිරීම සඳහා ආරක්ෂිත පාවහන් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

01. 2021.03.02 නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද පුස්තකාල උපදේශන කමිටු රැස්වීමේ වාර්තාව සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම.

02. 2021.02.24 වන දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2021 පෙබරවාරි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව 2021 මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2021 පෙබරවාරි මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය 2021 මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2021 පෙබරවාරි මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය 2021 මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු සභාපතිතුමා**

මම පළමුවෙන්ම වෙනත් කරුණු යටතේ පොඩි ප්‍රකාශයක් කරන්න ඕන. ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලගෙන් අවසරයි. වෙනත් කරුණු යටතේ මමත් මූලාසන කතාවට කලින් අදහස් කීපයක් ප්‍රකාශ කරන්න ඕන. මගේ අදහසක් තිබුනා. මට ගිය මාසෙ මේක

ඉදිරිපත් කරන්න නොහැකි වුනා. සභාව වෙනුවෙන් ගීතයක් නිර්මාණය කරන්න. ගරු මන්ත්‍රීවරුනි, මම මේක දන්න කියන අයගෙන් අහලා. මේ ප්‍රදේශයේ සිටින ගීත  නිර්මාන කරුවෙක්, දක්ෂ සංගීතඥයෙක් වන වටවල මැතිතුමත් සමග සම්බන්ධ වෙලා, සභාව වෙනුවෙන් ගීතයක් නිර්මාණය කළා. ඒක අපි මන්ත්‍රීවරු කීපදෙනෙක් එක්ක ගිහිල්ලා එයාගෙ හඬින් ශ්‍රවනය කළා. ඒක ටිකක් වැදගත් විදිහට අපට පෙනුන නිසා මම ඒක මේ අවස්ථාවෙ ඉදිරිපත් කරන්නම්. මේක අපි කියන විදිහයි, තනුවත් එක්ක එයා අදහස් කරන විදිහයි වෙනස්. ඒක නිසා මම නිකන් ඉදිරිපත් කරන්නම්. නිර්මාන අසපුව සුරංගී කලායතනය, නියාගම, තල්ගස්වල සිනමා රූපවාහිනී වෙළඳ දැන්වීම් වේදිකා නාට්‍ය සංගීත නිර්මාණ ශිල්පී ගුවන්විදුලි රූපවාහිනී සංගීත අධ්‍යක්ෂ ජගත් කුමාර වටවල විසින් තමයි මේක නිර්මාණය කළේ.

<u>නාගොඩ ප්‍රාදේශීය සභා තේමා ගීතය</u>

සුසිනිඳු දිය ඇලි - මුසු කළ හසරැලි
තේ දල්ලෙන් ගැමි සුවඳ හමා එන - ගිංගං මිටියාවතේ
පොදු ජනතා අභිලාශය අගයන - හිනිඳුම අභිමානය නිති සුරකින
නාගොඩ ප්‍රාදේශීය සභාව මේ

ගමින් ගමට පිය නගන්නේ - ඉටුකළ යුතු දෑ සොයන්නේ
තිරසර සැලසුම් තනන්නේ - නවෝදයක සිරි දකින්නේ

ඇති නැති පරතරවලින් මිදී - එක්වෙමු එක අරමුණක යෙදී
ජාතික අභිමාණයෙන් සැදී - දිනමු දිනමු මිතු දමින් බැඳී

සංගීතයත් එක්ක මේ ගීතය එයා ලස්සනට ගායනා කළා. මේ පිළිබඳව ඔබතුමන්ලගෙ අදහස් ඉදිරිපත් කරන්න. මේක ක්ෂණිකව අපට භාවිතා කරන්න බැහැ. මේක අනුමත වෙන්නත් ඕන. මේක මගේ සිතේ ඇති වුන සිතුවිල්ලක් මොකද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් තේමා ගීතයක් තියෙනවා. මම ගිය මාසෙ මේක ඉදිරිපත් කරන්න හිටියෙ ඒක අපහසු වුනා අපට ඒ පිළිබඳව ඔබතුමාලගෙ අදහස් පසුව ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගිය මස සෝලා පවර් විදුලිය ලබා ගැනීම පිළිබඳව දැනුවත් වුනා. මම ප්‍රකාශ කළා විධිමත් යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා කියලා. නමුත් අද දින ඒක ඉදිරිපත් කරන්න නොහැකි වුනා. පොඩි අතපසු වීමක් වුනා. ඒක ලබන මස සභා වාරයට ඉදිරිපත් කරන්නම්.

ඒ වගේම මම පළමුවෙන්ම සභාවෙ ප්‍රකාශ කළ පරිදි අභාවප්‍රාප්ත  ආරියතිලක මැතිතුමා, හිටපු අමාත්‍ය, නාගොඩ ප්‍රාදේශීය සභාවේ  පළමු සභාපතිතුමා හැටියට මේ සභාවට ඇවිල්ලා, මේ සභාවෙ අවුරුදු දෙකහමාරක් විතර සභාපතිත්වය දරලා, එතුමා දකුණු පළාත් සභාවට තේරී පත්වුනා. එතුමා පළාත් සභාවෙ අමාත්‍ය ධූරයක් දක්වා ගොස් වැඩ බලන මහා අමාත්‍ය ධූරයත් ලැබුවා. නමුත් එතුමා පාර්ලිමේන්තුවට යැවීමට අපට අපහසු වුනා. නමුත් මේ සභාවෙ හිටපු තුන් දෙනෙක්ම පාර්ලිමේන්තුව තරණය කරලා, අමාත්‍ය ධූර දරලා කටයුතු කළා. එම්.එස්.අමරසිරි මැතිතුමා ගම් සභාව හරහා ප්‍රාදේශීය සභාව හරහා, විජේපාල හෙට්ටි ආරච්චි මැතිතුමා, ඊලගට නියෝජ්‍ය ඇමතිකමක් දරමින් අපේ නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා කටයුතු කළා. අපි බලාපොරොත්තු නොවුන වෙලාවක තමයි යූ.ජී.ඩී. ආරිය තිලක මැතිතුමාට මේ සමාජ ජීවිතයෙන් සමුගන්න සිදු වුනේ. එතුමාගේ ආදරණීය ස්වාමි දියණිය හා පුතණුවන් එක්ක කතා කරලා, අපේ උප සභාපති, සුසන්ත මහත්තයත්, උඩලමත්ත පන්සලේ නායක හාමුදුරුවොත් ඇතුලු අපේ සියලු දෙනා එකතු වෙලා, එතුමාගේ දේහය අවසන් කටයුතු කිරීම සඳහා උඩලමත්තට රැගෙන එන්න අපට පුලුවන් කම

ලැබුනා. මොකද මේ කොරෝනා වසංගත තත්වය හමුවේ එතුමන්ලා තීරණය කරල තිබුනේ දඩල්ල ආදාහනාගාරයේ ආදාහන කටයුතු සිදු කිරීමට. නමුත් අපේ බලවත් ඉල්ලීම නිසා විශේෂයෙන්ම මේ සභාවෙ පළමු සභාපති හැටියටත්, මේ ප්‍රදේශයට විශාල සේවයක් කරපු අමාත්‍ය වරයෙක් හැටියටත්, මේ සභාවට එතුමාගේ දේහය ගෙනැල්ල එතුමාට අවසන් ගෞරව දක්වන්න අපෙත් යුතුකමක් තියෙනවා. ඒ නිසා මම සියලුම මන්ත්‍රීවරු දැනුවත් කළා. මේ දේ කළයුතුමයි කියලා. සියලුම මන්ත්‍රීවරුන්ගේ ආශිර්වාදය අපට ලැබුනා. අපි ඒකත් ඒ මැතිනියට සඳහන් කළා. ඒ අනුව පසුගියදා මේ ස්ථානයේ එතුමාගේ දේහය ගෙනවිත් අවසන් ගෞරව දැක්වුවා. පක්ෂ විපක්ෂ කිසිම බේදයක් නොමැතිව ආරිය තිලක ඇමතිතුමාට අවසන් ගෞරව දැක්වීම පිළිබඳව මම ගරු මන්ත්‍රීවරුන්ට ගෞරව කරනවා. අපේ ලේකම්තුමිය ඇතුලු නිලධාරී මඩුල්ලත්, කම්කරු මහත්වරුත් බොහොම යුහුසුලුව ඒ වැඩකටයුතු සිදු කළා. ක්ෂණිකව පැය කීපයක් තුල අපටඒ කටයුතු කරන්න හැකියාව ලැබුනා. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවෙ ශෝබයත් මේ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා. ඒ බවත් සඳහන් කරමින් ඔබතුමන්ලගෙන් තමන්ගෙ අදහස් ඉදිරිපත් කරන හැටියට ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, අපි සියලුම මන්ත්‍රීවරුන් කැඳවලා පළාත් පාලන ආයතන සංසදයෙන් අතුරු ව්‍යවස්ථා සෑදීම පිළිබඳව යම් යෝජනා වගයක් ගෙනාවා. මම මේ අවස්ථාවෙ ප්‍රකාශ කරන්නෙ ඒ පිළිබඳ ඉදිරියෙදි අපි සාකච්ඡා කරල කටයුතු කරමු කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම පසුගියදාක අපට මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් තිබුනා. ඒකෙදිත් අපට සභාවෙදි කතා කරන්න කියලා යම් යම් තීරණ ආවා. නමුත් ඒවා අපි සාකච්ඡා මට්ටමේ සිට ඉදිරියෙදි සභාවට ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, මුලින්ම වෙනත් කරුණු යටතේ අවස්ථාවක් ලබාගෙන මෙතනින් නික්ම යාමේ බලාපොරොත්තුවෙන් තමයි මම නැගී සිටියේ. වෙනත් කරුණු යටතේ මාතෘකා කීපයක් කතා කරන්න අපේ මන්ත්‍රීවරු බලාපොරොත්තු වනු ඇතැයි මම සිතනවා. ඒ ගැන කතා කරන කොට හවස හතරවත් වනු ඇතැයි මම හිතනවා. අද සභාවෙ කතා කළ යුතු මාතෘකා කීපයක් පහුගිය දවස්වල අපට යෙදුන නිසා ඒ ගැන ගොඩක් කතා කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

මුලින්ම අපි මාතෘකාවක් කර ගත යුතු වෙනවා. පළාත් පාලන සංසදය නැමති සංගමයක, අනුබද්ධ ආයතනයක, තිදෙනෙක් ඇවිල්ලා අපට සම්මන්ත්‍රණයකට සාකච්ඡාවකට හඳුන්වා දීමකට ආරාධනා කළා. ඒ ආරාධනාව අපේ කාර්යාලයේ නිලධාරීතුමියක් දුරකතනයෙන් සඳහන් කළේ. සභාපතිතුමාගේ අනු දැනුම ඇතුව වෙන්න ඇති. අපි ඒකට අනුගත වෙලා මෙතනට සම්බන්ධ වුනා. මම නම් සම්බන්ධ වුනේ, අජිත් මහත්මයත් එක්ක කතා කළහම ඇහුව එනවද කියලා මම කිව්වා ඔව් එනවයි කියලා. ඒ වෙලාවෙ අජිත් මහත්මය නම් කිව්වෙ අතුරු ව්‍යවස්ථා පිළිබඳව හැඳින්වීමක් කරල ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් කියලා. අතුරු ව්‍යවස්ථාවක් කිව්වහම, වැදගත් කමක් තියෙන නිසා මමත් ආවා. හරියටම මතක නැහැ. මීට පෙර ත්‍රී රෝද රථ පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් අපි හික්කඩුවෙන් ගෙන්න ගෙන සභා සම්මත කළා. ත්‍රී රෝද රථ ගාල් කිරීම සහ බදු අය කිරීම පිළිබඳව. ඒව දැන් තියෙනවද දන්නෙත් නැහැ. ඊට අනතුරුව අපි 97 සම්බන්ධ වෙච්ච අයෙක් වශයෙන් මම දැන් ඊට පස්සෙ මේ මෑත කාලයේවත් එදාවත් අතුරු ව්‍යවස්ථාවක් අපේ සභාවෙ සම්මත වෙලා නැහැ. මොනම විෂය පතයකටවත් අතුරු ව්‍යවස්ථා සම්මත කිරීම පිළිබඳව අපට තියෙන දැනුම අනුවනම් ගොඩක් දේවල් අපට මේ සභාවෙ සම්මත කළ යුතු වෙනවා. ඒ සඳහා වෙනම විෂයක් වශයෙන් අපි කටයුතු කළ යුතු වෙනවා.මම හිතන්නෙ ඒක තමයි සභාවෙ දියුණුව කියන්නෙ. මේ තියෙන ව්‍යවස්ථා රාමුව තුල අපේ නීති රීති අන පනත් අනුව සභාවක් කරගෙන යාමේදී මම හිතන්නෙ ඔය සම්ප්‍රදායානුකූලව තියෙන රටේ හැමටම පොදු කරුණු කාරනා ප්‍රදේශයක්

දියුනු කරන්න මදි. අපට අදාල ප්‍රදේශවල අදාල යම් යම් විෂයන් පිළිබඳව අපේ ආදායම නගා සිටුවන්න, ප්‍රදේශයේ ජනතාවගේ දියුනුව සඳහා අපට ගොඩක් දේවල් කරන්න පුලුවන්. කරන්න ඉඩ පහසුකම් සහ සියලු දේවල් අපට තියෙනවා. නමුත් අපි එතනට එන්නෙ නැහැ. අපි සභා රැස්වීමට එනවා. ඊට පස්සෙ යනවා. ඊට පස්සෙ කොහෙන් හරි යම් ආධාර මුදලක් ආවොත් ඒකෙන් ගමේ ප්‍රදේශයේ කොට්ඨාසෙ වැඩක් පළක් කර ගන්නවා. ජනතාව වෙනුවෙන් සේවය කරනවා. මළ ගෙවල්වල මගුල් ගෙවල්වල යනවා. වෙනත් සමාජීය අවශ්‍යතාවයන් වලට පෙනී සිටිනවා. නමුත් නිර්මානශීලීව ඒ කටයුත්තට අපි කවුරුවත් යොමු වුනේ නැහැ. අපට ඒකට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සියලු දේවල් අපට ලබා දීල තියෙනවා. ඒවා නැහැයි කියන්න බැහැ. නමුත් තවම අපි ගියේ නැහැ. ඒවට යන්න ඕන ඇත්තටම නොගිහින් නම් බැහැ. නැත්නම් අපි ලිදේ ඉන්න මැඩියො වගේ තමයි ගරු මන්ත්‍රීවරුනි අපට ඉන්න වෙන්නෙ. එහෙම නොගියොත් ප්‍රදේශයේ දියුණුවක් අපට හිතන්න බැහැ. අපට තියෙන ආදායම සහ වියදම පිළිබඳ ගැටලුවෙදි ඒක වර්ථමානයට ගැලපේද යන්න පිළිබඳව අපිට ආදායම පිළිබඳ ලොකු ගැටලුවක් තියෙනවා. දැන් මධ්‍යම රජයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඇතුලු වෙනත් ආයතනවලින් අපට ලැබෙන මුදල් වලින්, ඒ වගේම අපි ප්‍රාදේශීය සභාවක් වශයෙන් අය කර ගන්නා බදු මුදල් සහ අනෙකුත් ආදායම් වලින් අපට මේක නඩත්තු කරන්න පුලුවන්ද බැරිද යන්න ප්‍රශ්නය පිළිබඳව ගැටලුවක් තියෙනවා. ඇත්තටම බැරි තත්වයක් තියෙන්නෙ. යම් යම් ආයතන වලින් යම් යම් අවස්ථාවලදි ලැබෙන ආධාර මුදල් හා අනෙකුත් දේවල් වලින් යම් කාර්යයක් කළාට ඒකෙන් සෑහීමකට පත් වෙන්න බැහැ. මම මුලින්ම කතා කළා. අපට ගොඩක් දේවල් ලැබුන නමුත් අපි කරපු දෙයක් නම් තවම නැත කියලා. ඒක මේ සභාපතිතුමාට ඇඟිල්ල දික් කරලා කරන කතාවක් නෙවෙයි. ඒක අපි පිළිගන්න ඕන. අපේ මේ 27 දෙනාම පිළිගන්න ඕන කාරණයක් නායකයා වශයෙන් සභාපති වරයා හෝ ලේකම් වරයාට ඇඟිල්ල දික් කරලා හරියන්නෙ නැහැ. අපි මීට වඩා වෙහෙස මහන්සි වෙන්න ඕන. පුද්ගලිකව මගෙන් කෙරෙන්නෙත් නැහැ. ඔබතුමාලගෙන් කෙරෙන බවක් පේන්නෙත් නැහැ. ඒක ඔබතුමාලට දෝෂාරෝපනය කිරීමක් නෙවෙයි. මමත් ඒකෙ කොටස් කාරුවෙක් වශයෙන් භාර ගන්න කැමතියි.

එදා ඒ ආපු නිලධාරි දෙන්නත් එක්ක කතා බහ කළාම, මගේ හැඟීමනම්, මට වැටහෙන විදිහනම්, මේක ඇත්තටම අපට ගැලපෙන දෙයක්, අවශ්‍ය දෙයක් නෙවෙයි. ඒ කියන සහජීවනය පිළිබඳ පනත්, කෙටුම් පතක් ගෙනැල්ල ඒක සභාවෙ සම්මත කරලා ඉල්ලනවා. නමුත් අපේ තවම සූදානමක් නැහැ. එහෙම සම්මත කරනවනම් අද න්‍යාය පත්‍රයට ඇතුලත් වෙලා තියෙන්න ඕන. සභාපතිතුමාගෙත් ලේකම් තුමියගෙත් කාගෙවත් එහෙම අවශ්‍යතාවයක් තිබිල නැහැ. ඕනනම් අද මේ යෝජනා කීපයක් මෙතනට ගෙනාවා. යම් යම් සංවර්ධන කාර්යයන් සම්මත කළා. ඒ අතරට ඕකත් යොමු වෙලා තියෙන්න ඕන. න්‍යාය පත්‍රයට අපට යන්න කාල වේලාව නැති වුනත් කලබලයක් තිබුනනම් හදිසියක් තිබුනනම් ඒකට ඇතුලත් වෙලා තියෙන්න ඕන. නමුත් එහෙම දෙයක් වුනේ නැහැ. ඒකත් හොඳයි නොවුන එකත් හොඳයි. අපි තව දුරටත් මේ පිළිබඳ කතා බහ කරන්න ඕන. රටේ එක්තරා ප්‍රදේශයක අතුරු ව්‍යවස්ථාවක් ගෙනැල්ලා ඒක මෙහාට නම්, ගම් ගලපලා, ඒක එයා හදල කියනවා. කිව්වහම අපි ඒ ආකාරයෙන්ම පිළිගන්න සූදානමක් නැහැ. සූදානම් වෙන්න ඕනත් නැහැ. මොකටද අපි එහෙම වෙන්නෙ. ඇයි හිටිය ගමන් තැනින් තැනින් මේවා මතු වීම පිළිබඳව සැකයක් අපට තියෙනවා. දැන් අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවත් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවත් විතරයි මෙහෙන් තෝරගෙන තියෙන්නෙ. එයාල ලාහුගල කිලිනොච්චිය ගැන කියනවා. සහජීවනය පිළිබඳව ප්‍රාදේශීය සභාව හරහා අතුරු ව්‍යවස්ථාවක් ගේන්න ඕන කියලා, රටේ පොදු මතයක් තියෙනවනම්, මම කියන්නෙ මුලු රටටම ගලපන්න, ඒක පාර්ලිමේන්තුවෙන් ගේන්න තිබුනා. මොකද මේක තැනින් තැන මතු වෙන්නෙ කියලා අපට ගැටලුවක් තියෙනවා. සමහරක් වෙලාවට ඒකෙදි මමනම් දකින්නෙ ඇත්තටම ඉදිරියේ අපට විශාල ප්‍රශ්න හා ගැටලුවලට මුහුන දෙන්න පුලුවන්. ගැටලුවක් වශයෙන් අපි දකිනවා. ඒකෙදි යම් ප්‍රදේශයක යම් ජනතාවකට යම් ජන කොට්ඨාසයකට ගලප ගන්න පුලුවන් වේවි. සමහර විට අර එල්.ටී.ටී එක බලාපොරොත්තු වුනේ

උතුරු නැගෙනහිරත් එක්ක ඊලාම් රාජ්‍යයක්. ඒක සීමාවල් එයාල නිර්ණය කරගෙන ඒක බලාපොරොත්තුවෙන් තමයි එයාල සටන් කළේ. ඒක එහාට ගැලපුනාට, අපට මොකටද? මෙහාට ඒකීය රටක් එක්සත් රටක් කියන එක පිළිබඳ කිසි ගැටලුවක් නැහැ. ජාති බේද ආගම් බේද අපට ගැටලුවක් නැහැ. අපි ඒ කියන මහත්වරු දෙන්නා පහත් කොට සලකනව නෙවෙයි. ඒ කියන මහත්වරු දෙන්නාට අගෞරව කරනවත් නෙවෙයි. මම කියන්නෙ අපි ප්‍රදේශයක් වශයෙන් ඒකෙ තියෙන කරුණු කාරණා ටිකක් ටිකක් මම එවෙලෙ කිව්වා. ඊට පස්සෙ මම කිව්වෙ නැහැ. මම සාක්කුවෙ දාගෙන ආවා කවුරුවත් කතා කළොත් බලන්න කියලා. ඒකෙ එකෙන් එක කරුණු කාරණා බැලුවහම අපේ නිශාන්ත මන්ත්‍රීතුමාල අජිත් මන්ත්‍රීතුමාල සහබන්දු මහත්තයල සභාපතිතුමාල කට්ටිය එක්තරා පැත්තකට මේක යොමු වුනා. නෙළුව තවලම වගේ ප්‍රදේශවලට තෝරා ගත් ප්‍රදේශ වශයෙන් පහුගිය දවස්වල රතු කුරුසෙන් වැසිකිලි කැසිකිලි ආධාර දුන්නා. අපට දුන්නෙ නැහැ. ඊට පස්සෙ රාජ්‍ය නොවන සංවිධාන ඇවිල්ලා විවිධ ප්‍රදේශවල විවිධ කාර්යයන්, ජනතාවගේ සුබ සිද්ධිය තකා කියලා, කරන්න පටන් ගත්තා. ඒවා ඒ ප්‍රදේශවල එහෙම කෙරුනා. අපට එහෙම කෙරුනෙ නැහැ. ඒ අර්ථයෙන් අපි බැලුවා. මේක එහෙම දෙයක්ද කියන එක. එහෙම දෙයක් මේ මාතෘකාවට කොහෙවත් ගැවිලා නැහැ. ඔබතුමාලත් කතා කළා. ඔබතුමාලටත් තේරෙනව ඇති. අපට ඒක එතනදි වැදගත් කමක් තිබුනෙ නැහැ. එහෙම විෂය පතයකටවත් මේකෙ එයාල හදපු අතුරු කමිටු වාර්තාවෙ එහෙම එකක් නැහැ. සහජීවන කියන එකත් මේක නිර්වචනය කරල නැහැ. සහජීවනය කියන වචනය පිළිබඳව අපි කෙටියෙන් කිව්වොත්, සියලු දෙනා එක සමානව ජාති බේද ආගම් බේද නැතුව එකට ජීවත් වීමේ අර්ථය තමයි මේ සහජීවන කියන වචනයේ අර්ථය කියලා මම හිතන්නෙ. එහෙම වෙන්න ඕන කියලා. නමුත් ඔබතුමන්ල අපි කවුරුත්, අපිට මේක අදාල නැත්නම් අපි කතා කළ යුතුත් නැහැ. අපි මේ සභාවෙ කතා බහ කරමු. කතා බහ කරලා, අපි ඒකට මම හිතන්නෙ අනුගත වෙන්න ඕන නැහැ කියන ප්‍රශ්නෙ තියෙනවා. මොකද ඒක සමහර විට ලාහුගලට ගැලපේවි. අපි ඒ වෙලාවෙ ඇහුවමත් ලාහුගල ද්‍රවිඩ ජනතාව සහ මුස්ලිම් ජනතාව තමයි 80% ක් 90% ක් වගේ ඉන්නෙ. සිංහල ජනතාව පොඩ්ඩක් තමයි ඉන්නෙ. මේ තෝරා ගත් සභා දෙක දිහා බැලුවමත් ප්‍රශ්නයක් තියෙනවා. ඒ දෙකේම සුලු ජාතීන්වල යම් ප්‍රතිශතයක් තියෙනවා. ඇල්පිටිය නාගොඩ බැලුවම එහෙම තත්වයක් අපට පේනවා. එතකොට නැති ප්‍රශ්න ගම්වල, කොට්ඨාසවල, කමිටු හදාගෙන ආගමික නායකයොයි, උගතුන් බුද්ධිමතුන් කියලා, දේශපාලන අධිකාරියේ යම් යම් නායකයොත් එක්ක කමිටුවක් හදාගෙන ඒවයි යම් යම් ගැටලු ඇති වුනාම උදාහරණයක් වශයෙන් ජාතිවාදී කෝලාහලයක් ඇති වෙනවා. ඒවා නොවෙනවයි කියන්න බැහැ. මෑතකදී නොවුනට අපි දන්නවා අතීතයේ ඉදන්ම ජාතිවාදී කෝලාහල මේ පහුගිය දවස්වල ගිංතොටත් පටන් ගත්තා. දැන් වැඩි කාලයක් වුනේ නැහැ. ඔය මුස්ලිම් ප්‍රදේශවල හුගක් තැන්වල පටන් ගත්තා. ජාතිවාදී කෝලාහලයක් ඇති වුනාම ඔය කට්ටිය සහජීවන කමිටු යවලා, යම් යම් තීන්දු තීරණ අරගෙන, ඒවා මැඩ පවත්වන්න එහෙම නිර්වචනෙකුත් හරියට කියන්නෙ නැහැ මේකෙ. අදහස් දැක්වීම අතින් හරි ගැටලුකාරී තත්වයක්. අපි කතා බහ කරමු මාතෘකාවක් කර ගමු මම හිතන්නෙ අපි ඒක ගොඩාක් කල්පනා කරලා, මේවට මම හිතන්නෙ වෙන සභාවේ භෞතික සම්පත් හා සභාව ඇතුලත ජීවත්වන ජනතාවගේ සුබ සිද්ධිය සඳහා විශේෂයෙන් අපි බලන්නෙ සංවර්ධන කාර්යයන්. සංවර්ධන කාර්යයන් වල මේකෙ දැක්මක් නැහැ. ඒ නිසා ඒ පිළිබඳ මේ සභාවෙ සාකච්ඡා වෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් මම මේ මාතෘකාව මුලින්ම සභාව හමුවේ තැබුවෙ ඔබතුමන්ලගෙත් අදහස් දක්වන්න. මමනම් මගේ පුද්ගලික මතය විශේෂයෙන්ම මේකට මගේ කිසිම අනුගත වීමක් හෝ මේක පිළිබඳව කතා කරන්නත් බැහැ සමහරක් අපේ බෞද්ධ නායකයොත් බේද හින්න වෙලා. එක එක පාර්ශව වශයෙන් විහාරස්ථාන වශයෙන් ඕවට ගිහිල්ලා, කතා කරන්නත් බැහැ. මේක සහජීවනය කියල කිව්ව හැටිය කියාවි. මේක මෙහෙමයි. අරක මෙහෙමයි කියලා. ඇත්තටම අපෙන් කිසිම අකටයුත්තක් සුලු ජාතීන්ට වෙලා නැහැ. අපි සමාජයේ ජීවත් වෙන ආකාරයෙන් එයාලත් ජීවත් වෙන්නෙ. අපෙන් අඩුවක්වත්, වැඩියක්වත් වෙලා නැහැ.

අපි බෞද්ධ සිංහලයන් වශයෙන් අපටත් ඒ ප්‍රශ්නෙ තියෙනවා. එයාලටත් ඒ ප්‍රශ්නෙ තියෙනවා. අපෙන් කිසිදු මේ ප්‍රදේශවල එහෙම වෙනත් ජාතීන්ට හෝ වෙනත් ආගම්වලට අඩුවක් පාඩුවක් වෙලා නැති බව අපි දන්නවා. ඒ නිසා අපි ඒ පිළිබඳව සිහිපත් කරමින්, විශේෂයෙන් පසුගිය දවසේ අපේ අමාත්‍ය, ආරියතිලක ඇමතිතුමාට ගරු කිරීමක් වශයෙන් මේ සභාවට ඒ මෘත දේහය ගෙනැල්ලා, කරපු සහයෝගයට ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා ඒ වගේම හිටපු මන්ත්‍රීතුමන්ලා, සභාපතිතුමන්ලා ඒ වගේම ආපු සම්භාවණීය අමුත්තන් සියලු දෙනාට ඒ වගේම ලේකම්තුමිය ඇතුලු සියලු දෙනාට ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. විශේෂයෙන්ම මම හිතන්නෙ දැන් පොදු අරමුදලේ මුදල් පිළිබඳව පොඩ්ඩක් කතා බහ කරනවනම්, යමක් කළ යුතුයි කියල මම මාතෘකාව තියනවා. ඒක පැහැර හරින්නෙ නැතුව කොට්ඨාස 15 යම් සංවර්ධන කාර්යයන් සඳහා යොමු වෙන්න වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා සභාවෙ මතක් කරනවා. සුබ දවසක් ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් එඩේර ආරච්චි මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මන්ඩලයෙන් අවසරයි. දීර්ඝ කාලයකට පස්සෙ කතා කරන්නත් හිතුනා. මොකද නැත්නම් මේකත් අමතක වෙනව අපිට. ඒක නිසා සභාපතිතුමා පොඩ්ඩක් වැඩ ටික අයින් කරල අපි කියන දේත් පොඩ්ඩක් අහගෙන ඉන්න. අපි හිතනවා අහගෙන ඉන්නවයි කියලා. පහුගිය දවස්වල අපේ යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා අපේ ප්‍රාදේශීය සභාවෙ පළමු සභාපතිවරයා විදිහට එතුමා අභාවප්‍රාප්ත වුනාම, මේ සභාවට ගෙනැල්ලා, අවසන් ගෞරව දැක්වුවා. ඉතිං මම එතනින් පටන් ගන්න කියල හිතුවෙ. යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා මේ සභාවෙ පළවෙනි සභාපතිවරයා විදිහට පත්වෙන අවස්ථාවෙත්, එතුමා අභවප්‍රාප්ත වෙලා මෙම ස්ථානයට එතුමාගේ දේහය රැගෙන එන විටත්, මේ සභාව අවුරුදු 30 ක කාල පරිච්ඡේදයක් තුල මම හිතනවා. එදත් අදත් ලොකු සංවර්ධනයක්, ලොකු දියුණුවක්, සිදු වෙලා නැහැ. සභාපතිවරු හතර පස් පොලක් හිටියත්, මම දකින විදිහට ලොකු සංවර්ධනයක් ලොකු දියුණුවක් වෙලා නැතෙයි කියලා, අනිත් සභා දිහා බැලුවයින් පස්සෙ අපි දකිනවා ඒ සභා මොනතරම් දියුනු භාවයට පත්වෙලාද කියලා. නෙළුව කියන්නෙ අපටත් වඩා බොහොම දුප්පත් ප්‍රාදේශීය සභාවක්. ඉතා අලංකාරවත් විදිහට සෑම දෙයක්ම කළමනාකරණය කර ගනිමින්, ඒ හිටපු සභාපතිවරු, ඒ වැඩකරපු නිලධාරීන් සියලු දෙනා එකතුවෙලා යම්කිසි මට්ටමකට ඒ සභාවල් යම් තැනකට ගේන්න වැඩකටයුතු කරල තියෙනවා. ඒක නිසා මම හිතනවා. ගරු සභාපතිතුමනි, මේ අපේ කාලෙදිවත්, තවත් අවුරුදු එකක් හෝ දෙකක් තියේවි. ඒ කාලය තුලදිවත් මේ අවුරුදු 30 කට සිදු නොවුනු මේ ප්‍රාදේශීය සභාවේ දැක්ම සහ මෙහෙවර තුල හිඳිමින් වැඩදායී දෙයක් ඵලදායීතාවයෙන් යුක්තව වැඩ කොටසක් කරන්න ඔබතුමාට ශක්තිය තියෙනවා කියලා මම හිතනවා. ඔබතුමා මම දන්නවා මේ 27 දෙනා එක්කම බොහොම සමීපව කටයුතු කරන සභාපතිවරයෙක්. අයවැය සම්බන්ධයෙන් වුනත් අපි ඡන්දය නොදුන්නත්, ඔබතුමාට අයවැය සම්මත කර ගන්න පුලුවන් හැකියාවක් තියෙනවා. ඒක නිසා මේ 27 දෙනත් එක්ක බොහොම සමීපව කටයුතු කරන්නෙ. මේ සභාවට ආපු මුල්ම දවසෙ ඉඳලම මම මේ සභාවෙ ආදායම් උත්පාදනය පිළිබඳව කරුණු කාරනා රැසක් අරගෙන ආවා. අද අවුරුදු තුනක් ගිහිල්ලත් අපට බැරිවුනා මේ සභාවට අඩුම ගානෙ රුපියලක්වත් එකතු කරන්න. අපි කණගාටුවට පත් වෙන්න ඕන. අපි 27 දෙනෙක් නඩත්තු කරන සභාවක්. අපි යම් කිසි යුතුකමක් හා මෙහෙවරක් අපේ අතින් මේ සභාව හරහා අපේ සමාජයට විය යුතුයි කියන මට්ටමේ මම ඉන්නවා. ඒක නිසා සභාපතිතුමා, දැන් උප සභාපතිතුමත් කතා කරලා කිව්වා. සභාවේ ආදායම් උත්පාදනය අපේ දුර්වල මට්ටමක තියෙන්නෙ. දැන් අපි දන්නවා උඩුගම අපේ පොහොර නිෂ්පාදනය පිළිබඳව. මිනිස්සුන්ගෙ ආකල්පමය අතින් මිනිස්සු මේ සභාවෙ පොහොර මිලදී ගන්න පෙළඹෙන්නෙ නැහැ. ඒකට හේතුව වෙන්නෙ ඒ පොහොර ගුණාත්මක භාවයෙන් තොරයි කියලා මිනිස්සුන්ගෙ ආකල්පයක් තියෙනවා. ඒක නිසා අපි කටයුතු කරන්න ඕන නිරන්තරයෙන්ම අපේ නිෂ්පාදන ගුණාත්මක භාවයෙන් ඉහල,

ප්‍රමිතියෙන් යුතු පොහොර බවට පත් කරන්න. මම මුල ඉඳලම කිව්වා මේ පොහොර ටික ප්‍රමිතිගත කරන්න කියලා. ඒවයින් තමයි අපට යම්කිසි ආධායමක් උත්පාදනය කර ගන්න පුලුවන් වෙන්නෙ. මම ඔබතුමාට කිව්වා. මේ නාගොඩ ප්රාදේශීය සභාවේ උඩුගම කියන්නෙ ආර්ථිකමය වශයෙන් කේන්ද්‍රස්ථානයක්. ඒ කේන්ද්‍රස්ථානයේ ප්‍රාදේශීය සභාව සතු ඉඩකඩම් විශාල ප්‍රමාණයක් තියෙනවා. කඩකාමර ටිකක් ගැහුවත්, සභාපතිතුමා, මම හිතනවා සභාවට මාසයකට ලක්‍ෂ හතර හමාරක් පහක්, මාසික ආදායමක් වශයෙන් ගන්න පුලුවන් කියලා. මුල් අවස්ථාවෙදිත් මේ සභාවෙදි මම ඒවා යෝජනා හැටියට ඉදිරිපත් කළා. සභාවේ මේ ආර්ථිකය මූල්‍යමය ශක්තිය වැඩිකර ගන්න කටයුතු කරන්න මගේ අදහස් හා යෝජනා හැටියට. ඒක නිසා සභාපතිතුමා, අපි ඔබතුමත් එක්ක ඉන්නවා. ඒක නිසා ඒ ආදායම් උත්පාදනය පිළිබඳව මේ සියලු දෙනත් එක්ක එකතු වෙලා, සාකච්ඡා මණ්ඩපයක් කර ගන්න කියලා මම යෝජනා කරනවා. කවද හරි අපි මෙතනට නොආවත් යම් කිසි දවසක කවුරු හරි ඇවිල්ලා ඔය පුටුවෙත් ඉඳගෙන හරි මෙතන හරි ඉඳගෙන කියාවි මේ හිටපු 27 දෙනා මොකක් හරි කරල ගියයි කියලා. ඒ නිසා ඒ ගෞරවය තියන්න අපි ඔක්කොම එකුවෙලා කටයුතු කරමුයි කියන යෝජනාව මම මේ අවස්ථාවෙදි කරනවා.

ඒ වගේම සභාපතිතුමා, මම දීර්ඝ කාලයක් තිස්සේ ඔබතුමත් එක්ක සමහර විට රංඩු වෙනවා. මම මේ කතාව නොකියපු තැනක් නැහැ. මම සතුටු වෙනවා හේමචන්ද්‍ර විලේගේ හිටපු සභාපතිතුමා උඩුගමට දායාද කළ උඩුගම නව පොළ සංකීර්ණයේ ඉතුරු වැඩ කොටස කරන්න මම ගොඩක් මහන්සි ගත්ත කෙනෙක්. ඒක මේ සභාවෙ හැමෝම දන්නවා. අපේ මන්ත්‍රීවරුත් ඒ වගේ සහයෝගය ලබා දුන්නා. මම හිතනවා ඒකෙ ප්‍රතිඵලයක් හැටියට, අපි කතා කරපු එකේ, අපි අදහස් දක්වපු එකේ, ප්‍රතිඵලයක් හැටියට ඔබතුමා දැන් වැඩ කරන්න උත්සහ ගනිමින් පවතිනවා. ඉතාම සතුටු දායකයි මම හදවතින්ම ඔබතුමාට සුබ පතනවා. ඒ නිසා ඒ ඉතිරි වැඩ කොටසත් නියම විදිහට ප්‍රමිති ගතව කරලා ඒක සමාජ ගත කරන්න. හැමදාමත් දැන් අපි කියනවා. හිටපු සභාපති අසවල් දේ කළා කියලා. මම හිතනවා ඒකෙ ගෞරවයත් නිමල් වික්ටර් නාගොඩ විතාන මැතිතුමා උඩුගමට පොළක් හැදුවයි කියලා කියාවි. ඒකත් ඔබතුමාට ගෞරවයක්. සභාපතිතුමා, ඒක නිසා වැඩ කරන කොට අපි කවදාවත් කකුලෙන් අදින්නෙ නැහැ. අපිටත් ඕන වැඩ කරන්න. අපි ඔබතුමත් එක්ක සහයෝගෙන් වැඩ කරන්න කැමතියි. ඕනම විදිහට වැඩ කරන්න කැමතියි. අපි දැන් දීර්ඝ කාලයක් තිස්සේ ගිය අවුරුද්දෙ මට හිතෙන්නෙ මැයි මාසෙ නැත්නම් ජුනි මාසෙ තමයි උඩුගම පුර නැගුම සංකීර්ණයට කර්ටන් රෙද්දක් යෝජනා කරල තිබුනෙ. මම පහුගිය දවස්වල ලේකම් මිස්ගෙන් ඇහුවම කිව්වා දන්නෙ නැතෙයි කියලා. ඒක නිසා සභාපතිතුමා මේ සභාවෙ යෝජනා වෙන යෝජනා අනුමත වෙනවා. ඒවා එකින් එක පෙළගස්වමින් ඒව කෙරුනද නැද්ද කියන එක අධීක්‍ෂණය කරන්න ඔබතුමා කටයුතු කරන්න ඕන. මොකද හේතුව අදටත් ඒ කර්ටන් රෙද්ද නැහැ. ඒ වගේම අපි කොඩි කනු තුනක් හිටවන්න යෝජනා කළා. ඒ කොඩි කනු තුන හිටවන්න තාමත් කනුවක්වත් නැහැ. අනිත් එක දැන් පුර නැගුම ගොඩනැගිල්ල මේ වෙද්දි අභාවයට යමින් පවතිනවා. තනිකරම පරවියො අර උඩ කැල්ලෙ වහලා ජරා කරලා පිහාටු හැම තැනම. මම ඊයෙ පෙරේද බංකු වගයක් ගන්න ගියා. මුලු හෝල් එක ඇතුලෙම පිහාටු. එලියෙ ඔක්කොම ජරා කරලා අර උඩ තියෙන යකඩ ඔක්කොම කඩාගෙන වැටිලා. සමහර වෙලාවට එතනින් යන එන පොඩි එකෙක්ගෙ ඔලුවට වැටෙන්නත් පුලුවන්. එතකොට අපි මේ මහජන පීඩාවක්නෙ කරන්නෙ. මේ අපේ පනත අපි විසින්ම උල්ලංඝනය කිරීමක් තමයි කරන්නෙ සභාපතිතුමා. ඒක නිසා ඒ වටිනා ගොඩනැගිල්ල අප සතු සම්පතක්. එය රැක ගන්න. මම හිතනවා සභාපතිතුමා ඒකෙ ලොකුම වගකීම තියෙන්නෙ ඔබතුමා අතේ. අපි යෝජනා කරනවා අපි මේ දකින දේවල් කියනවා. ඒවට අදාලව වැඩ කරන්න. වියදම් කරලා, ඒ වැඩ කරන්න ඔබතුමා අලුතෙන් හිතන්න ඕන නැහැ. අලුත් යෝජනා අවශ්‍ය වෙන්නෙ නැහැ. ඒක නිසා සභාපතිතුමා ඒ වැරැද්ද නිවැරදි කරන්න. මොකද ඒව අභාවයට ගියොත් අපරාදෙ. අනිත් එක තමයි සභාපතිතුමා, මම ඇතුලෙ කාමරේට ගිහින් බැලුව බලන කොට අපට තිබුන පුටුවක් කඩලා, කොල රොඩු වලින් වහල ගිහිල්ලා. දැන් එතකොට මේවයි අලාබෙ ගන්නෙ කවුද? මම ඇහුව

කොහොමද මේක කැඩුනෙ කියලා. පහුගිය දවස්වල ට්‍රේනින් එකක් තිබුනලු. ප්‍රාදේශීය ලේකම් එකේ ඒ පුද්ගලයන් ඇවිල්ලා පුටුව කඩල වහල ගියයි කිව්වලු. එතකොට මේ වගකීම දරන්නෙ කවුද? පුටුවක් වුනත් කැඩුවත් ඒකට වග කියන්න ඕන අපිනෙ සභාපතිතුමා. ඒක නිසා වග කියන්න නිලධාරියෙක් නැහැ. පුස්තකාල කමිටුවෙන් බහුකාර්ය සංකීර්ණයට කවුරු හරි යොදවන්න යෝජනාවක් කරල තිබුනා. මම හිතනවා සභාපතිතුමා අපට දැන් මේ සේවකයො අඩුපාඩුවක් තියෙනවා. අපේ පාරක් තොටක් කපා ගන්නවත් අපට මාර්ග කම්කරුවන් නැහැ. මේ දෙන්නෙක් ඉන්න සභාවක තව එක්කෙනෙක් ඔතනට යතුර පරිස්සම් කරන්න දාන එකේ තේරුමක් නැහැ. මම හිතනවා සභාපතිතුමා අපි මේ කවුරු හරි ගන්නකම් එතන වගකීම පුස්තකාලාධිපතිට දෙන්න. එතන දෙන්නෙක් ඉන්නවා. ඒක නිසා මේ යම් කිසි ක්‍රමයක් හැදෙනකම් ඒක ඒ අවස්ථාව දෙන්න. යතුර අරගෙන දොර අරින එක මහ ලොකු වැඩක් නෙවෙයි. ඒක නිසා සභාපතිතුමා ඒව නිවැරදි කරන්න. අනිත් එක තමයි අපේ පුස්තකාලය බැලුවොත් එහෙම ඉස්සරහ ඉදිරිපස ඒ ඉදිරිපස සම්පූර්ණයෙන්ම අර ගේට්ටුවක් නැහැ. වැටක් නැහැ. සම්පූර්ණයෙන්ම නිරාවරණය වෙලා තියෙන්නෙ. පහුගිය කාලෙ මම ගිහින් බැලුව උපනාම මහත්තය හිටියා. නමුත් හතර වටේම කැලේ වැවිලා. ඒව කරව ගන්න ඒ පුස්තකාලාධිපතිට වගකීමක් දෙන්න. යම්කිසි බලයක් ඔබතුමා දෙන්න. මෙන්න මේ දේවල් ඔයා බලල හොයල කරන්න කියලා. නමුත් පුස්තකාලාධිපතිට අයිති දෙයක් නෙවෙයි. නමුත් රැකියාවට අමතරව රැකියාවේ තනතුරට අදාලව රාජකාරියට එහා ගියපු දෙයක් ඕනම කෙනෙක් කරනවා. ඒක නිසා අපි මේව රැක ගන්න ඕනනම් අපට වගකීම් වලට එහා ගියපු යුතුකමක් කරන්න සිදු වෙන්න පුලුවන්. ඒක නිසා මේ රටේ පුරවැසියන් හැටියට ප්‍රාදේශීය සභාවේ සම්පත් වලට ආදරය කරන සේවක සේවිකාවන් හැටියට යුතුකමක් හා වගකීමක් තියෙනවා. ප්‍රාදේශීය සභාව සතු දේපොල සහ සියලු දේවල් රැක බලාගෙන ඒ දේවල් හරියට වෙනවද කියල බලන්න අධීක්ෂණය කරන්න තමන් ගන්න පඩියට සාධාරණයක් කරන්න පුලුවන්ද කියලා. ඒක නිසා සභාපතිතුමා මම හිතන්නෙ අපට මේ ලක්ෂ දෙකක් ඔබතුමා කොට්ඨාසයකට ලබා දීල තියෙනවා. අපි ඒ ගැන අපි යෝජනා දාල ඒව අද අනුමත වෙලා තියෙනවා. අපට ඉතාම ඉක්මනින් එම කටයුත්ත කරල දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමා දැන් හැම තැනම කොන්ක්‍රීට් දාල කාපට් පාරවල් ඇති කරලා මාර්ග සංවර්ධනය කරමින් පවතිනවා. එහෙම වෙන කොට අපි මන්ත්‍රීවරු විදිහට අපේ කොට්ඨාසවලට දාල තියෙන්නෙ ලයිට් තුනක් විතරයි. ඒක නිසා මේ සමහර තැන් තියෙනවා ගැහැණු ළමයෙකුට රෑ 8.00 පංති ඇරිලා ඒ ඉතුරු ටික යන්න විදිහක් නැහැ. මම උදාහරණයක් ගත්තොත් සභාපතිතුමා අපේ ගෙදර ලග ඉදල දාවුල්හේන මාර්ගයේ තියෙනවා මීටර් 200 ක් විතර දුරක් ළමයි පංති ඇරිලා හවසට වැඩ ඇරිලා ගැහැනු උදවිය යනවා එතන ග්‍රීස් යක්කු පහුගිය කාලෙ ඉදලා ග්‍රීස් යක්කු හිටියා. ඒක නිසා ඒ මාර්ගයේ ඒ අනාරක්ෂිත මාර්ග මම හිතනවා මගේ කොට්ඨාසෙ විතරක් නෙවෙයි. ඒ හැම කොට්ඨාසෙම ඒ වගේ තැන් ඇති. ඒව හොයා බලලා, අධීක්ෂණය කරලා, ඒ අවශ්‍ය ස්ථානවලට විදුලි පහන් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඩ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ පුංචි අදහස් කීපයක් ඉදිරිපත් කිරීමට මම අදහස් කළා. පළමුවෙන්ම අපේ උප සභාපතිතුමා සඳහන් කළ මාතෘකාවට ගියහම ඒ අතුරු ව්‍යවස්ථාව පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමාටත් අපි ස්තූතිවන්ත වෙනවා. නමුත් ඒවා එතුමා කියපු විදිහට ක්ෂණික කටයුතු හැටියට කරනවට වඩා, වඩාත් හොඳ සාකච්ඡාවක් අපි අතරෙ ක්‍රියාත්මක වෙන්න ඕන. ඒ පිළිබඳව එහෙම සඳහන් කරන්න හේතුව, එතුමා කියපු විදිහට ඒ නිලධාරීන් පිළිබඳ ගැටලුවක් නැහැ. හැබැයි දැන් එතුමන්ලා සඳහන් කරපු විදිහට එතුමන්ලා සඳහන් කරන්නෙ ලංකාවෙ එතුමන්ලා සිටි විවිධ පළාත් පිළිබඳව. ඒ පළාත්වල කරපු දේම කරනවට වඩා, ඒ පළාත්වල ක්‍රියාත්මක වුන දේට වඩා අපේ ප්‍රදේශයට නිර්මාණශීලී විදිහට අපි යමක් කරන්නට ඒ අයගෙ

සහයෝගය ලබා ගැනීම පිළිබඳ ගැටලුවක් නැහැ. හැබැයි මේවයිදි විවිධ චෝදනා පසුවත් එන්න පුලුවන්. ඒ නිසා අපි ඒවා වඩාත් හොඳ සාකච්ඡාවකට බඳුන් කරලා, අවසන් තීන්දුවකට ඇවිල්ලා, කටයුතු කළ යුතුයි. මොකද මට මතකයි අපේ හිටපු සභාපතිතුමා සහබන්දු මහත්තයා කියපු එක කතාවකදි කිව්වා. විනාඩි හතකදි සභාවක් අවසන් වීම පිළිබඳව. ඒක අපට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. විනාඩි හතකදි අඩුම තරමෙන් අපට සභාව ආරම්භ කරලා. අපේ ආගම සිහිපත් කර ගන්නවත් වෙලාවක් නැහැ. ඒ නිසා එතකොට ඒ සභාව එහෙම කරනවනම් ඒකෙ සාකච්ඡා කරන්න තියෙන අවස්ථාව, ගැටලු තියෙන ඒව විසඳන්න අවස්ථාව එහෙම නැහැ. මම කිව්වෙ එතුමා කියපු කතාව අපිට විශ්වාස කරන්න පුලුවන් කමක් නැහැ. හැබැවටම ඒක මම නම් විශ්වාස කරන්නෙ නැහැ. විනාඩි හතකදි සභාව දැන් පාර්ලිමේන්තුව එහෙම නම් සාමාන්‍යයෙන් විනාඩි දහයකදි වගේ ඉවර කරනවා. පැමිණෙනවා අවසන් කරනවා. හැබැයි මාසෙකට අදාල සභාවක් එහෙම කරන්න පුලුවන් කියන විශ්වාසයක් අපට නැහැ. ඒ නිසා දැන් අපි කල්පනා කරගෙන යන කොට ඒ අය දීපු අදහස් පිළිබඳ අනිත් ඒව පිළිබඳවත් අපට වඩාත් වැඩි දුරට හිතන්න සිදු වෙනවා. ඒ නිසා මම ඒ පිළිබඳව සිහිපත් කරන්නෙ එතුමා කියපු කාරණයට මමත් එකගතාවය පළ කරනවා. එහෙම යම් විදිහකින් ක්‍රියාත්මක කරනවනම් අපි මීට වඩා හොඳ සංවාදයක් ඇතිකරල ඒ කටයුත්තට යමු කියන සිහිපත් කිරීම මේ වෙලාවෙ කරනවා.

ඒ වගේම මේ වෙලාවෙ සිහිපත් කරන්න ඕන. ගරු සභාපතිතුමනි, නාමල් රාජපක්ෂ අපේ අමාත්‍යතුමන්ගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වෙන වොලිබෝල් ක්‍රීඩාංගන ඉදිකිරීමේ කටයුත්තෙදි සභාවට යෝජනාවක් ඉදිරිපත් කරන්න කියලා ඔබතුමා මගෙන් ඉල්ලීමකුත් කළා. ඒ පිළිබඳව මම ඒ යෝජනාවත් මම හිතන්නෙ මීට මාස දෙකකට විතර උඩදි සභාවටත් ඉදිරිපත් කළා. අවසානයේ උඩුගම ප්‍රදේශයට ලැබෙන වොලිබෝල් ක්‍රීඩාංගනය උඩුගම දකුණ මගේ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසමකට ලැබුනා. ඒ පිළිබඳව විශේෂයෙන් නාමල් රාජපක්ෂ අපේ ගරු අමාත්‍යතුමාට වගේම ඔබතුමාටත් ඒකට මැදිහත් වෙලා කටයුතු කිරීම සහ ඒකෙදි අපේ ඉසුරු දොඩංගොඩ මැතිතුමත් විශේෂ කාර්යය භාරයක් ඉටු කළා. එතුමන්ටත් ඔබතුමන්ලා තිදෙනාටම මම විශේෂයෙන් කොට්ඨාසෙ මන්ත්‍රීවරයා හැටියට ඒ කටයුත්තට මැදිහත් වීම සහ එය ලබා දීම පිළිබඳව ඒක මුලු උඩුගම ප්‍රදේශයටම ගෞරවයක් හැටියට කෘතවේදීත්වය මම මේ වෙලාවෙ පුද කරන්නට ඕන.

ඒ වගේම තවත් කාරණයක් මම මේ වෙලාවෙ සිහිපත් කරන්නට ඕන ඔබතුමන්ට. ඔබතුමන්ට මතකයි පසුගිය අවුරුද්දෙ ජනවාරි, පෙබරවාරි, මාර්තු වෙනකොට කොරෝනා වසංගතයත් එක්ක ආපු නියගයෙන් මම ඉතාම අපහසුතාවයකට පත් වුනා. ඒ නියගය වෙලාවෙ උඩුගම නැගෙනහිර හැර උඩුගම දකුණ, මධ්‍යම අලුත්වත්ත කියන මේ කොට්ඨාස හැම තැනකම මහා විශාල ජල ප්‍රශ්නයක් මතු වුනා. ජලය බෙදා හැරීමේ ගැටලුවෙදි, ඔබතුමත් යම් යම් වෙලාවට අපහසුතාවයට පත් වුනා. අපි බහින් බස් වීම් පවා වුනා. එතකොට මේක ඒ ප්‍රදේශයේ තියෙන ලොකුම ගැටලුවක්. මම හිතන්නෙ මේ වෙලාවෙ විශේෂයෙන් ඒකටත් අපිට විසඳුමක් ලැබිල තියෙනවා. ඒ පිළිබඳව සඳහන් කළ යුත්තෙත් මම විශේෂයෙන් අපේ ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ මූලිකත්වයෙන් අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීමකට මේ වෙලාවෙ ප්‍රතිචාරයක් හැටියට අපට ලැබිල තියෙනවා. උඩුගම දකුණ මධ්‍යම අලුත්වත්ත කියන ඒ සියලුම ප්‍රදේශවල ජල ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳන්න පුලුවන් විශාල ජල ව්‍යාපෘතියක් අපේ ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන්න අදාල නිලධාරීන් අමාත්‍යාංශයෙන් ඊයෙ දවසෙ ඇවිල්ලා ඒ අවශ්‍ය ස්ථාන හඳුන ගෙන, ඒ කටයුත්ත කළා. ඉදිරි කාලයෙදි ඒ කටයුත්ත නිම වෙනවා. මම ඒක විශේෂයෙන් සිහිපත් කළේ, ඒ ප්‍රදේශයට අදාල දැවැන්ත ප්‍රශ්නයක් සියලු දෙනාට බලපාන ප්‍රශ්නයක් විසඳන්නට මහා විශාල කාර්යය භාරයක් ඒ තුලින් ඉටු වෙනවා. ඒ පිළිබඳවත් විශේෂයෙන් ඒ මගේ යෝජනාවක් පරිදි අපේ ඉසුරු දොඩංගොඩ මන්ත්‍රීතුමා සුවිශේෂී කාරණයක් හැටියට සලකා, වාසුදේව නානායක්කාර මැතිතුමන්ට විශේෂයෙන් ඒ අදාල ලිපි යොමු කරලා, කතා බහ කරලා, ඒ කටයුත්ත සිදු කරලා දුන්නා. ඒ නිසා මේ වෙලාවෙ ඒ

පිළිබඳව විශේෂයෙන් වාසුදේව නානායක්කාර ගරු අමාත්‍යතුමන්ටත්, ඉසුරු දොඩංගොඩ මැතිතුමාටත් සියලු ජනතාවගේ ඉතාම වැදගත් මූලික අවශ්‍යතාවයක් ඉෂ්ඨ කරන්නට සම්බන්ධ වීම පිළිබඳව විශේෂයෙන් මම මේ වෙලාවෙ කෘතවේදීත්වය එල කරනවා.

මේ කාරණා සිහිපත් කිරීමෙදි, මම හිතන්නෙ මේක මේ අපේ සභාවට අදාලවනම් අපි කතා කළ යුත්තේ මේ සභාවෙ, අපේ ප්‍රදේශවල කාරනා. නමුත් මම හිතනවා ඒක අපේ ජාතික මට්ටමේ තියෙන බරපතල ගැටලුවක්. සභාපතිතුමා මට පේන විදිහට මේක මම හිතන්නෙ අපේ රජය විතරක් නෙවෙයි සියලුම රජයන්වල මේක තිබුනයි කියන විශ්වාසය මට තියෙනවා. මේ යාන්ත්‍රණයේ මොකක් හරි දෝශයක් තියෙනවා. යාන්ත්‍රණයේ ගැටලුවක් තියෙනවා. ඒක මම හිතන්නෙ අපේ සභාවටත් අදාලයි. හැම රාජ්‍ය ආයතනයකටම මේක අදාලයි කියල මට හිතෙනවා. ඒකට හේතුව දැන් ඔබතුමාටත් මතක ඇති. දැන් මේ වගේම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සහ ගැටලු විසදන්න තියෙන තැනක් තමයි සම්බන්ධීකරණ කමිටුව කියන්නෙ. දැන් මම පහුගිය සම්බන්ධීකරණ කමිටු රැසක ගැටලු කීපයක් පිළිබඳව සාකච්ඡා කළා. දැන් පසුගිය සභාවෙත් සාකච්ඡා කළා. ඒ වෙලාවෙ මට තියෙන ගැටලුව එක්කො මේ යාන්ත්‍රණයේ නිලධාරීන්ට මේව ක්‍රියාත්මක කරන්න පුලුවන් ඒ ශක්තිය නැති ගැටලුවක් තියෙනවා. මේකෙ ඵලදායීතාවය කාර්යක්ෂමතාවය ඇතිකරන්න. එහෙම නැත්නම් නිලධාරීන් හැකියාව තියාගෙන වගකීම හරිට ඉටු කරන්නෙ නැති ගැටලුවක් තියෙනවා. සම්බන්ධීකරණ රැස්වීමක් වගේ එකකදි ඉදිරිපත් කරන කරුණුවලදි ඒ නිලධාරිත් ඉස්සරහ තියාගෙන මට මතකයි මම ඉදිරිපත් කරපු හැම එකකටම, බස් එකක් නැහැ කිව්වම, ඊට පස්සෙන්ද උදේ ඉදලම බස් එකක් දානවයි කිව්වා. හැබැයි අද තව වෙනකනුත් මොකක්වත්ම ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. ඊලගට සමහර නිලධාරීන් ඉදිරිපත් කරන  නිදහසට කරුණු දිහා බැලුවම හරිම කණගාටු දායකයි. මම මේව සඳහන් කළ යුතුයි ඇත්තටම. මොකද අනිත් අයත් දැනගන්න ඕන. උඩුගම ඩිපෝවෙන් ආපු නිලධාරියා ඉදිරිපත් කළේ උඩුගම බංගම පාරෙ බස් එකක් යන්න බැරි දෙපැත්තෙ කැලේ වැව්ච්ච හින්දයි කිව්වා. හැබැයි මේක මීට වසර 15 කට 20 කට උඩදි ඉදලත් විශාල බස් ගමන් කළා. දැනටත් විශාල ප්‍රමාණයේ බස් ගමන් කරන ප්‍රසිද්ධ පාරක්. එතකොට ඒකට දීපු නිදහසට කාරණය මේ. එතකොට දැන් සමහර අවස්ථාවලදි අපි ඇහුවම කියන්නෙ මේක පාඩුයි කියලා. දැන් ඒ නිලධාරිය කියනවා. පාඩුත් නැතිලු බස් එකෙන් ලාභයිලු. හැබැයි මේ දෙපැත්තෙ කැලේ වැව්ච්ච හින්ද පාරෙ යන්න බැරිලු පාරෙ ඉඩ මදිලු. එහෙමනම් අපට ඒක බරපතල ගැටලුවක් ඒවා. එතකොට ඒ නිලධාරීන් දෙන පිළිතුර ඒ විදිහටම පිළිගන්නවද කියලා. ඊට පස්සෙන්දා මේ බස් එක යොදන්න පොරොන්දු වුනත්, අද තව වෙනකනුත් ඒක ක්‍රියාත්මක වුනේ නැහැ.

ඒ වගේම මම එතනදි කතා කරපු කාරණයක් මේකෙත් සටහන් වෙන්නට ඕන. වටවල වතු සමාගමෙන් සිදු කළ පරිසර හානියක් පිළිබඳ කතා කළා. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙ නිලධාරිතුමා ඉස්සරහ තියාගෙන එවෙලෙ දැනුම් දුන්නා. ඒකට අදාල ක්‍රියාමාර්ග ගන්න කියලා. එතුමා එවලෙම පොරොන්දු වුනා. හැබැයි ඒ කිසිවක් ක්‍රියාත්මක නැහැ. එතකොට මේව පිළිබඳ බරපතල ගැටලු තියෙනවා. ඉතිං මේවයින් විශේෂයෙන් අපහසුතාවයට පත්වෙන්නෙ අපේ රජය. මම අර කලින් කිව්ව වගේ දැන් ඔබ වුනත් කල්පනා කරල බලන්න. මේ වෙලාවෙ මිනිස්සු අතර මතයක් තියෙනවා. මේ රජය සම්පූර්ණයෙන්ම කලකිරිලා පිරිහිලා මේකෙ ඇති දෙයක් නැහැ. මේකෙ ගන්න දෙයක් නැහැ. සියලු දෙනා දොස් කියනව කියන මතය තියෙනවා. හැබැයි ඒකෙදි යම් කාරණයකට එන්න තියෙනවා. අපේ තියෙන මේ අඩුපාඩු කම් නිසා තමයි මේවට අපට මග පාදන්න වෙලා තියෙන්නෙ. මේ කතාවලට අපට ඇහුන්කන් දෙන්න වෙලා තියෙන්නෙ. හැබැයි එහෙම නැතුව බැලුවොත් අපි සියලු දෙනා දන්නවා මන්ත්‍රීවරු හැටියට යම් වැඩ කොටසක් මේකෙ කෙරෙනවා. ඒව පිළිබඳ විදහා දැක්වීමක්, ඒවා මතු වීමක් පේන්නෙ නැහැ. අර වැරදි අසත්‍ය දේම තමයි වැඩිය ඉස්මතු වීමේ ප්‍රවනතාවක් අපි දකින්නෙ. උදාහරණයක් හැටියට මම දකින්නෙ විටින් විට එක එක මාතෘකා එනවා. දැන් මට මතකයි පහුගිය දවස්වල අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අර ගම සමග

පිළිසඳරක් කියන වැඩසටහනට ගියාම මේකෙ හැබෑ තත්වය අපට තේරෙනවා. සමහර වෙලාවට පරම්පරා ගණනාවක් තමන් වගා දිගා කරගෙන හිටපු ඉඩම් පැහැදිලිව පේනවා. අපට ඒවා එතකොට දැන් මේ වෙලාවෙ ගිහිල්ලා අපේ ගෝඨාභය රාජපක්ෂ ගරු ජනාධිපතිතුමා කොහේවත් කැලයක් එලිකරලා, මිනිස්සුන්ට දෙන්න කියලා කියනවා මම නම් කවදාවත් අහල නැහැ. අර පරම්පරා ගණනාවක් මේවා දිගට ගිහිල්ලා, දැන් අලුතෙන් ගිහිල්ලා මේවයි මායිම් දාලා එන්න ගියහම තියෙන ගැටලුවක්. මේකෙ වැරැද්දක් කොතනක හරි වෙලා තියෙනවා. වැරැද්ද වෙලා තියෙන්නෙ අපි දකින්නෙ මේක ආරම්භයේ නිලධාරීන් අතින් වෙච්ච වැරැද්ද අද නිවැරදි කරන්න බැරි මට්ටමට පත්වෙලා. දැන් අපේ ගමවලත් එහෙම තියෙනවා. මගේ කොටසෙ තියෙනවා ඉඩමක් 19 කන්ද කියලා ප්‍රාදේශීය ලේකම්ට තමයි අයිති. ඒකෙ ඉඩම් කොටසක් ඉතුරු වෙලා තියෙනවා. කොටසක් බෙදල දුන්නා. හැබැයි ඒකෙ දැන් පර්චස් 40 දීපු මිනිහා අද වෙන කොට ඒකෙ අක්කරයකට වැඩි ප්‍රමාණයක් අල්ලගෙන. මේක බලන්න කෙනෙක් නැහැ. ඒකට ප්‍රායෝගික ගැටලුවක් තියෙනවා. ග්‍රාම නිලධාරීතුමියක් ඉන්නෙ. මේ දවසින් දවස එක වාරෙකට එක තේ පේලියක් වෙන්න අල්ලලා, අක්කරයකට වැඩිය ප්‍රමාණයක් අල්ලලා තියෙනවා. එතකොට මේ තියෙන්නෙත් කාගෙ වැරැද්දද? මේ තියෙන්නෙත් නිලධාරීන් අතින් ඒක එක්කො නිලධාරීන්ට ඒක කරන්න තියෙන ශක්තිය නැතිකම හරි එහෙම නැත්නම් වගකීම පැහැර හැරීමක් හරි. එතකොට දැන් ඊගාවට දැන් එහෙම ඇල්ලුවම දැන් මේක ආපහු අරගෙන මේක අර වැඩි කොටස ගන්න ගියාම ඊලගට ජනතාව අතර රජය පිළිබඳව මහා අප්‍රසාදයක් ගොඩ නැගෙනවා. අපේ දීපු එකත් ගත්තයි කියන කතාව තමයි මිනිස්සු කියන්නෙ. ඒ නිසා මේ නිලධාරීන් තුලින් මේක ක්‍රියාත්මක කිරීමේ බරපතල ගැටලුවක් තියෙනවා. මේ විතරක් නෙවෙයි දැන් පැහැදිලිවම කිව්වොත් මේ වන විට අපි සාමාන්‍යයෙන් කල්පනා කරල බැලුවොත් අපට දැන් ගිය අවුරුද්දෙත් මේ කොරෝනා වසංගතය තිබියදී මගේ කොට්ඨාසෙටම ලක්ෂ 80 ක පාරවල් අපි ඉදිකරලා දුන්නා. ඊලගට හැම වසමකටම අපි නිවාසයක් බැගින් ගිය අවුරුද්දෙත් ඉදිකරලා දුන්නා. දැන් මේ ඉදිරියටත් මේ වර්ෂෙත් එක වසමකට නිවාස පහක් බැගින් ඉදි කරන්න යෝජනා කරලා තියෙනවා. මේවා මෙහෙම වෙන ගමන් අද වැඩිපුරම ගිහිල්ලා තියෙන්නෙ බඩු මිල පිළිබඳ කතාවට තමයි. ඒක පැහැදිලිවට අපිත් කියන්නට ඕන. මිනිස්සුන්ට දැනෙන දේ ඒක. බඩට දැනෙන දේ තමයි බඩ ගින්න. එතකොට බඩට දැනෙන ඒ බඩගින්න නිවාරණය කර ගන්නට අවශ්‍ය පහසුකම් සැලසුනේ නැතොත් මේ අනිත් සියල්ල කළත් ඒ සියල්ල යටපත් වෙලා තියෙන්නෙ. ඒ කිසිවක් වැඩක් නැහැ. එතකොට දැන් අද කියන්නෙ කහ මිලයි, ගම්මිරිස් මිලයි නැත්නම් මුං ඇට මිලයි, කවුපි මිලයි. හැබැවටම මේව පිළිබඳව අපිට ගැටලුවක් තියෙනවා. ඒ නිසා මේවයිදි තීන්දු තීරණ ගැනීමේදී අපි දකින්නෙ සමහර වෙලාවට මම දුටුවා සමහර අමාත්‍යවරු කියනවා. මොනව කිව්වත් අපි කහ පිට රටින් ගේන එක අපි කරන්නෙ නැහැ. මොන තරම් ඉහල ගියත් කියලා. හැබැයි ඒකෙ පොඩි ප්‍රායෝගික ගැටලුවක් තියෙනවා අපට මිනිස්සුන්ට දැන් අද කහ කිලෝ ග්‍රෑම් එකක් මම දන්නෙ නැහැ ඇත්තම කතාව මොකක්ද කියලා කියන්නෙ. රුපියල් 5000 කියලා එතකොට රු.5000 ක් වගේ විශාල මුදලක් අපි මේ අපේ සාමාන්‍ය ජනතාව නිතර පාවිච්චි කරන දේකට එතකොට මේක වලක්වන්න මොකක් හරි ක්‍රමවේදයක් අපි ගාව නැති ගැටලුවක් තියෙනවා. මේ ක්‍රමවේදය මොන ක්‍රමයකින් හරි මේකට හැකියාවන් තියෙන ක්‍රමවේදයන් දෙන්න පුලුවන් පිරිස් ඉන්නවා. ඒව අරගෙන ඒ කටයුත්ත කරන්න කියලයි මම කියන්නෙ. දැන් කහ මිල වැඩිවීම ජනතාවට බලපාපු ප්‍රශ්නයක් ඒ නිසා තමයි අර අනිත් සියල්ල යටපත් වෙලා තියෙන්නෙ. එතකොට මේකෙ යම් වාරණයක් කරනවනම් මම දකින්නෙ ඒ වාරණය කිරීමේදී ජනතාවගේ අත්‍යාවශ්‍ය දේවල් අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල පිළිබඳව කල්පනා කරල බලල ඒව පහත හෙලන විදිහට අඩුම තරමින් ඒවවත් ආනයනය කරලා දැනට අපි ස්වයංපෝෂිත වෙනකම් මේකට පියවරක් තියෙන්න ඕන. අපි ස්වයංපෝෂිත වෙලා ඉවර වෙල තමයි මේක දෙන්න ඕන. එහෙම නැත්නම් මේ විදිහට ගියොත් මේ මිල මේ ආකාරයෙන් ගියොත් මේවා ඒ වෙළෙන්ඳන්ටම හසුරුවන්න ඉඩදීලා නිකන් හිටියොත් බරපතල ගැටලුවක් වෙනවා. ගැසට් නිවේදන නිකුත් කිරීම

පිළිබඳව මම හිතන්නෙ විවිධ අය උපහාසයෙනුත් බලනවා. අපි ගැන විතරක් නෙවෙයි සිරිසේන මැතිතුමා, අපේ හිටපු ජනාධිපතිතුමාටත් ඒ ගැටලුව තියෙනවා. මේකෙත් එහෙම ගැසට් නිවේදන පිළිබඳ දැන් නිකන් අමුතුම උපහාසෙන් බලන කතාවක් තමයි පත්වෙලා තියෙන්නෙ. ගැසට් නිවේදන නෙවෙයි මේකට ක්‍රියාත්මක කරන්න පුලුවන් ක්‍රමානුකූල වැඩපිළිවෙලක් නිර්මාණය කරන්න. සමහර වෙලාවට අපේ ඇමතිතුමා ජනමාධ්‍ය වේදීන්ටත් දොස් කියනවා. ටිකක් තරහ ගිහිල්ලා. කතාව ඇත්ත ජනතාවට දැනෙන ප්‍රශ්නෙ තමයි ඒ මිනිස්සු අහන්නෙ. ඒ දැනෙන ප්‍රශ්නයට තරහ යාමට වඩා මම දකින්නෙ අපි නිවැරදි විසඳුමක් ගන්න ඒ අදාල දක්ෂතාවය තියෙන අය තුලින් ඒව අරගෙන හරි ක්‍රියාත්මක කරන්න ඕන කියන කාරණය කියනවා. මම මේ ටික කිව්වෙ මේ ටික අපේ ප්‍රාදේශීය සභාවට අදාල නැහැ. මේක ජාතික මට්ටමේ ප්‍රශ්නයක්. ජාතික මට්ටමේ ප්රශ්නයක් වුනත්, අපි අවබෝධයෙන් කටයුතු කරන්න වෙනවා. මොකද අපි අතරත් මේ මතයමෙයි තියෙන්නෙ කියන කාරණය දෙන්න ඕන. ඒ නිසා මම ඒ ටික කිව්වෙ. මේ වෙලාවෙ ජනතාවගෙ බඩට දැනෙන ප්‍රශ්නයට විසඳුමක් අනිවාර්යයෙන්ම අවශ්‍යයි. ඒ නිසා අපි අපේම රජයක් යටතේ වුනත් මම යෝජනා කරනවා. මේ ප්‍රශ්නය මිනිස්සුන්ට ඉතාම දැඩිලෙස දැනිල තියෙන්නෙ. ගම්වල මිනිස්සු අපිත් සමග මේ පිළිබඳ කතා කරනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට රජය වහාම ක්ෂණික පියවරක් ගන්න වෙනවා. බඩු මිල පිළිබඳව දැන් ගෑස් මිල පිළිබඳව දැන් මෙතුමන්ලනම් කිව්ව කලින් මිල ගිහිල්ලයි කියලා. තවම මිල ගිහිල්ලනම් නැහැ. දැන් ඒකට අනාවැකි පළවෙනවා. 750 ක් පාඩු ලබනවයි කිය අනාවැකි පළ කරනවා වැඩි කරන ගාන පිළිබඳව. මේව පිළිබඳව විශේෂයෙන් මේවා අපේ කොට්ඨාසෙ විතරක් නෙවෙයි නාගොඩ සභා ප්‍රදේශයේ විතරක් නෙවෙයි මුලු රටටම බලපාන ප්‍රශ්නයක්. ඔබ වුනත් කල්පනා කරල බලන්න අපේම පාක්ෂිකයොත් බරපලත ලෙස අපට දොස් කියනවා. බරපලත ලෙස මේ ප්‍රශ්නයට දොස් කියනවා. හැබැයි අපි කියන්නෙ නැහැ මේක දවසින් දෙකෙන් විසඳන්න නමුත් මේකට මොකක් හරි ක්‍රියා මාර්ගයක් ගතයුතුයි කියන කාරණය මම විශේෂයෙන් සිහිපත් කරනවා.

ඒ වගේම තව විනාඩියක් විතර මට දෙන්න. අපේ වෙරංග මන්ත්‍රීතුමා සිහිපත් කරපු විදිහට, මමත් කතා කරපු විදිහට මේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ නිලධාරීන්ගෙ ගැටලුවේදී දැන් මට සමහර වෙලාවට යම් යම් දේවල් පිළිබඳව සභාවෙ කතා කරන්න හිතෙන්නෙත් නැහැ. සභාපතිතුමා මම ඉල්ලීමක් කළා. අර උඩුගම බංගම මාර්ගයේ මම හිතන්නෙ දැන් මාස පහකට හයකටත් වඩා වැඩියි. ඒකෙ අර අඩුම තරමින් අපේ සභා බල ප්‍රදේශයට ඇතුල්වෙන තැන බෝඩ් එකක් දාන්න. හැබැයි ඒක බැරිය කිව්වෙත් නැහැ. එහෙම නැත්නම් මේක කරන්න හැකියාවක් නැහැ. එහෙම නැත්නම් මේකට සල්ලි නැහැ. කරන්න බැහැ කියන කතාව කියන්නෙත් නැහැ. පොරොන්දු වෙන්නෙ හරි අපි ඒක කරමු කියලා. හැබැයි ඒක අද වෙනකනුත් කෙරුනෙ නැහැ. ඊට පස්සෙ දැන් එතුමා කියපු විදිහට ලයිට් ගැටලුවෙදි, මොකද මගේ කොටසෙ විශේෂයෙන් මම ජීවත් වෙලා ඉන්න වසමෙ වීදි පහන් පිළිබඳව බරපතල ගැටලුවක් තියෙනවා. ඔබතුමා ප්‍රායෝගිකව දැක්කා. ඒකෙ වීදි පහන් ඇත්තෙම නැහැ. මේවට යෝජනා ඉදිරිපත් කරලා මම හිතන්නෙ අදාල විදිහට ඒ නිලධාරීන් ගිහිල්ලා අනුමත කරලත් තියෙනවා. දැන් මාස තුනකට වඩා වැඩියි. ප්‍රශ්නෙ තියෙන්නෙ ඒව ක්‍රියාත්මක වෙන්නෙ නැහැ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන මම ඇහුවා. ඔබතුමා සේරම දාන්න බැරිනම් දාන්න එපා කියලා තියෙනවා. ලයිට් දෙකක්ද කොහෙද තිබිල තියෙන්නෙ එදා ගිහිල්ල තියෙනවා ලයිට් ටික දාන්න සේරම නැහැ බඩු තිබුන විදිහට දාන්න ඒ පාර ඔබතුමා කිව්වලු සේරම දාන්න බැරිනම් දාන්න එපා කිව්ව කියලා මාත් එක්ක කිව්වා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

මම සභාවට ආපු දවසෙ මට කතා කළේ. ඒ නිලධාරි එහේ ගියේ නැහැ. මෙතන්ට කතා කරලා මගෙන් ඇහුවා. මෙතනදි කතා කලේ. ඒකෙ හැබෑම කාරණය බල්බ් දෙකක් තියෙනවා. ඒ බල්බ් දෙක විතරයි දාන්න අනුමත කරල තියෙන්නෙ. මගේ කොට්ඨාසෙ දුෂ්කරම ඈතම ප්‍රදේශයට බල්බ් හයක් විතර නියම වෙලා තියෙනවා. මේ නිලධාරි ගියාම ඒකෙ තියෙන ගැටලුව හින්ද තමයි මම එහෙම කිව්වෙ. හේතුව බල්බ් දෙකකට මේ වාහනෙත්, ඉන්ධනත් වියදම් කරගෙන ඒ නිලධාරීන්ගෙ කාලයත් යොමු කරගෙන යාම වැඩක් නැහැ. අලුත්වත්ත කොට්ඨාසෙ විතරක් බල්බ් හයක් අනුමත කරල තියෙනවා. මම කිව්වෙ ඒ බල්බ් දෙක විතරක් නම් ඒ යන පාරෙම තියෙන අනිත් බල්බ් දෙකද තුනද බල්බ් පහ දාන්න බැරිනම් යන්න එපා කියලා. නමුත් මම ඒ කතාව කිව්වා ඒක මම දැක්කෙ ඵලදායීතාවය පිළිබඳ ගැටලුවක් ඒක. මොකද වාහනෙන් නිලධාරි දෙන්නෙක් බල්බ් දෙකකට උඩුගම අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමේ උඩුගං කැල්ල කියන එහා කෙළවරටම යන්න ඕන. මහ විශාල දුරක් ගෙවාගෙන යන්න ඕන. ඒ එන අතර තුරෙ තව බල්බ් දෙකක් නැත්නම් තුනක් තියෙනවා. මම කිව්වෙ අඩුමගානෙ ඒ පහවත් දාන්න යන්න එපාය. ඒ නිසා මම ඒ පිළිබඳව එහෙම සිහිපත් කළා. ඒක වැරදි විදිහට අවබෝධ කර ගත්තනම් ගැටලුවක්. එහෙම නැතුව වැරදි විදිහට අවබෝධ කර ගන්න නෙවෙයි මම ඒක කිව්වෙ. මම ඒක සභාවේ ලැබෙන්න ඕන ඵලදායීතාවය පිළිබඳ ගැටලුවක් හින්ද මම එහෙම කතා කළේ. ඒ නිසා ඒ පිළිබඳවත් සිහිපත් කරමින් ඒ ගෙනාපු යෝජනා බැලුවොතින් සභාවෙ තව ක්‍රියාත්මක නොවුනු වැඩ මහ විශාල ගොඩක් තියෙනවා. ඒ නිසා ඔබතුමාගෙ අවධානයට යොමු කරනවා. අපි මෙතෙක් ගෙනාපු ඒවයි තව තව අලුතින් යෝජනා ගේනවට වඩා ගෙනාපු ඒවයි යම් කොටසක් හෝ ක්‍රියාත්මක කරන්න පුලුවන්නම්, ඒ කොටස හරි ක්‍රියාත්මක කරන්නෙයි කියන කාරුණික ඉල්ලීමත් ඔබතුමාගෙන් කරමින්, මම නිහඩ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, ලේකම්තුමිය ඇතුලු සියලු මන්ත්‍රී මණ්ඩලයෙන්ද අවසරයි. ඇත්තටම අපට ඊයෙ සුවිශේෂී දිනයක් වුනා. අපි ලෝක කාන්තා දිනය සැමරුවා. හැම පක්ෂයකින්ම ලෝක කාන්තා දිනය සැමරුවා. නමුත් එතනට සහභාගි වුනේ නැහැ. ක්ෂණිකව සිකුරාදා සාකච්ඡා කරලා, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත ඌරල ගොවිජන කොට්ඨාසයේ, අපේ කොට්ඨාසෙ යටලමත්ත නැගෙනහිර රන්ලිය ගොවි කාන්තා සමිතියෙන් පොඩි වැඩසටහනක් කරලා, ගෙවල්වල වගා කර ගන්න මිරිස් පැල, කහ වගේ පැකට් කරලා දුන්නා. ඒ වගේ පොඩි වැඩසටහනක් අපි කළා. මොකද දේශපාලන අධිකාරිය නැතුව තමයි කළේ. මම ඒ සමිතියේ ලේකම් නිසා මම එම ස්ථානයට ගිහිල්ලා, ඒ සියලු කටයුතු සංවිධානය කරලා, ලෝක කාන්තා දිනය සිහි කිරීම පිණිස ලස්සන පොඩි උත්සවයක් කළා

ඒ වගේම මතක් කළ යුතු දෙයක් තමයි අපගේ හිටපු යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ප්‍රථම සභාපති වුනා. ඊලගට පළාත් සභාවේ වසර 15 ක් සේවය කළා. ඒ වගේම නිල නොලත් මහේස්ත්‍රාත් ධූරය දැරුවා. ඇත්තටම ඒ මහත්මයගෙ දේහය මෙතනට ගේන්න බැරි වුනානම් අපි මේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ඉන්න ජනතාවට ලොකුම අගෞරවයක් වෙනවා. ඇත්තටම ඒ අවස්ථානුකූලව සභාපතිතුමත්, අපේ උප සභාපතිතුමත්, උඩලමත්ත විහාරාධිපති හිමියනුත්, මැදිහත් නොවුනනම් ඒ මරණෙ මේකට ගේන්න හම්බ වෙන්නෙත් නැහැ. මේ වගේ ගරු සැලකිලි හම්බ වෙන්නෙත් නැහැ. ඒවගේම වැඩ කරන මනුස්සයට විවේචන වැඩියි. ඒ නිසා එතුමටත් වුනේ ඒකයි. ඒ ගෙදරට රස්සාවල් දුන්නා රට යැව්වා. එහෙම ගෙදරින් තමයි අන්තිම උපහාර දක්වන්න ගිහිල්ලා මේව වුනේ. අන්තිමට ගෙදරට ගිහිල්ලා සමාව ගත්තා. පහුගිය දවසක ඒ

සිදුවුන අසාධාරණයට සමාව අරගෙන තිබුනා මොකද අන්න එහෙම තමයි වෙන්න ඕන. ඇත්තටම ඉහලම ගෞරව ලැබුන නිසා නාගොඩ ප්‍රාදේශීය සභාවට ලොකු ප්‍රසංසාවක් ආවා. ඒ අවමංගල්‍යයය අපට මේ ආකාරයෙන් කරගන්න බැරි වුනානම් ඇත්තටම ලොකු දුකක් ඇතිවෙනවා ඒක නිසා සභාපතිතුමා ඇතුලු උප සභාපතිතුමාටත් අපේ උඩලමත්ත විහාධිපති හිමියන්ටත් අපි ඇත්තටම ස්තූති වන්ත වෙන්න ඕනෙ. ඒ කාරණය කරල දීම පිළිබඳව.

තව එකක් තමයි ඊයෙ ඔය අපේ ඉසුරු දොඩංගොඩ මැතිතුමා විසින් ජල ව්‍යාපෘතියක් කිව්වා ඇත්තටම අහම්බෙන් වගේ මටත් ඒකට සහභාගි වෙන්න සිද්ද වුනා. ඒ කියන්නෙ යටලමත්තට අලුත් ග්‍රාම නිලධාරී කෙනෙක් ඇවිල්ලා හිටියේ එතුමා කිව්වා මෙහෙම ජල ව්‍යාපෘතියක් එනවා ඒකට ඉඩමක් බලන්න එනවා. ඒ ඉඩම සම්බන්ධව හොයන්න කියලා. ඉතිං මම හිතල තිබුන තැන හරි මම ඒ පාර කිව්වා. මේ අසවල් තැනට යන්න කියලා. ඒ රාලහාමිත් එක්ක ඒ නිලධාරීන් ගියා. උඩුගමින් පටන් අරගෙන යටලමත්ත හරහා ටැංකි ගහලා වදුරඹට වෙනකම් වතුර දෙන ව්‍යාපෘතියක් තමයි කිව්වා තියෙන්නෙ. ඒකට තෝර ගත්තෙ යටලමත්ත හන්දියෙ සමිත් ශාලාව අසළ භූමිය තමයි මම හිතන්නෙ. සභාපතිතුමාටත් කතා කළාද දන්නෙ නැහැ. වටවල සමාගමට කතා කළයි කියලා ග්‍රාම නිලධාරීතුමා කිව්වා. ඒ වැඩේ සාර්ථකව කෙරෙනවයි කියලා කිව්වා ඒගැනත් ස්තූති වන්ත වෙමින්, අද දින පැමිණි සියලු දෙනාටත්, මම ස්තූති කරමින්, සභා ගැබෙන් පිටත්වීමට අවසර බලාපොරොත්තුවෙන් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී කේ. කේ අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන්ගෙන් මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. මේ අවස්ථාව මම ලබා ගත්තේ උඩවැලිවිටිය කියන ගමට යන්න මේ අවස්ථාව වෙනකොට පාරක් අහිමි වේගෙන එනවා. මොකද නාගොඩ ප්‍රධාන පාලමේ සිට උඩවැලිවිටියට හැරෙන තැනදි ප්‍රධාන පාර උසයි. උඩවැලිවිටියට යන පාර පහතයි. ඒක නිසා උඩවැලිවිටිය පැත්තෙ ඉදලා එන කොට බයිසිකලයක් අර ප්‍රධාන පාරට දාගන්න බැරි තත්වයක් දැනට උදා වෙලා තියෙනවා. එම ස්ථානයේදී ජනතාව ඉතාම අපහසුතායකට පත් වෙනවා. මොකද දෙපැත්තෙන් එන වාහන ගැන අපට බලන්න විදිහක් නැහැ. එතන උඩට බයිසිකලය ගන්න අවස්ථාවෙදි ප්‍රධාන පාරෙ යන අයත් දන්නෙ නැහැ මෙතන අතුරු පාරකින් බයිසිකල් මෙතනට වැටෙනවද කියලා. ඒක නිසා ඒ පාර හදල දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වගේ තමයි ඊට එහා ප්‍රදේශත් හවස් වෙන කොට ඒ කියන්නෙ මේ දිනවල වර්ෂාව වහින නිසා පාරෙ වලවල් ඉතාම වැඩියි. පාරෙ හැමදාම යන ජනතාව දන්නවා මේ ස්ථානයෙන් ගියොත් වලක වැටෙනවා කියන එක. නමුත් කලාතුරකින් යන මනුස්සයෙක් දන්නෙ නැහැ මෙතන මේ ස්ථානයේ වතුරවල ඉතා ගැඹුරුයි කියන එක. ඒ නිසා ඒ අවස්ථාවත් සකස් කර දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම තමයි සහබන්දු මන්ත්‍රීතුමා අපටත් දොශාරෝපනයක් කරමින් උඩවැලිවිටිය වතුර ව්‍යාපෘතිය ගැන කතා කළා. ඒ පිළිබඳ මේ වෙනතුරු අපි කිසිවක් දන්නෙ නැහැ. වුනේ මොකක්ද කියලා. ඒ ගැනත් මතක් කරනවා. ඒ වගේම තමයි උඩවැලිවිටිය බටහිර ජල ව්‍යාපෘතියක් ගැන සහබන්දු මහත්මා මන්ත්‍රීවරුන්ට චෝදනා කරමින් ගිය සභා වාරෙ නෙවෙයි ඊට ඉස්සෙල්ල සභා වාරෙද කොහෙදත් එතුමා කතා කළා. නමුත් මේ වනතුරුත් වුනේ මොකක්ද කියන එක මේ අවස්ථාව වෙන තුරු අපි දන්නෙ නැහැ.

ඒ වගේම පසුගිය සති දෙකකට තුනකට විතර කලින් අපේ පාරත් ටිකක් හැදුනා.  ලයිට් ටිකත් දැමුනා. මොකද ඔබතුමාගේ පාක්ෂිකයෙකුගෙ ගෙදර අවමගුල් උත්සවයක් තිබුන නිසා ඒ පාරත් හැදුනයි කියලා මම හිතනවා. අපේ ගෙවල් හරියෙ නැතිවෙලා තිබුන ලයිට් ටික නැවත දැම්මා.

එතුමාගේ මළගමත් එක්කම ඒ පාරත් ටිකක් සුද්ද වුනා. බල්බ් ටිකත් වැටුනා. අපේ නෙලී මන්ත්‍රීතුමිය මතක් කළා වගේ සිරිකොත පක්ෂ මූලස්ථානයට ගිහිල්ලා, අපිත් ඊයෙ කාන්තා දිනය සැමරුවා. මේ සභාව නියෝජනය කරමින් මමත් ගයන්ති මන්ත්‍රීතුමියත් සහභාගි වුනා. අපේ නායකතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා, සභාපතිතුමා වජිර අබේවර්ධන මැතිතුමා, රංගෙ බණ්ඩාර මැතිතුමා ඇතුලු සියලුම නායකයො ඒ අවස්ථාවට සහභාගි වුනා. ඒක නිසා ඒ ගැනත් මතක් කරමින් තව බොහෝ අඩුපාඩු තියෙනවා මට කියන්න. මේ ප්‍රධාන පාරෙත් යන්න බැහැ මේ අවස්ථාව වෙන කොට ඉතාමත් ගැඹුරට වලවල් හැරිලා ඒක මම මේ සභාවට ආව අලුතම තමයි කිව්වෙ දැන් අවුරුදු තුනකුත් වෙනවා. ඊට වැඩිය දැන් අවදානම වැඩියි. ඒ ගැනත් මතක් කරමින් මගේ කතාව අවසන් කරනවා. සියලු දෙනාටම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමිය, ඒ මාර්ගය සම්බන්ධව යෝජනාව දාලා, ඒක දැන් යතා කාලෙදි සංවර්ධනය වෙනවා. කාපට් කරන්න කලින් ඒක එස් පී ආර් ඩී එකෙන් සංවර්ධනය කරනවා.

ගරු මන්ත්‍රීතුමිය, වීථි පහන් සවි කිරීම, ඒක මම සූක්ෂම අයුරින් කරන්නෙ. මොකද දන්නවද ඒ මළ ගෙදර පිටින් දාලා තමයි ඒ ලයිට් ටික හදන්නෙ. නැත්නම් අපේ ප්‍රදේශයේ ලයිට් හදන්නෙ නැද්ද කියලා අනිත් මන්ත්‍රීවරු අහනවා. මේ මළ ගෙදරක් නිසා දානවයි කියල ඒ විදිහට තමයි ඔය හැම පළාත්වලම ලයිට් ටික ක්ෂණිකව දාගන්න කටයුතු කරන්නෙ.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඒ වගේම ලේකම්තුමියගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ගිය සම්බන්ධීකරණ කමිටුවෙදි කතා කළා හොමදොල ජන උදාන ගම්මානයේ පාලමක් අසල බැවුම ගලවගෙන ගිහිපු සිද්දියක් පිළිබදව. මේ ඊයෙ පෙරේද වෙද්දිත් ගලවන් ගිහිල්ල දැන් පාරක් නැති වෙනවා. කාපට් පාර ඒක සභා පාරක් ගරු සභාපතිතුමනි, ඔබතුමා ඒකට ගන්න ක්‍රියාමාර්ගය පිළිබදව දැනගන්න කැමතියි. ඒ වගේම සභාපතිතුමනි, අපේ හෝමදොල පොලීසිය අසල කාපට් එක කැඩීම පිළිබදව සම්බන්ධීකරණ කමිටු දෙකකදි කතා කළා. මම හිතන්නෙ ඒ පිළිබදත් තීන්දුවක් ගැන අපි දන්නෙ නැහැ. සභාපතිතුමනි, ජනඋදාන හෝමදොල ප්‍රධාන පාර බැම්ම පාරත් එක්ක ගලවගෙන ගිහිපු එක සම්බන්ධීකරණ කමිටුවෙත් කතා කළත්, ඒකට කිසිම ක්‍රියාමාර්ගයක් මේ වෙන තෙක් අරගෙන නැහැ. ඒක ප්‍රාදේශීය සභාවෙ පාරක් නිසා ඒ අයට කරන්න බැහැ කියලා ආර් ඩී ඒ එක කියනවා. සභාපතිතුමනි, මේකට මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගන්න දැන් මම ඉල්ලීමක් කරන්නෙ සභාවෙන් ආර් ඩී ඒ එකට හරි අදාල ආයතනයට හරි ඉල්ලීමක් කරන්න.

පොලීසිය අසළ කාපට් එක කැඩීම පිළිබඳව විතරයි ඉල්ලීම කරලා තියෙන්නෙ. හෝමදොල ප්‍රධාන පාරෙ, පාළම අසළ පාර ගලවගෙන ගිය එකට ඉල්ලීමක් කරල නැහැ. දැන්ම විසඳුමක් නොදුන්නොත් මුළු පාරම ගලවන් යනවා. හෝමදොල ප්‍රධාන පාරසම්බන්ධයෙන් සම්බන්ධීකරණෙදි උත්තරයක් ලැබුනෙ නැහැ.

පොලීසිය ගාව එක තාක්ෂණ නිලධාරී මහත්තයා කතා කරලා, ඒ ටික කළා. සභාපතිතුමා, අපි මෙතන කතා නොකර සම්බන්ධීකරණ කමිටුවෙදි කතා කළහමත් සභාපතිතුමාගෙ හිත හොද නැහැ.

අපි සභාවෙදි කියන්න ඕන දේ සම්බන්ධීකරණ කමිටුවට ගිහින් කිව්වයි කියලා. අපේ විදුහල්පතිතුමා කිව්ව වගේ සම්බන්ධීකරණ කමිටුවට කිව්වයින් පස්සෙත් ඒකට අපට හරි උත්තරයක් එන්නෙ නැහැ. මම ඉසුරු මන්ත්‍රීතුමාටත් කතා කරල කිව්වා ඉසුරු මන්ත්‍රීතුමා මොකක් හරි ක්‍රමවේදයක් කරන්නම් කිව්වා.

සමාවෙන්න මෙහෙම කියන්න වුනාට, සභාපතිතුමාගෙන් එවෙලෙ සම්පත් මහත්තය ඇහුවා ඒක කාගෙ පාරක්ද කියලා. සභාපතිතුමාට එවලෙ කියන්න තිබුනා. මේක අපි නෙවෙයි කළේ. මේක ආර් ඩී ඒ එක කලේ. ආර් ඩී එකට වගකීම දෙන්න කියලා. නමුත් සභාපතිතුමා එවලෙ එහෙම එකක් කිව්වෙ නැහැ අපේ පාරක් කියලා කිව්වා. අපේ පාරක් කියලා කිව්වට පස්සෙ ඒක සභාපතිතුමාටම තමයි ඇගේ ගහල එවන්නෙ. ඒක නිසා සභාපතිතුමා ,මොකක් හරි ඉක්මනින් තීන්දුවක් මේකට ලබා දෙන්න

ඒ වගේම අපි කිව්වා. අනිවාර්යයෙන්ම අයවැයෙන් පස්සෙ පාරෙ තණකොල කැපිල්ල නවත්වයි කියලා. ඒ වගේම ඒක නැවතුනා. සභාපතිතුමාට කරදර කරලා වැඩක් නැති නිසා මම ඊයෙ ඉදලා අපේ මැෂින් එකක් දාගෙන අපේ අතින් තෙල් ගහගෙන පාර දෙපැත්තෙ තණ කොල ටික කපනවා. අපි අයවැයට ඡන්දෙ දීලම කිව්වා, ඊට පස්සෙ ඉදලා මේක නවතී කියලා.

සභාපතිතුමා, අපි මොකක් හරි දෙයක් කිව්වම ඒකට සාධාරණ උත්තරයක් අපට ලබා දෙන්න. ඔබතුමා කරන්න පුලුවන් උදවුවක් තියෙනවනම් කරල තියෙනවා. ඒක නැතෙයි කියන්නෙ නැහැ. පාර ගලවගෙන යන නිසා ඉතාම ඉක්මනින් කුමක් හෝ පියවරක් ගන්න. මම කිව්වා ගලවගෙන යන එකට බැරල් ටිකක් හරි දාල දෙන්න කියලා. කිව්වා. ඒක නිසා ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ මොන පාරක් වුනත්, අපේ සභා පාරක්. ඒක නිසා මේක ඉතා ඉක්මනින් අදාල තැන්වලට දැනුවත් කිරීම කරලා, මොකක් හෝ ක්‍රමවේදයක් හදලා, පාර බැම්ම සකස් කරල දෙන්න කියලා ගෞරවණීය ඉල්ලීම කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

මන්ත්‍රීතුමා, හෝමදොල ප්‍රධාන පාර පිළිබඳව මම ආර් ඩී ඒ එකත් එක්ක කතා කළා. ඒක අපේ ප්‍රාදේශීය සභාවෙ පාරක් වුනාට අපට ඒක කර ගන්න අපහසුයි. මම එස් පී ආර් ඩී ඒ එකත් එක්ක කතා කළා. එදා ඔබතුමත් සංවර්ධන කමිටුවෙ හිටියා. ගරු මන්ත්‍රීතුමා, හෝමදොල ප්‍රධාන පාර සභා පාරක් වුනාට අපට කාපට් කරන කටයුතු කරන්න බැහැ. අපි ඒක අදාල ආයතනයට එක්කො ආර් ඩී ඒ එකට නැත්නම් පී ආර් ඩී ඒ එක හරහා කරව ගන්න ඕන. එතකොට සභාවෙ පාරෙ වුනාට සභාවෙන් නෙවෙයි කාපට් එක දැම්මෙ. ඒ වගේම පොලීසිය ලග පාර බලන්න තාක්ෂණ නිලධාරීතුමා ගිහිල්ලා, ඒ අවශ්‍ය කටයුතු කරලා තියෙනවා.

ගරු මන්ත්‍රීතුමා අයවැයෙන් පස්සෙ පාරෙ තණකොළ කැපිල්ල නවත්වයි කියලා ඔබතුමා කියන කතාවට මම සම්පූර්ණ විරුද්ධයි. අයවැයක් නිසා නතර කළේ නැහැ. ඒ මිනිස්සු හැමතැනම වැඩ. කරුණා කරල මම විරුද්ධයි ඔබතුමාගෙ කතාවට. ඔබතුමාලගෙ ඒ වැරදි වැටහීම්. මට පුලුවන් එහෙම නතර කරන්න. නමුත් මම එහෙම කරන්නෙ නැහැ වැරදි වැටහීම් දෙන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමන් ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ඒ වගේම අප අතරින් වියෝ වූ ගරු ආරියතිලක මැතිතුමන්ගේ අභාවයට අපට සම්බන්ධ වෙන්න බැරි වුනා. මම එදින කොළඹ සිටියේ. එම නිසා එම ශෝකයත් මේ මොහොතේදී ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලගෙ සංකල්පය යටතේ නිවාස ලබා දුන්නා. සෑම ග්‍රාම සේවා වසමකම නිවාස මම හිතන්නෙ දෙකක් හෝ

තුනක් නැත්නම් හතරක් පහක් ලබා දුන්නා. ඒ වගේම කමිටු හැදුවා. ඒ කමිටුවලට ජේන්නැති නිවසක් තියෙනවා. අප කුඹරුහේන වසමෙ ලැලි ගහපු ගෙදරක්. ඒ ලැලි ගහපු නිවසේ අම්මයි තාත්තයි දරුවො දෙන්නයි ඉන්නෙ. ඉතාම අසරණයි. ඒ දරුවො දෙන්නා පාසල් යන්නෙ ගා/මාපලගම මධ්‍ය මහා විද්‍යාලය.ට එක දරුවෙක් හත වසරෙ. එක දරුවෙක් නවය වසරෙ විදුලිය නැහැ. අනිත් එක තමයි සමෘද්ධියත් නැහැ. මේ අම්ම දලු කඩන්න යන ගෙදරට සමෘද්ධිය තියෙනවා. මේ අම්මට සමෘද්ධිය නැහැ. ඔන්න තත්වය. දවසක් මම මගේ දරුවා පාසලට ඇරලන ගමන්, මේ දරුවො දෙන්නා පාපැදියත් තල්ගගු කරන් යනවා. බයිසිකලේ පැච් එකක් ගිහින් තිබුනා. මම ඇහුවම, අනේ මාමෙ තල්ලු කරන්යනවා මේ ඉස්කෝලෙට යන්න පරක්කු වෙනවා. කියලා කිව්වා. බලන කොට ඇඳුම් ටික ඇත්තටම හොඳටම පොඩි වෙලා. ඒ කියන්නෙ ඉස්සරහ ගෙදරින් තමයි අයන් කරන් යන්නෙ. ඒ ගෙදර දොරවල් වහලයි කිව්වා. මට ඇත්තටම පුදුමාකර දුකක් හිතුනා. මම ඇවිල්ලා හවස් වරුවෙ මේ ගෙදර පොටෝ එකක් අරගෙන මුහුනු පොතේ දැම්මා. මුහුනු පොතේ දැම්මට පස්සෙ කොළඹ මහත්තයෙක් මට කතා කරල කිව්වා. අපි එනවා ඔය නිවස බලන්න. මොකක්ද වෙන්න ඕන කියලා . එතුමන් පසුගිය සතියෙ ආවා. විදුලිය ලබා දෙන්න කියලා රුපියල් 26000 ක චෙක් එකක් ලබා දුන්නා. මා මේ මොහොතෙ ස්තූතිය පුද කරනවා විදුලි බලමණ්ඩලයේ ගරු ඉංජිනේරු තුමන්ට. ඉංජිනේරුතුමා ඉතාමත් ඉක්මනින් ඒ නිවසට විදුලිය ලබා දුන්නා. දැන් ඒ දරුවො විදුලි ආලෝකය එලිය බලනවා. ඒක අපට ඇත්තටම සතුටුයි.

සමෘද්ධි නියාමකතුමන් ඔය කියන පෝම් එකක් දීල තිබුනා ඒ ගෙදරට. පොම් එක පුරවල දුන්නට පස්සෙ කියල තියෙනවා. ඔය ගොල්ලන්ට සුදුසුකම් නැහැ කියලා. ඒ පෝම් එකත් තියෙනවා මම ළඟ. ඔන්න තත්වෙ, ඔන්න තීරණය. මම අර ඉස්සෙල්ල කිව්ව වගේ යාන වාහන තියෙනවනම්, තට්ටු දෙකේ ගෙවල් තියෙනවනම්, කඩ තියෙනවනම්, සමෘද්ධිය ලැබෙනවා. එය ලොකු අසාධාරණයක්. ඒකයි අපි කියන්නෙ. මම ඒ ගැන ගියවර සම්බන්ධීකරණ කමිටුවෙත් කතා කළා. ඊට ඉස්සෙල්ලත් කතා කළා. තවම නැහැ සභාපතිතුමනි ඒකයි මම මේ කියන්නෙ . ගමේ කමිටු තියෙනවා. හැම දේම තියෙනවා ඒවට ඒ තොරතුරු ටික එන්නෙ නැහැ. ඔන්න ඕක තමයි හේතුව. ලැලි ගහපු ගෙයක් තියෙන්නෙ. මම මේ කියන්නෙ ඇත්ත කතාව. ඔන්න ඕකයි තත්වෙ. ඇත්තටම ගරු සභාපතිතුමා ඔබතුමා වුනත් ඔය කැබ් එකේ යන ගමන් පොඩ්ඩක් බලන්න නො: 20 පන්සල ලග තියෙන්නෙ. ඒ ගෙදර දෙන්න සියලුම සුදුසුකම් තියෙනවා. ඉඩමට ඔප්පුවක් තියෙනවා. ගරු සභාපතිතුමනි, ගෘහ මූලිකයක් තියෙනවා. දෙන්න බැරි ඇයි? ඔය කියන නිර්නායක ඒ නිවසට තිබුනනම්, එයාට සමෘද්ධිය නොලැබුනානම් ඔය කියන ඒව නොලැබුනානම් සම්පූර්ණ අසාධාරණයි. සමෘද්ධිය නැති අන්ත අසරණ පවුල් තුනක් තියෙනවා. ඔන්න ඕක තමයි තියෙන තත්වෙ මමනම් කියන්නෙ මේ කමිටුවලට දාලා මේව ඉදිරිපත් කරලා අසරණ පවුල්වලට පිහිට වෙන්න ඕන

ගරු සභාපතිතුමනි ඒ වගේම තමයි දියවර ගම්මානෙ පාර, ඔබතුමත් දන්නව ඇති. අපේ පියල් මන්ත්‍රීතුමත් දන්නවා. දැන් පාරෙන් පැත්තක තමයි යන්න පුලුවන් ඒ කියන්නෙ ප්‍රධාන පාරෙ බෝක්කුවක් ගැලවිලා ගිහිල්ලා, එතනින් දිය බුබුලක් එනවා. අපේ ගමට දලු ගෙනියන්න එවර්ග්‍රීන් ෆැක්ටෙරි එනවා. ඒ වාහනයක්වත් යන්න බැහැ. දියවර ගම්මානෙ කුඹුරුහේන පාර අපේ පැත්තට එනකොට හතරමං හන්දිය ලග තියෙන තැන එතනට මම බෝක්කුවක් ඉල්ලලත් තිබුනා. තවම නැහැ. බොහොම අමාරුයි යන්න. අනතුරු වෙනවා වැඩියි. ඒ කියන්නෙ එකම පැත්තට කෝච්චි යනවා වගේ එකම පාරෙ තමයි යන්න තියෙන්නෙ. පාර දෙකට කැඩිල තියෙන්නෙ. බෝක්කුවක් නැති නිසා යන්න විදිහක් නැහැ.

ඒ වගේම තමයි. ගරු සභාපතිතුමනි, ඉතාමත් කණගාටු සිද්ධියක් තියෙනවා. අපේ ගොවිජන මධ්‍යස්ථානයත් එක්ක ඒ කියන්නෙ අපි ඉස්සෙල්ලා, ලස්සනට පුරන් කුඹුරු අස්වැද්දුවා. අපට හොඳ ගොවි නියාමක තුමියක් හිටියා. එතුමිය අයින් කරලා දැම්මා. දැන් තමරා කියලා වෙනත් නියාමක තුමියක් තමයි පත් කරල තියෙන්නෙ. මේ පහුගිය දවස්වල එතුමිය ගිහිල්ලා, අපේ අල්ලපු ගෙදර බාප්පලයි ගෙදර මාලු වලක් තියෙනවා. මම හිතන්නෙ ඒ මාලුවල නීත්‍යානුකූලව තමයි කරගෙන යන්නෙ. ඒකට පස් දාල තියෙනවා. ඒක නීත්‍යානුකූල ක්‍රමයට ග්‍රාම නිලධාරිගෙන් සහතික අරගෙන සියලුම දේ කළා. මෙතුමිය කියලා තියෙනවා. අන්න ජේ වී පී එකේ මන්ත්‍රීතුමා තමයි ඔය 119 ට ගහලා ඕක නවත්වන්න හදන්නෙ කියලා තියෙනවා.

ඒ වගේම තවත් එකක් මතක් කරන්න ඕන. ගරු සභාපතිතුමනි, උඩවැලිවිටිතලාව ඉස්කෝලෙ ලග කසිප්පු ජාවාරමක් යනවා. අල්ලගෙන ගියත් නැවත ඒ බඩු ටික එතනටම යනවා. ඔන්න නිලධාරින්ගෙ තත්වෙ. ඒ එක නිලධාරියෙක් ඒ ගෙදරම බීලා, මම හිතන්නෙ කවුරු හරි ඔත්තුවක් දීල තියෙනවා. තවත් පොලීසියෙන් රෑනක් ගිහිල්ලා, අල්ලන්න හදන කොට එතුමා ඒ ගේ ඇතුලෙ ඉදලා තියෙනවා. ඔන්න ඔය වගේ තත්වයන් තමයි තියෙන්නෙ. නාගොඩ පොලීසියෙ ඔන්න තත්වය. මේ නාගොඩ ප්‍රදේශයේ අයිස් කියන වර්ගය තියෙනවයි බෙදා හරිනවයි කියලා කිව්වයින් පස්සෙ, සමහරු මෙතනදි හිනහ වුනා. ෆිජ් වහලයි කිව්වා. දැන් බලන්න ඉස්සරහට කොහොමද වෙන්නෙ කියලා. තනිකරම මේ වපසරිය ගත්තොත්, හොඳ බලධාරීන් තමයි තමයි අයිස් ගෙනැල්ල බෙදා හරින්නෙ අන්න ඒ වගේ ජාවාරම් තියෙනවා. ඇත්තටම අපට කණගාටුයි. ඉස්කෝලයක් ලග කසිප්පු විකුණනවයි කිව්වයින් පස්සෙ මම හිතන්නෙ ඒකට අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ එතුමන්ල සද්දයක් නැතුව හිටියට මම හිතන්නෙ එතුමා දැන් කියාවි මොකක්ද වෙන්න තියෙන්නෙ කියලා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ මේ ජාතික ගැටලුව ගැන අපි කතා කරන්න දෙයක් ඉතුරු වුනේ නැහැ. අපේ ගරු විදුහල්පතිතුමා පැහැදිලි කළා. ඔය බඩු මිල සහ ඒ සියලුම දේ ගැන. මම හිතන්නෙ ඇත්තටම අපට දැන් දරා ගන්න බැරි තත්වයක් තමයි උදා වෙලා තියෙන්නෙ. එතුමන් කිව්වෙ, අපි ආණ්ඩුවෙ හිටියත්, මෙන්න මේ දේ අපට ඇහෙනවා. ඇත්ත ඔන්න ඕක තමයි. අපට තියෙන ප්‍රශ්නෙ තමයි මෙන්න මේ ගැටලු ටික නිරාකරණය කර දෙන්න කියලා තමයි. ගරු සභාපතිතුමන්ගෙන් ඉල්ලා සිටින්නෙ එම නිසා ගරු සභාපතිතුමනි තව වැඩිදුර කතා කිරීමට තිබුනත් ඔබ සියලු දෙනාටම ජය වේවා යි ප්‍රාර්ථනා කරමින්, මා මේ මොහොතේ කතාව අවසන් කරනවා

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, මේ අවස්ථාවෙ මේ ප්‍රදේශයේ 326 කුට නොමිලේ රජයෙන් විදුලිය ගන්න අද කටයුතු කරනවා. ඔබතුමා ප්‍රකාශ කල සමෘද්ධිය නොලැබී ගිය දුගී නිවස ගැන කතා කරනවනම්, ඔය කියන නිර්නායක ඒ නිවසට තිබුනනම්, එයාට සමෘද්ධිය නොලැබුනානම් ඔය කියන ඒව නොලැබුනානම් සම්පූර්ණ අසාධාරණයි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමා සහ මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම අවසරයි. සභාපතිතුමනි, මට කතා කරන්න අවශ්‍ය වෙන්නෙපුස්තකාල සම්බන්ධව. පුස්තකාල ප්‍රසම්පාදන කමිටුවෙ අපි පහුගිය දවස්වල රැස් වුනා. මීට පෙරාතුව රැස්වුන කමිටුවෙදිත්, අපි ඉදිරිපත් කරපු යෝජනා, ඉල්ලීම් ඉටු වෙලා තිබුනෙ නැහැ. ඒක නිසා ඔය මේ පාර ඉදිරිපත් කරපු ඔය යෝජනා ටික පිළිබඳව පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න කියන එක සිහිපත් කරනවා

ඒ වගේම උඩුගම අපේ වෙරංග මන්ත්‍රීතුමා සඳහන් කළා. බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා පුස්තකාලයේ සිටින තුන් දෙනා ඇති කියන එක. තුන් දෙනා ඇති. නමුත් මම ඔබතුමාගෙන් අහන්නෙ මම දන්නෙ නැහැ එතන සිටි මුරකරුවෙක් විශ්‍රාම ගිහිල්ලද කියලා.

නැත්නම් රාත්‍රී කාලයේදීවත් යතුර එතුමාට භාර දෙන්න කියලා මම කියන්නෙ. මොකද පුස්තකාලයේ වගකීමක් තියෙනවා. දැන් අපි පුස්තකාල කමිටුව හැටියට කතා කරන කොට, යම් පාඨකයෙක් ඇවිල්ල ඉදිද්දි එතනින් යන්න බැහැ මොකද යම් පොතක් නැති වුනෝතින්, ගැටළුවක් තියෙනවා. එතකොට දැන් පුස්තකාලයේ තුන්දෙනෙක් ඉන්නවලු. ඒ කටයුතු පිළිබඳව හොයන්න බලන්න කියලා යම් එක්කෙනෙකුට භාර දුන්නනම්, මම හිතන්නෙ එතකොට පුස්තකාලෙ වගකීම අනිත් දෙන්නට කර ගන්න පුලුවන්. ඒක නිසා ඒක කළමනාකරණය කිරීම කරන්න ඕන.

ඊලගට ජලය පිළිබඳ ප්‍රශ්න මාපලගම සහ උඩුගම පුස්තකාල දෙකටම තියෙනව දැන් අපි මේ ජංගම පුස්තකාලය පිළිබඳවත් සාකච්ඡා කළා. මේ සභාවෙ මීට පෙරාතුව ඒ ජංගම පුස්තකාලය පිළිබඳව හොද කතිකාවක් මාතෘකාවක් වෙලා තිබුනා. ඒව නතර වුනේ කාගෙන්ද කින්ද මන්ද කියන එක මට අදාල නැහැ. හැබැයි පුලුන්නම් අපට මේ වෙලාව වෙන කොට දැන් ගෙවල්වලට වෙලා මිනිස්සු කොටු වෙන්න ඕන වෙලාවක, පාඨකයා අපට රැක ගැනීමට අවශ්‍යතාවයක් තියෙනවා. මොකද පුස්තකාලවල දැනට රැදී සිටින්න අවස්ථාව දීල නැහැ. ඒව පිළිබඳව පොඩ්ඩක් කතා කරලා, ඒ අය දැනුවත් කරලා, පුස්තකාලයක රදවා ගැනීමට හැකි පිරිස කොහොමද කියන එක පිළිබඳව ඒ අයට උපදෙස් ලබා දෙන්න. මොකද නැත්නම් නිලධාරීන්ට යම් කෙනෙක් ගෙන් දෝශාරෝපන එන්න පුලුවන්. නිලධාරීන් හැටියට දැන් 10 දෙනෙක් තියා ගත්තොත් එක තියා ගත්තෙ කාගෙන් අහලද කියන එක අහන්න පුලුවන්. ඒක නිසා ඒ අයව දැනුවත් කරලා, එතන තියා ගන්න පුලුවන් පසුබිම බලලා, ඒ ඉඩ ප්‍රමාණය බලලා, අපි සභාව පවත්වාගෙන යනව වගේම, අපේ පාඨකයන් රැක ගැනීමට ඒ පිළිබඳව සාකච්ඡා කරන්න කියන එක මම සිහිපත් කරනවා. ඒ වගේම ඔබට පුලුවන්නම් සභාපතිතුමනි , මම හිතන්නෙ ලොකු දෙයක් වෙනවා මොකද අපේ තිබුන ඒ ජංගම පුස්තකාලය නැවත ස්ථාපිත කරන්න. මම හිතන්නෙ උඩුගම අපේ ගබඩාවෙ ඇති. ඒක නැවත අලුත් වැඩියා කරලා, නැවත ඒ ක්‍රමවේදය ඇති කළොත් හොදයි කියන එක තමයි. අපි ඉදිරිපත් කරපු යෝජනාවල ඇත්තෙ .

සභාපතිතුමනි අපි ඊළඟට ජයවීර මන්ත්‍රීතුමා සඳහන් කළා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට දෝශාරෝපනයක් ඉදිරිපත් කලා. මන්ත්‍රීතුමනි, වැඩ කරන නිලධාරියාට කොහෙත් එක වෙන්න ඕන. එයාගෙ තනතුරත් එක්ක කොයි ගොවිජන සේවා බල ප්‍රදේශෙද යන්න අදාල නැහැ. එතනදි මට යම් වගකීමක් පැවරුනේ නාගොඩද, ගාල්ලෙද කින්ද මන්ද මට වැඩක් නැහැ. මගේ දක්‍ෂතාවය තියෙනවනම්, කුඹුරු එලි කිරීමේ ඒ කටයුත්ත කරන්න ඕන. ඉතිං ඔබතුමන්ලට පැමිණි නිලධාරියා, එයාගෙ දක්‍ෂතාවය තිබුනනම්, එයා වෙන තැන් වලින් ඉන්ටඩික් කරලා එවන්නෙත් නැහැ. ඉන්ටඩික් කරලා නැවත ජොබ් එක හදාගත්ත නිලධාරිනියක්. ඔය කතාව මට අනවශ්‍ය දෙයක්. හැබැයි එතුමියට ඔබතුමාට විතරක් සහයෝගය දක්වගෙන ඔබතුමත් එක්ක විතරක් ගමනක් යන එකට ඒ ගොවි සංවිධාන කැමති නැහැ. එතකොට ගොවි සංවිධානයක් ගමේ නිර්මාණය වෙලා තියෙන්නෙ ගොවි ජනතාවගේ කැමැත්ත මත. එතකොට මන්ත්‍රීවරයෙක් නිර්මාණය වෙන්නෙ දේශපාලනික කැමැත්ත මත. හැබැයි ගොවියන්ගෙ කැමැත්ත මත ගොවි සංවිධානයක් නිර්මාණය වෙනවනම්, ඒ ගොවි සංවිධානයේ කැමැත්ත ඇතුව තමයි සියලු කටයුතු සිදු වෙන්න ඕන. එහෙමනම් ගරු සභාපතිතුමනි, එතකොට ගොවි සංවිධානය පැත්තකට දාලා දේශපාලන අධිකාරියත් එක්ක යන නිලධාරීන් වැඩක් වෙන්නෙ නැහැ. එතකොට මම පත්වෙලා ඉන්නෙ, ගොවි සංවිධානවල ඒ තැන්වලදි ඒ හඩ නගන්න තමයි. මම ඒ ගොවි සංවිධාන 21 ක එකමුතුවකින් තමයි මම සභාපතිවරයා කරල තියෙන්නෙ. ගොවි ජන සේවා බල ප්‍රදේශයටම එතකොට මම තමයි තීරණය කලේ ඒ නිලධාරියා ගොවි ජනතාවට පොහොර ටික ලබා දෙන්නෙ නැත්නම්, එතකොට එයාගෙ

ලේඛන හඳුන්නෙ නැත්නම්, ඒක නිසා වෙන තැනකට මාරු කළා. දැන් එතුමියට තව ටික දවසක් යන කොට වෙන දේත් බලා ගන්න පුලුවන් වේවි. මොකද එතුමියට රාජකාරි කිරීමේ අවස්ථාව නැහැ. නැවත ගිහිල්ලා ඒ ප්‍රදේශයේ ඒකට වෙන නිලධාරියෙක් පත්කරල තියෙනවා. එතකොට ඒ ආපු නිලධාරියත් එක්ක එකතුවෙලා, ඔබතුමා දක්ෂ ගොවියෙක් හැටියට සහ ප්‍රදේශයට උදව් කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම ඔබෙන් ඉල්ලා සිටිනවා. ඒ අලුතෙන් ආපු නිලධාරීතුමියත් එක්ක එකතුවෙලා මොකද එතුමියටත් වැඩ කරන්න පුලුවන්. එතුමියටත් අවශ්‍ය කරන පහසුකම් ඒ සියල්ලම අපි ලබා දෙනවා. එහෙමනම් එතුමිය ඔබගේ පැත්තට හරවගෙන, එතුමියත් එක්ක හොඳ ගමනක් යන්න කියලා මම ඔබට සිහිපත් කරනවා.

තව කියන්න ඕන මන්ත්‍රීතුමා, මේ රජය තවම කිසි කෙනෙකුට සමෘද්ධිය දුන්නෙ නැහැ. ලක්ෂ හයකට එහා ගියපු සමෘද්ධිය දීලා, දැන් ලංකාවෙ සමෘද්ධි ලාභීන් වැඩි වෙලා තියෙනවා. නමුත් දැන් සමෘද්ධිය කප්පාදු කරන්න සිදු වෙලා තියෙනවා. නමුත් ඒකත් අපි නවත්වගෙන ඉන්නවා. දැන් ඔබතුමා කියන එක මම පිළිගන්නවා මොකද ඒ ගේ ඇයි පැත්තකට ගියේ කියන එක. හැබැයි මගේ කොට්ඨාසෙම තියෙනවා වාහන තියෙන ටැක්ටර් තියෙන, තේ ඉඩම් තියෙන විශාල පිරිසකට සමෘද්ධිය ලබා දීල තියෙනවා. ඒ අසාධාරණ කම තියෙනවා. හැබැයි මම දන්නෙ නැහැ. මේ සමෘද්ධිය කප්පාදු කරනවට අපේ කීපදෙනෙක් අකමැතියි. ගරු සභාපතිතුමනි, මම දකින්නෙ මෙහෙමයි. අපි යම්කිසි කෙනෙක් පත් කරගෙන තියෙනවනම්, කමිටු තියෙනවනම්, කමිටුවට ගෙන්නල අනිවාර්යෙන්ම සමහර විට කමිටුවටවත් එන්න කැමති නැති මිනිස්සු ඉන්නවා. සමෘද්ධිය ගන්න ලැජ්ජයි. එතනට එන්න ලැජ්ජ මිනිස්සු ඉන්නවා. අපට මොන දේ වුනත් කමක් නැහැ. ඒක නිසා ඒ අය ගෙන්නලා මම නම් කියන්නෙ ඒ ඔක්කොම නම් කපල දානවනම් හොඳයි. කපල දාලා අර වගේ අහිංසක මිනිස්සු ඉන්නවනම් සමෘද්ධිය ලබා දෙන්න ඕන. ඒ පිළිබඳව සිහිපත් කරමින්, මම නිහඩ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු සභාපතිතුමා**

උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානයේ ගැටළුවේදී දිවා කාලයේ හිටපු සේවකයා එයා දැන් විශ්‍රාම පූර්ව නිවාඩු ගිහිල්ලා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. අපේ මේ ධර්මසිරි මන්ත්‍රීතුමා කිව්වෙ. ඒක වෙන පැත්තකට ගියේ. මම කිව්වෙ මෙන්න මේ ගොවි නියාමක කෙනෙක් අපට අලුතෙන් පත්වෙලා ඇවිල්ල තියෙනවා. තමරා කියලා. එතුමිය තමයි කියල තියෙන්නෙ, පස් ගොඩ කරන තැනක මම තමයි විරුද්ද වෙලා, 119 ට ගැහුවෙ කියලා. මම අහන්නෙ එතුමියට අයිතියක් තියෙනවද බොරුවක් කියන්න. රාජ්‍ය නිලධාරියෙකුට එහෙම පුලුවන්ද? මම කියන්නෙ මේක අසාධාරණයක්. සභාපතිතුමනි, මම කියන්නෙ පොහොරවල කතා අපට වැඩක් නැහැ. රු 12 ට පොහොර පටවපුව ගැන මම ඒව මොකුත් කතා කළේ නැහැ. සභාපතිතුමා එහෙම 119 ට ගැහුවමයි කියන්න එහෙම නිලධාරියෙකුට අයිතියක් තියෙනවද? අසවල් ගෙදරට ගිහිල්ල කියන්න මෙන්න මෙහෙමයි කියලා භේද භින්න කරන්න බැහැ. අන්න ඒක මම කියන්නෙ අසාධාරණයක් මේක. ඒ ගෙදරට කිව්වයින් පස්සෙ කිව්වලු නැහැ නැහැ ජයන්ත අයිය එහෙම වැඩ කරන්නෙ නැහැ කියලා. මේ මගේ මල්ලිගෙ ගෙදරට ගිහින් කියල තියෙන්නෙ එයා දන්නෙ නැහැ මම එයාලගෙ කවුද කියලා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම විශේෂයෙන් රංජිත් ජයවීර මන්ත්‍රීතුමාගෙ ප්‍රශ්න කීපයට උත්තර ලබා දෙන්න කැමතියි. මම දැන් මේ අවස්ථාව වන විට කුඹුරුහේනෙ වසමෙ වැඩ කරන, අපේ සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමාගෙන් දුරකතන ඇමතුමක් දීලා මම ඇහුවා. ඇත්තදැයි මේ විදුලි බලය පිළිබඳ කතාව කියලා. එතකොට එතුමා කිව්වා ඒ නිවසට දින දෙකක් ඇවිල්ලා තියෙනවා. ඇවිල්ලා අල්ලපු ගෙදරට ඉල්ලුම් පත්‍රය දීලා, පුරවන හැටිත් කියා දීලා, අර ගෙදරට දැනුම් දෙන්න කියලා. ඒ වහපු ගෙදර දුරකතන අංකෙත් අරන් ගිහිල්ලා. එතකොට ඒ ඉල්ලුම් පත්‍රය තවම තියෙනවලු අර ගෙදර. ඉල්ලුම්පත්‍රය පුරවලා මොකුත් කරල නැහැ. ඔය කියන වචනෙ කිව්වෙ නැතිලු. සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමා මට දැන් දැනුම් දුන්නා. සමෘද්ධි සංවර්ධන නිලධාරී, ගාමිණී මහත්තයගෙන් මම දැන් ඇහුවෙ. එතුමා කියනවා මේ නිවසේ අය මේ සම්බන්ධව ගණන් ගත්තෙ නැතිලු. අඩු ආදායම් ලාභීන්ට මේ වැඩසටහන යටතේ විදුලිය ලබා ගැනීමට සමෘද්ධිය අවශ්‍ය නැහැ. මේ වැඩ සටහනට අඩු ආදායම් ලාභී කෙනෙකුට විදුලි බිලටවත් අය කිරීමක් නොමැතිව විදුලිය නොමිලෙ ලබා දෙනවා. ඒ සඳහා ඉල්ලුම් පත්‍රය රැගෙන ඇවිත් තියෙනවා දින දෙකක් අල්ලපු ගෙදරට දීල තියෙනවා. දීල අදාළ නිවසේ දුරකතන අංකයත් අරගෙන ගිහිල්ලා, දුරකතන ඇමතුමකුත් ලබා දීලා තියෙනවා. ලබා දුන්නම, එයාල සැහැල්ලුවට අරගෙන කතා කරලා. හේතුව තමයි එහෙම වෙලා තියෙන්නෙ ජයවීර මන්ත්‍රීතුමා මම හිතන්නෙ කලින් විදුලිය ලබා දෙන බවට අර කොළඹ ආයතනයක කවුරු හරි කතා කළ ඒකත් එක්ක මේ අය ගණන් අරගෙන නැතුව ඒව සැහැල්ලුවට ලක් කරලා දැන් ගාමිණී මහත්තය මාත් එක්ක කතා කරල කිව්වා.

අනිත් එක තමයි නිවස ගැන විශේෂයෙන් නිර්ණායක ටිකක් තියෙනවා. ඒ නිවසෙ බිම සිමෙන්ති දාල තියෙන්නෙ. මට ඒක අදාල නැහැ. එතකොට ගඩොල් පේළියකුත් බැඳලා, ඊලගට ලෑලි ගහල තියෙන්නෙ. එතකොට සමෘද්ධි සහනාධාරය ලබා දීම සඳහා පොරොත්තු ලේඛනයේ නම තියෙනවා. ඔය සියල්ලම වෙලා තියෙන්නෙ. ඊලගට සමෘද්ධි සහනාධාරය ලබා දීම සඳහා ලේඛනයක් හදල තියෙනවා. ඒක හදල තියෙන්නෙ සමෘද්ධි සංවර්ධන නිලධාරි විතරක් නෙවෙයි අනිත් කෘෂි පර්යේශන නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, පවුල් සෞඛ්‍ය සේවා සහ ග්‍රාම නිලධාරී ඒ ලේඛනයේ නම තියෙනවා. අර නිවස ලබා දෙන්න බැරි නිර්නායක ටිකක් තියෙනවා. ඒ නිවසක පිංතූරයක් යවන්න ඕන කොළඹට. එතනදි බිම සිමෙන්ති දාල තියෙන්න බැහැ. ගඩොල් පේළියක් තියෙන්න බැහැ. ලෑලිවලින් තියෙනවනම් නිවස සාධාරණයි. වහල උලු වලින් හෙව්වත් කමක් නැහැ. ඒ නිර්නායක ටිකට පටහැනිව තමයි නිවස තියෙන්නෙ. ඇත්තටම ඒ ගෙදර අඩු ආදායම් ලාභී බව මම පුද්ගලිකව දන්නවා. මේකට කරන්න විකල්පයක් නැහැ. වෙන එහෙම තියෙනවනම් දෙන්න පුලුවන්. ඒක දැන ගන්න ඕන නිවාස සංවර්ධන අධිකාරියෙ මහත්තයෙක් ගෙන් ඇහුවොත් දන්න කෙනෙක් ඉන්නවනම් දෙන්නෙ නැහැ. ඒ ගෙදරට විදුලිය සම්බන්ධව සිද්දියෙදි මෙතුමා ජයවීර මන්ත්‍රීතුමා ඉස්සර වෙලා ඒ වැඩේ කරන්න යෝජනා කළ නිසා ඒ අය සැහැල්ලුවට අරගෙන, ඉල්ලුම් පත්රයත් එහෙමමයි. ඊලගට සමෘද්ධි සහනාධාරය පොරොත්තු ලේඛනයේ තියෙනවා. ජයවීර මන්ත්‍රීතුමා කියල තියෙනව අපි ලයිට් දෙනවයි කියලා. ඒ නිසා තමයි සැහැල්ලුවට අරගෙන තියෙන්නෙ.

මම මේ ඔබතුමාට සමෘද්ධි සහනාධාර ලේඛනය, අනිත් නිලධාරි අත්සන් කරපු පොරොත්තු ලේඛනය ඊලග සභා වාරයට ගෙනැල්ලා පෙන්නන්නම්. ඔය ආයෙත් ඉල්ලුම් පත්‍ර කැඳවීමක් කරන්නෙ නැහැ. විදුලිබලය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අද තමයි ක්‍රියාත්මක වෙන්නෙ.

අනිත් එක මේ ඔය කෘෂි පර්යේෂන නිලධාරි ප්‍රශ්නෙදිත්, මම දන්නවා. ඔය සිද්දිය සිදු වුන හැටි. ගොවි සංවිධානයක් තියෙද්දි, හිටපු නිලධාරී මහත්මිය පනත ගැන දැනගෙන, නැවත ගොවි සංවිධානයක් පිහිටෙව්වා. ඊට පස්සෙ ගොවි සංවිධානෙ පිහිටෙව්ව විතරක් නෙවෙයි මෙතුමා එක මුරයක් මේ සභාවට අලුත් සහල් මංගල්‍යයට ආරාධනාවක් කරල තිබුනා. මටත් පෙන්නුවෙ

සභාපතිතුමා. මෙතුමා ඒ ආරාධනය එවල තියෙන්නෙ. ප්‍රාදේශීය සභාවෙ ලිපි ශීර්ෂයක. එහෙම එවන්න බැහැ. ලියුම තවම ඇති මම ළඟ. මම ඕන්නම් එකත් ලබන සභාවෙ පෙන්නන්නම්. එතුමාගේ ප්‍රශ්නවලට මම උත්තර ලබා දුන්නා බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා**

ගරු සභාපතිතුමනි, මට පොඩි කාරණාවක් සම්බන්ධයෙන් දැන ගන්න තියෙන්නෙ. කැටගොඩ පාලමේ ලැල්ලක් ගැලවිලා ලොකු අවදානම් තත්වයක් තියෙනවා කියලා ඔබතුමාට පහුගිය දවස්වල දැනුම් දුන්නා. දිනපතා කාන්තාවන් ස්කූටර් වලින් වැටෙනවා. ස්කූටරයක ඉදල දරුවෙක් ගගට වැටිලා අනතුරක් වුනොත්, අපි ඔක්කොම ඉවරයි. ඒ නිසා ඕක දැනුම් දීලත් ගොඩක් දවස්. ගරු සභාපතිතුමා ඒ අදාල ආයතනවලට ඔබතුමා එදා ලියුමක් යැව්වා. මමත් හිටියා ඒ අවස්ථාවෙ. මම හිතන්නෙ ඒ අයගෙන් කෙරෙන්නෙ නැත්නම්, අපි හරි ඉක්මනට ඒ අදාල නිලධාරියෙක් යවලා, ඒ අදාල කටයුතු හැකි ඉක්මනින් කරන්න පුලුවන්නම් හොදයි කියලා මම හිතනවා. ඔබතුමා ඒ ගැන අවදානය යොමු කරලා, ඒ අවශ්‍ය කටයුතු කරන්න.

ඒ වගේම තමයි. මත් ද්‍රව්‍ය ගැන කතා කළා. ගරු සභාපතිතුමනි, නාගොඩට පොලීසියක් තිබුනනම් මත් ද්‍රව්‍ය තියෙන්නෙ නැහැ. පොලීසියක් නැති හින්ද තමයි මත් ද්‍රව්‍ය තියෙන්නෙ. මේ කසිප්පු නිසා අපේ ප්‍රදේශයේ ලොකු ගැටලු රාශියක් නිර්මාණය වෙලා තියෙනවා. ඉතිං ඒ සියලු දේකට, අපට පුලුවන්නම් සිගරට් එකේ බීඩියෙ ඉදලා, මේ ප්‍රදේශ වලින් ඔබේ බලය පාවිච්චි කරලා නවත්වන්න, මම හිතනවා හොඳයි කියලා. මොකද දැන් සිගරට්වල ගණන් නිසා මේ අවුරුදු 15 16 17 18 වේ කොල්ලොත් බීඩි මිටි ගණන් අරගෙන ගිහින් බොන්නෙ. ඉතිං ඒ වගේ සෝචනීය තත්වයක් තියෙන්නෙ. මම හිතන්නෙ ගරු සභාපතිතුමනි, ඔබතුමාට යම් බලතලයක් තියෙනවා. සමහර ප්‍රාදේශීය සභාවල ක්‍රියාත්මක වෙලා තියෙන.වා මේ වෙන කොට මම හිතන්නෙ අපි මේ සභාවක් හැටියට මේ 27 දෙනත් එක්ක පුලුවන්නම්, ඒ මත් ද්‍රව්‍ය සිගරට් බීඩි වගේම අනිත් දේවල්නම් කොහොම වේද දන්නෙ නැහැ. අඩු ගානෙ ඒකවත් නවත්වන්න අවශ්‍ය කටයුතු කරනවනම්, මේ සභාවක් හැටියට මම හිතනවා ඒක හොදයි කියලා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ 27 දෙනාම එකතු වෙලා හරි, පුලුවන්නම් ඒ කියන්නෙ මොන ජාතියෙ කෙනෙක් හම්බ වෙලා හරි ,මේ ඉන්න නිලධාරීන් අයින් කරලා හරි, නිලධාරී ටිකක් දාලා, අපි 27 දෙනා එකතු වෙලා හරි, ක්‍රියාමාර්ගයක් ගන්නන ඕන. මම කියන්නෙ මේක අපේ කාලයේ විතරක් නෙවෙයි ගරු සභාපතිතුමා ගිය ආණ්ඩුව කාලෙත් එකයි. මේ ආණ්ඩුව කාලෙත් එකයි. ගිය ආණ්ඩු කාලෙට වැඩිය මේ ආණ්ඩු කාලෙ ඊට වැඩිය සරුවත්ව කරනවා. ඒ කරන්නෙත් ඒ කරපු අයමයි. තව කට්ටිය එකතු වෙලා විශාල ප්‍රමාණයක් තරුණයො විනාශ වෙලා තියෙනවා මේකෙන්. ඉතිං ඉදිරියටත් මේ කටයුත්ත දිගටම කෙරෙනවනම්, අපට අනාගතයට ජව සම්පන්න තරුණ පරපුරක් අනාගතය භාර ගන්න ඉන්න පිරිසක් නැතිවෙනවා. ඒ කියන්නෙ දැනටත් අවුරුදු 30 35 වෙන කොට වෙව්ලන පිරිසක් ඉන්නවා. ඉතිං තව කාලයක් යන කොට මේ අවුරුදු 17 18 පුද්ගලයන් ඒ මත් ද්‍රව්‍ය භාවිතා කරන කොට ඒ ගොල්ලො තව අවුරුදු 10 ක් යන කොට කොතනද මේ සමාජෙ තියෙන්නෙ. ගරු සභාපතිතුමනි, ඊලගට මනස විකෘති වෙච්ච පිරිසක් නිර්මාණය වෙන්නෙ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ මොන සංවර්ධනය කළත් වැඩක් නැහැ. පාරවල් කාපට් කරලා, කොන්ක්‍රීට් කරලා, ගෙවල් හදලා දීල මොන දේ කළත් වැඩක් නැහැ. මේ තරුණ ජවය රැක ගන්න අවශ්‍ය කටයුතු මේ සභාවක් හැටියට අවශ්‍ය කටයුතු නොකළොත්, අපි ජේල් කියල තමයි අපිටත් කියන්න වෙන්නෙ. ඉතිං ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ අපට තව වැඩි කාලයක් නැහැ. ඒ කාලය ඇතුලතවත් මේ වගේ දෙයක්වත් කරලා, මේ සභාවෙන් එලියට යන්න තියෙනවනම් වටිනව කියල මම ඔබතුමාට මතක් කර සිටිමින්, ඔබතුමාටත් කරන්න පුලුවන් මොන විදිහෙන් හරි මේවට

සම්බන්ධ වෙලා මේ විසමාචාර ක්‍රියා නවත්වන්න කටයුතු කරන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. සභාපතිතුමා පළමුවෙන්ම කියන්න ඕන. මේ විදිහට පුටු දාල තියෙන්නෙ, මේ දුරස්ථ භාවය ආරක්‍ෂා කරන්න නම් ඒක වඩාත්ම අසාර්ථකයි. අපි වෙනද වගේ ඩෙස් දාල වාඩිවෙලා ඉන්නවනම්, දෙපැත්තෙ ඉන්න දෙන්න විතරයි. මෙහෙම අසුන්ගෙන සිටින විට පිටි පස්සෙන් බලන විට, ගොඩක් අවලස්සනට පේනවා. මොකද අපේ මාධ්‍ය වේදීන්, මහජනතාව සභාවට එනවා.

ඩෙස් දාල තියෙනවනම්, අපි දෙපැත්තෙ ඉන්න දෙන්න විතරයි කතා බහ වෙන්නෙ. ඒ වගේම අපේ මන්ත්‍රීවරියන් දෙන්නෙක් අපේ කාන්තා දින සැමරුම ගැන කතා කළා. මමත් එක්සත් ජාතික පක්‍ෂය වෙනුවෙන් අපේ සිරිකොත මූලස්ථානයට ගිහිල්ලා, කාන්තා දිනය සැමරුවා. මොකද අපේ මන්ත්‍රීවරියන් හත් දෙනෙක් අද මෙතන නියෝජනය කරන්නෙ එක්සත් ජාතික පක්‍ෂය අපට ලබා දුන්න ඒ නියෝජනයත් එක්ක. මේ වෙලාවෙ ඒක ඇගයීමක් කරනවා.

ඒ වගේම බොහොම කණගාටුයි එක්සත් ජාතික පක්‍ෂය කාන්තාවන්ට ලබා දීපු තැන මේ වෙන කොට අහිමි වේගෙන යනවා. අවම වශයෙන් කාන්තාවන්ට තිබුන අමාත්‍යාංශය පවා කාන්තාවගෙන් මේ වෙන කොට උදුරගෙන තියෙනවා. ඒ වගේම අපේ මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා වුනත් කාන්තාවන් වෙනුවෙන් මොනම දෙයක් තිබුනත්, මහජන නියෝජිතවරියන් විදිහට අපට කිසිම දැනුම් දීමක් කරන්නෙ නැහැ. මොනම දෙයක් මේ කොට්ඨාසය තුල ක්‍රියාත්මක වුනත් ඒ වගේම තමයි. ස්වයං රැකියාවන් කරන අයට මේ වෙන කොට කිසිදු සහනයක් නැහැ. වර්ථමානය වෙනකොට කාන්තාවන් ගොඩක්ම අසරණ වෙලා තියෙනවා. බෙල්ල කපලා ඊයෙ පෙරේද කාන්තාවක් ඝාතනය වෙන කොට පොලීසියට ඇමතුම් 200 කට වැඩිය එනවා. කාන්තාව මේ අපේ දුවද, මගේ බිරිඳද කියලා. එතකොට මම හිතන්නෙ ලොකු අවබෝධයක් තියෙනවා කොච්චර කාන්තාවන් ප්‍රමාණයකට මේ වගේ සිදු වීම් වෙනවද කියලා. මම කියන්නෙ කාන්තාවන්ට ආරක්‍ෂාවක් නැති වෙලා තියෙනවා. ඒ සිද්දිය ගැන නෙවෙයි මම කියන්නෙ. එතන යටින් තිබුන අදහස. ඇමතුම් 200 කට වඩා එනවා අපේ කාන්තාවො නැහැ කියලා. මම මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. සියලු දෙනාටම ස්තූති වන්ත වෙනවා

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමිය කියන එක මම සර්ව සාධාරණව පිළිගන්නවා. යම් ගැටලු කාරී තත්වයක් මේ කොවිඩ් වසංගත තත්වය නිසා උදාවෙලා තියෙනවා. මේ මන්ත්‍රීවරුන් උගතුන් පිරිසක්නෙ ඇවිල්ල ඉන්නෙ. තම තමන් දැන ගන්න ඕන. මම මේ දැන් හිතෙන් කල්පනා කළේ චාරිකාවක් යන්න නෙවෙයි. වෙන ප්‍රාදේශීය සභාවක් හෝ පළාත් සභාවක් තියෙන අවස්ථාවක මන්ත්‍රීවර එක්ක ගිහිල්ලා, සභාවක් පවත්වන ආකාරය සහ නීති රීති පිළිපදින ආකාරය පිළිබඳ දැනුවත් කරන්න ඕන. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්න මන්ත්‍රීතුමියක් කතා කරන කොට බාධා නොකර, කතා කරන්න ඉඩදෙන්න.

**ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා**

ගරු සභාපතිතුමනි සියලුම මන්ත්‍රීවරුනි, ලේකම් තුමිය ඇතුලු සියලුම දෙනාගෙන් අවසරයි. 1992 මේ සභාවට පත්වෙච්ච පළවෙනි සභාපතිවරය හැටියට යූ ජී ඩී ආරියතිලක මැතිතුමාගෙ අවසන් කටයුතු සිදු වුනා. ඒ පිළිබඳව අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරනවා. මන්ද අප ප්‍රදේශයට ඉමහත් සේවාවක් කරපු, දේශපාලන වශයෙන් මොන මතයක් දැරුවත්, පෞද්ගලිකත්වය බොහොම

ඉහලින් ගරු කරපු පුද්ගලයෙක්. මහත්මයෙක් හැටියට යටලමත්ත ප්‍රදේශයට බොහොම සේවාවන් කළා. පාරවල් ටික හදල දුන්නා. අපට විශේෂයෙන් දුෂ්කර පාලමක් දාල දුන්නා. අපේ විජිත් මහත්මය මන්ත්‍රීතුමාලගෙ නිවස කිට්ටුවම ඉහල කටපෝද්දුව පාලම දාල ලොකු සේවාවක් කළා. ආරියතිලක හිටපු අමාත්‍යතුමාගේ අභාවය වෙනුවෙන් අපේ සාතිශය සංවේගය ප්‍රකාශ කරනවා.

ඒ වගේම මාපලගම අපේ ගයාන් මන්ත්‍රීතුමා කිව්වා. අපහාසක් කරනව නෙවෙයි. මන්ත්‍රීතුමා රාජ්‍ය යාන්ත්‍රනයේ තියෙන තත්වය ඔබට පේනව ඇති. අපිත් යම් වෙලාවක ඕකට අහුවෙලා හිටියා. ඕකට යම්කිසි වගකීමක් දරන්න ඕන. රනිල් වික්‍රමසිංහ මැතිතුමත් එක්තරා විදිහකට රාජ්‍ය සේවා කොමිසම ගෙනැල්ලා, ඒව හොඳ දේවල් නමුත් ඒකෙන් ඉහලට ගිහිල්ලා, නමුත් අද අපහසුතාවයන්ට පත්වෙන වෙලාවල් තියෙනවා. මහජන නියෝජිතයො එහෙම නැත්නම් මුලු ලංකාවෙම ජනතාවත් ඕවට අහුවෙලා තියෙනවා. ඒ පොදු ජනතාව වෙනුවෙන් උත්තර හොයනවට වඩා රාජ්‍ය සේවය වෙනුවෙන් උත්තර හොයන කොට, එතුමන්ල අපට වඩා බල සම්පන්න වෙලා තියෙනවා. මන්ත්‍රීවරයෙක් හොඳ නැත්නම් අවුරුදු පහෙන් ගෙදර යවන්න පුලුවන්. හැබැයි රාජ්‍ය සේවකයෙක් වැරැද්දක් නැත්නම් ගෙදර යවන්න පුලුවන් අවුරුදු 60 සම්පූර්ණ වුනාම විතරයි. මොකද වැරැද්දක් නොවෙන විදිහට ඔවුන් වැරදි කරනවා. අපේ කාලෙත් යම් අඩුපාඩු වුනා. නමුත් මේ ඉන්න කිසිවෙක් මම හිතන්නෙ නැහැ. මත් ද්‍රව්‍ය වෙනුවෙන් පෙනී හිටියා කියලා. නමුත් මේ වෙන දේවල්වලට ක්‍රියාත්මක වෙන්න බැරුව අද අපි සමාජ මාධ්‍යවලින් පෙනී ඉන්න වෙලා තියෙනවා. මහජන නියෝජිතයො, සභාපතිවරයා, මන්ත්‍රීවරු එහෙම නැත්නම් ඔබතුමාල ඉහල අධිකාරියට මොකුත් කර ගන්න බැරි නිසා, ජනතාව හිතනවා අපි උදව් උපකාර කරනවයි කියලා. නමුත් මම සහබන්දු මහත්මය සභාපති කාලෙ තීරණ දෙකකටයි කැමති වුනේ. නාරංගොඩගේ බාර් එක දාන්න අත්සන් කලේ නැහැ. මම අදත් ඒකට ගරු කරනවා. නමුත් මේකෙ හිටපු සභාපතිවරු ඔය නාගොඩ හෝ උඩුගම දාපු බාර් පර්මිට් වලට අත්සන් කළා. ඉන්න නායක හාමුදුරුවරු එක වචනයක් කතා කලේ නැහැ. ගයාන් මන්ත්‍රීතුමා ඔය කියන හාමුදුරුවරු කවුරු හරි විරුද්ද වුනානම් කියන්න. කවුරුවත් කතා කලේ නැහැ සද්ද නැතුව හිටියා නමුත් මෙයා සහබන්දු මහත්තයට නාරංගොඩ මහත්තය ලක්‍ෂ පහක් ඒ කාලෙ ලක්‍ෂ පහක් කියන්නෙ ලොකු මුදලක් දෙන්න හැදුවත්, අත්සන් කලේ නැහැ. මම ඒකට අදත් ගෞරව කරනවා. අඩුපාඩු තියෙනවා, අඩුපාඩු වෙනවා, අනන්තයි. නමුත් ඒකට මගේ ගෞරව අදටත් මම තියනවා . ඒවගේම මාපලගම බාර් එකට අවසර දුන්නෙ නැහැ. අපේ බන්දුල හිරිමුතුගොඩ මන්ත්‍රීතුමාගෙ බිල්ඩින් එක අරගෙන රාක්ක ගහලා ඔක්කොම කරලත් දුන්නෙ නැහැ.

ඒ වගේම ඔය ඉන්න අපේ අද මත්ද්‍රව්‍යවලට විරුද්ධව කතා කරන, නායක හාමුදුරුවරු ඔය වෛනීස් පර්මිට් දෙන කොට ඒවට විරුද්ධ වුනෙත් නැහ. ගයාන් මන්ත්‍රීතුමා මිනිස්සුන්ගෙ දාඩිය මහන්සියෙන් හම්බ කරන සල්ලි හවසට ඇවිල්ල ගණන් කරන්නෙ ගමේ උදවිය නෙවෙයි. ඒකයි දුක. ගමේ කසිප්පු කාරය ගණන් කරලා, ඒ යකා ගේ හදලා, දරුවන්ට දැවැද්ද හදන එක ටිකක් හරි සාධාරණය කරන්න පුලුවන්. මම ඒක හරිය කියන එක නෙවෙයි කියන්නෙ. වැරදි විදිහට අර්ථකතනය කර ගන්න එපා. නමුත් අද මේ දාඩිය මහන්සියෙන් හම්බ කරලා, වැලි ටික ගොඩදාලා එහෙම නැත්නම් වැරදි වැඩක් කරලා හරි හොඳ වැඩක් කරලා හරි හම්බ කරන සල්ලි වලින් මිනිස්සු හවසට ගිහිල්ලා අරක්කු ටික බීලා, ඒකෙ මුදල අරගෙන යන්නෙ ගමෙන් පිට උදවිය. අද ඒ තත්වෙට පාර කැපුව හිටපු ඔයාලගෙ අධිකාරියෙ ඉහල මිනිස්සු. ඇත්ත කතාව ඒක. අද මේ බාර්වල අයිතිකාරයො මෙහේ නෙවෙයි මේ ගමේ සල්ලි ටික එකතු වෙලා අන්තිමේ යන්නෙ පිට ප්‍රදේශවලට. මෙහේ මිනිහෙක් ගෙයක් දොරක් හදලා, ලස්සනට ජීවත් වුනත් තවත් කමක් නැහැ. අපි කියන්නෙ ඒක හරිය කියන එක නෙවෙයි මීට වැඩිය ටිකක් සාධාරණයි. ඒකවත් වුනේ නැහැ. අද එතනින් එහාට ගිහිල්ලා අපේ සල්ලි ටික වෙන මිනිස්සු ගණන් කරනවා. එදත් අපි මේ මත්ද්‍රව්‍ය වලට විරුද්ධයි. අදත් විරුද්ධයි. ලොකු විදිහටම මත් ද්‍රව්‍ය ජාවාරම් නාගොඩ ප්‍රාදේශීය සභා බල

ප්‍රදේශය තුල සිදුවෙනවා. ඇත්තටම වදුරඹ ඕ අයි සී ගානෙ අපි සතුටු වෙන්න ඕන. මෙතුමන්ලට පාලනය කර ගන්න බැරි වෙලා තියෙනවා. අපේ හිතවත්තු. නමුත් මොකක්දෝ හේතුවක් නිසා පොලීසියෙන් කවුරු එලියට ගියත් එලියට යන කොට කසිප්පු විකුණන අය, මත්ද්‍රව්‍ය විකුණන අය, ඒ වට සම්බන්ධ අය දැන් පොලීසියෙන් එනවා කියලා දන්නවා. මගේ නිවස ඉස්සරහ සිදුවීම් මම මේ කියන්නෙ. පොලීසියෙ කවුද කියන්නෙ කියලා අපි දන්නෙ නැහැ. ජීප් එක කොයි පැත්තටද යන්නෙ පැය ගානකට කලින් දන්නවා කොහෙටද එන්නෙ කියලා. ඉතිං මේක නවත්වන්න බැරි තරමට ඔඩු දුවල තියෙන්නෙ. නමුත් මේව නවත්වන්න පුලුවන්. ඒවට වැඩ පිළිවෙලක් හදන්න ඕන. තමුන්නාන්සෙලගෙ දේශපාලන අධිකාරිය හෝ ඒවට අත ගහන්නෙ නැතුව හෝ ස්වාධීනව, හොඳ නිලධාරි හිටියා. දැන් ධනංජය මන්ත්‍රීතුමා ඔබතුමා කියන්නෙ උඩුගම ඕ අයි සී මහත්තය හොඳ නැහැ කියලද? මම පෞද්ගලිකව නිකන් අහන්නෙ. යමක් කළා. ගණන් කාරයො හිටියෙ නැහැ. අසාධාරණකම් වෙන්න ඇති මිනිස්සුන්ට. හැබැයි විනයක් තිබුනා. දැන් ඔබතුමා ඒක නැහැ කියනවනම්, මම ඒක පිළිගන්නම්. හැබැයි මගේ මතය ඒ මනුස්සය ඉන්න කොට හොඳ හරි නරක හරි විනයක් තිබුනා. මත්ද්‍රව්‍ය වලින් අඩුවක් තිබුනා. ඒක කවුරු හෘද සාක්ෂියට එකගව මම මගේ පපුවට තට්ටු කළහම මම දන්නදේ. ඔබතුමා වෙනස් විදිහට හිතන හින්ද මම ඔබතුමාගෙන් ඇහුවෙ. ඔබතුමා ඒක නැහැ කියනවනම්, මට කමක් නැහැ. මගේ හෘද සාක්ෂිය අනුව මම කියනවා. යම් විනයක්, මත්ද්‍රව්‍යවලට තහනමක් තිබුනා.

ඒ වගේම අපි මොනව කිව්වත්, අපි වැරදිනම් වැරදියි. මම මේවට උත්තර දෙන්න නෙවෙයි නැගිට්ටෙ ආරියතිලක මහත්තයට ශෝබය ප්‍රකාශ කරන්න. ඒ නිසා කතා කරන්නෙ. සමා වෙන්න ඒ ගානෙ. දැන් ඔබතුමා යම් යම් කාරණා ගානෙ කතා කලා. ජනධිපතිතුමාගෙ ගානෙ කතා කළා. දකුණු පළාත් සභාවෙ අධ්‍යාපන ඇමතිවරයා විදිහට හිටපු එතුමා හොඳම තොරතුරු හොදටම හදල තිබුනා. මම හිතන්නෙ ඔබ කොහොමත් පිළිගන්නවා ඇති ඒක උපරිම තොරතුරු ප්‍රමාණයක් එකතු කරපු අධ්‍යාපන ඇමතිවරයෙක් එතකොට මේ පාසලක තියෙන පුටුව මේසෙ ගුරුවරයා, ඒ තියෙන ගොඩනැගිලි, පිට්ටනි, යන්න තියෙන පාර, ඉන්න ළමයි ඒ සියල්ල ගැන අවබෝධයක් එයාල ගාව තිබුනා. ජාතික පාසල් අධ්‍යක්ෂ ගාවට ගියපු නිසා මම කියන්නෙ, ගිහිල්ල වාඩි වුනාම එයාගෙ ලැප් එකේ තියෙනවා ඕනම දෙයක්. ඉස්කෝලෙ ඉන්න ළමයි, බිල්ඩින් තාප්ප, පුටු ඔක්කොම පිළිබඳ විස්තර එනවා. එතකොට ජනාධිපතිතුමා කොහෙ හරි ගමකට ගිහිල්ලා, ඉස්කෝලෙට පිට්ටනියක් නැද්ද කියලා අහනවා. මේව තනිකර විහිළු. මම මේ අපහසයක් කරනවා නෙවෙයි. ඇත්තටම මේ තොරතුරු පද්ධතියක් ලංකාව පුරාම තියෙනවා. ඕනනම් සියළුම තොරතුරු මේසෙ උඩට ගෙන්න ගන්න පුලුවන්. අපි රැවටෙනවා. සාක්ෂියට අනුව මම මේ කියන කතාව මන්ත්‍රීතුමාල අහන්න. මම කියන්නෙ බොරුද කියලා. අපේ හෘද සාක්ෂියට අනුව මම දන්නෙ නැද්ද? ගමේ සමෘද්ධිය දෙන්න ඕන පවුල්. එතකොට කුඹුර තියෙන තැන ගොවි නියාමක මහත්තය දන්නෙ නැද්ද? දුප්පත් තැන සමෘද්ධි නියාමක මහත්තය දන්නෙ නැද්ද? නමුත් අපිට ඕන දේත්, අපි කරන්න ගිහිල්ලා, දැන් ඔබතුමාලමත් කල්පනා කරල බලන්න. පහුගිය දැන් දීපු අඩු ආදායම් ලාභීන්ගෙ රස්සාවල් ටික. නිලධාර කොච්චර දුන්නත් පංගුවක් ඒවා වෙනස් කරලා. අපෙත් අඩුපාඩු තියෙනවා. එයාලගෙත් අඩුපාඩු තියෙනවා. මේක මේ අපි ඔක්කොම කරන්නෙ රැවටීමක්. නමුත් මේක තවදුරටත් යන්න බැහැ. නමුත් අපිත් හිතාගන්න ඕන. මේක අඩුම ගනනෙ රැවටීම කරලා. නැත්නම් ඉස්කෝලයක් ගාවට ගිහිල්ලා මේ පිට්ටනියක් නැහැ නෙ කියලා අහන්න ඕන නැහැ. එයාලගෙ තොරතුරු ඒකෙ ඕන තරම් තියෙනවා. මම එතනින් එහාට කතා කරන්නෙ නැහැ. නැවත වාරයක් අපි සභාපතිතුමාට කියනවා ඔබතුමා ලක්ෂ දෙක ගානෙ දෙනවලු කොට්ඨාසෙකට. ගැටලුවක් නැහැ. අපි දන්නෙ නැහැ. ඔබතුමාගෙ මන්ත්‍රීවරු අපට දෙන්න අරින්නෙ නැහැ කියලත් අපි දන්නවා. ඒක තමයි සංහිදියාව. ඒ කියන්නෙ මාර සංහිදියාවක් තියෙන්නෙ. අපේ විපක්ෂ යේ ඉන්න මන්ත්‍රීවරයෙකුට ලයිට් එකක් දැම්මත් ඔබතුමන්ලා සභාපතිතුමාට දොස් කියනවා කියලා තමයි සභාපතිතුමා කියන්නෙ . ඔබතුමන්ලා එහෙම කරනවද කියලා මම දන්නෙ නැහැ. ඔබතුමා කිව්වට කොට්ඨාසෙ

ඔබතුමන්ලගෙ මන්ත්‍රීවරුන්ට කියන්න කියලා, අපි එයාලට කියන්න ඕන නැහැ. බලාපොරොත්තු වෙන්නත් එපා. අපි ඔබතුමාට කියන්නෙ නැතිව විජිත් මන්ත්‍රීතුමාට කියන්න ඕනද?

ඔබතුමා සභාපති වෙච්ච එක ගැන අවංකව කණගාටු වෙනවා. ධනංජය මන්ත්‍රීතුමාගෙ තාත්තට අපි ගරු කරනවා. එතුමා හොඳ හරි නරක හරි කෙලින් කටයුතු කළා. මේ සභාපතිතුමා කියනවනම් කොට්ඨාස 15 වේ එතුමන්ලගේ පක්ෂෙ මන්ත්‍රීවරයෙකුට කියන්න කියලා, මගේ කොට්ඨාසෙ ඉන්නෙ විජිත් මන්ත්‍රීතුමා. පොදු වැඩක් කරගන්න මම විජිත් මන්ත්‍රීතුමාට කියන්න ඕනද? එහෙම කියන්න පුලුවන්ද? ඇත්තටම කියන්න බැහැ. අපිට එපා. සභාපතිතුමා පාරවලුත් එපා. ලයිටුත් එපා. ඕනෙත් නැහැ නමුත් ඔය ඉන්න 15 දෙනාම සාධාරනද කියල කල්පනා කරන්න. නමුත් මේකෙ ඉන්නවා කාන්තා මන්ත්‍රීවරු. අලුත් මන්ත්‍රීවරු පව්. එක දවසකට හරි රුපියල් දහ පාලොස් දාහක වැඩක් කරන්න පුලුවන් වෙන්න දෙන්න. සභාපතිතුමා මේව ඇත්තටම මහ කැත වැඩ. ලක්ෂ දෙක බැරිනම් පහක් දෙන්න. නමුත් මේ මන්ත්‍රීවරුන්ගෙත් ආත්ම ගරුත්වය රැකෙන්න ලයිට් එකක්, බෝක්කුවක්, සිලින්ඩර් කැල්ලක් දාන්න පුලුවන් වෙන්න ඔයාගෙ අතින් දෙන එකක් නෙවෙයි . සමස්ථ සභාවෙ මන්ත්‍රීවරු හැටියට සලකලා පොඩි හරි දෙයක් කරන්න. මට එපා නමුත් මේ පළවෙනි පාරට ආපු මන්ත්‍රීවරු පව්. ඒ කට්ටිය ඒ පිළිබඳව මතක් කරමින් සියලු දෙනාටම සුභ දවසක් කියල ප්‍රාර්ථනය කරනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා මතක තියා ගන්න කොට්ඨාස 15 වේ 15 දෙනෙක් ඉන්නවා. ඒ 15 දෙනත් එක්ක එකතුවෙලා කටයුතු කරන්න. ඔබතුමාලා එයාලට කියන්න. මම එතකොට ඒක කරනවා. මම කියන්නෙ ඒ මන්ත්‍රීවරුත් එක්ක සහයෝගෙන් ඉන්න කියලා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි. දීර්ඝ වශයෙන් සාකච්ඡා වුනා. මම දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මම කතා නොකරන්න හිටියෙ අපේ විදුහල්පතිතුමා කතාව දීර්ඝ කරන්න මාතෘකා දුන්නා. ඇත්තටම නැත්නම් අපි කතා කර කර හිටියෙ. අපි පොඩ්ඩක් මේක ඉක්මනට ඉවර කරමු කියලා. නමුත් මම ඒකට අප්සට් යන්නෙ නැහැ. ඒකට උත්තර තමුන්නාන්සෙලගෙ කණ්ඩායමමෙන්ම ලැබුනා. නමුත් මගේ යුතුකමක් තියෙනවා මම විශේෂයෙන් නැගිට්ටෙ ඒකයි. මොකක්ද මාත් එක්ක එකට වාඩි වෙච්ච 1993 වර්ෂයේ අපි මේ ප්‍රාදේශීය සභාවෙ අ යන්නවත් අඳුන ගන්නෙ නැති වෙලාවෙ, අපි මහජන නියෝජිතයො හැටියට ඇවිල්ලා, මේස ටික පේලියට තියලා, වාඩිවෙන කොට මුලසුන හෙබෙව්වෙ යූ ජී ඩී ආරියතිලක කියන සභාපතිතුමා. අද අර නිශාන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ ඔබතුමාලත්, එතුමත් අතර ලොකු වෙනසකුත් අපි දැක්කා. ඒ වගේම මගේ පළවෙනි යෝජනාව තමයි. අද අපේ පතිනායක මන්ත්‍රීතුමා මතක් කරන වල්වැදිල තියෙන ළිඳ. ඉතිහාසෙ අමතක කළොත්, පක්ෂයක් නෙවෙයි පාටක් නෙවෙයි මට තියෙන්නෙ. ආරියතිලක සභාපතිතුමත් මමත් එක ඉතිහාසය එතන යූ ජී ඩී ආරියතිලක අපේ හිටපු ඇමතිතුමත්, දේශපාලන වශයෙන් අපි කල්ලි දෙකක හිටියෙ. නමුත් එතුමත් මමත් එක පාසල් බස් එකේ එක විද්‍යාලයට ගිහිල්ලා, මට වැඩිය ඉහල පංතිවල හිටියත්, අපේ ලෙංගතු කමක් ගමේ කමට බැඳිල තිබුනා. සභාපතිකමට මෙතනට ආවට පස්සෙ මට කිව්වෙ අතින් අල්ලලා දැන් ඕව ගණන් ගන්න එපා. අපි දෙන්න දෙපැත්තෙ වාඩි වුනත්, අපි පාසල් මිතුරො කියලා. ඒ වචනෙ අදත් මට දෝංකාර දෙනවා. ඒක නිසා ඒකට ගරු කළා. ගෙදරට ගියා. මෙතනට ආවා. ආදාහන භූමියට ගියා. ඒ ගරු කළේ ගරුත්වය තිබ්බා කෙනෙක් නැතිවුනත්, ඒ ගරුත්වය අපිට ඉන්දිද්දිත් තිබුනා. මම මේක අද මතක් කරන්න ඕන. එක දවසක් මම උසාවියට යනවා. මගේ තිබුනෙ ලොකු බරපතල සිද්දියක් නෙවෙයි. ට්‍රැෆික් කේස් එකක්. බයිසිකලේ ලයිට් එක නැහැ කියලා ලියලා. මේ මෑතක නෙවෙයි හුගාක් ඉතිහාසෙ මේ කියන්නෙ. එයා එතකොට එතුමා උසාවි යනවා. එතකොට

ඇමති වරයා. මගේ නම කියවෙන කොට මම අර විත්ති පැත්තට යන කොට මම නීතීඥයෙක් සම්බන්ධ කරලා තිබුනා. නීතීඥයො දෙතුන් දෙනෙක් විමලරත්න මහත්මයල එහෙම නැගිට්ටා . එතකොට ආරියතිලක මහත්මය එහා පැත්තෙ ඉන්නවා. මම හිතුව අපි කඳවුරු දෙකක මෙයා අහක බලා ගනී කියලා. මට එතනදි පුංචි ආඩම්බරයක් ආවා. මෙයා මගේ පාසල් මිත්‍රයෙක් ඔක්කොම පැටිගිරිය කියලා, මේක මෙන්න මේ වගේ කියලා නීතියටත් අවශ්‍ය දේ නැව්වා. විත්තිකරු නිදොස් කොට නිදහස්. මට දඩ මුදලවත් නැත. අද මම ගරු කරන්නෙ අන්න ඒක නිසා. එවැනි සභාපතිවරු මේකෙ බිහි වුනා. තමුන්නාන්සෙලට ඔය ආධුනික සභාපතිවරුන්ට මන්ත්‍රීවරුන්ට අද මේකෙ ඉගෙන ගන්නම දෙයක් නැහැ. නමුත් එතුමා එදා නීතීඥයෙක් හැටියට සභාපති වෙනකොට අපි විපක්ෂයක් හැටියට අර කඳවුරේ හිටියෙ. අපි යම්කිසි පුහුණුවක් ලබල නෙවෙයි මෙතනට ආවෙ. මම හිතන්නෙ අද ඉතුරුවෙලා ඉන්නවා එම් එම් දිසානායක මන්ත්‍රීතුමා, ඔබත් මමත් එදා හිටියා. මම හිතන්නෙ ඊට පස්සෙ හිටියෙ අජිත් එඩේර ආරච්චි මන්ත්‍රීතුමා. මම හිතන්නෙ ඒ හිටපු පැරනි තුන් දෙනාගෙන් එක්කෙනෙක්. ඒක නිසා ප්‍රදේශයේ විශේෂයෙන්ම අමාත්‍යවරයෙක් හැටියට ඉන්න කොට මගදි දැක්කත් නවත්වලා මොකක්ද කරන්නෙ කියලා කතා කරල යනවා. දේශපාලනය තිබුනෙ නැහැ. මම මොකුත් වැඩක් ගත්තෙ නැහැ දේශපාලන වශයෙන්. මිත්‍රත්වය, ලෙන්ගතුකම සහෝදරකම බැඳීම තිබුනා. අපි දේශපාලනය කියන්නෙ වෙනම පීරියඩ් එකක්. අපි ඒ කොලේ වහලා දාල තිබුනෙ. හැබැයි තමුන්නාන්සෙ ගැනත් මම පහුගිය දවස්වල කතා කරන කොට කිව්වා. මොන දේ නොදුන්නත්, මේ මනුස්සයා අපි පාරෙ ඉන්නව දැක්කොත් නම් රිවස් කරලා මොකද කියලා අහනවයි කියලා. ඒකත් හොඳ ගතිගුණයක්. ඒක නිසා අපි මේ වෙලාවෙ අපේ ප්රදේශයේම එතුමා වෙනුවෙන් යමක් කළා. සභාවෙන් යම් කිසි ගමනක් ගිහිල්ලා, පාර්ලිමේන්තුව දක්වා යන්න ඕන පුද්ගලයෙක්. නමුත් අමාත්‍ය වරයෙක් හැටියට පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රාදේශීය සභා සභාපතිවරය හැටියට දීර්ඝ සේවයක් කළා. එතුමට අපේ ගෞරවයත් කෘතඥතාවයත් සිහිපත් කරමින්, එතුමන්ට අපි නිවන් සුව ප්‍රාර්ථනය කරනවා. මේ සභාවෙ මම ඒ පිළිබඳව එච්චරයි කතා කරන්නෙ. නමුත් අපේ ආරියතිලක කියන නාමය මැරුනෙ නැහැ.

දීර්ඝ වශයෙන් මෙතන නොයෙකුත් නොයෙකුත් මාතෘකා ආවා. අර උප සභාපතිතුමා කිව්ව වගේ මම ඒක කෙටියෙන් හැම එකම සම්බන්ධ කරනවා. අතුරු ව්‍යවස්ථා පිළිබඳ භීෂණය මටත් තියෙනවා. ඒක මතක් කරන්න ඕන. මම ඒ පුද්ගලය නැගිටින කොටම බැලුව කවුද කියලා. ඒ ආපු මහත්මයා අපි මෙතන අපේම කට්ටිය නිසා කියනවා. ද්‍රවිඩ මහත්මයෙක්. අද එන්ජීඕ ඒ කියන්නෙ ඔතනින් තමයි දියත් වෙන්නෙ. මේකට ඇවිල්ල ලාහුගල පැටිගිරියක් පෙන්නනවා ඊලගට ඇල්පිටිය කියන්නෙ නාගොඩ කියන්නෙ එකම ජන කොට්ඨාසයක් ඉන්න ප්‍රදේශ වතු කම්කරුවො සහ නොයෙකුත් ජාත් සුලු වශයෙන් නියෝජනය වෙනවා. අතුරු ව්‍යවස්ථාවක් මෙතනට එනවා. අතුරු ව්‍යවස්ථාව සම්මත වෙනවා. මේක ගලව ගන්න අපට අනාගතේ බැරි වෙනවා. අතුරු ව්යවස්ථාව තුලින් නයාට දීපු බිත්තරය තුලින් ඇතුලට රිංගනවා ඒ රිංගුවට පස්සෙ අපට තව එකක් ගේන්න වෙනවා. ඒක ලේසි වෙන්නෙ නැහැ. බණ්ඩාරවෙල ඊලගට කරල තියෙන්නෙ. මොකක්ද හොඳටම වතු කරය තියෙන පැත්තෙ ප්‍රදේශයේ තමයි ඕක කරල තියෙන්නෙ. ලාහුගල, නුවර එලිය ඒ ප්‍රදේශවල ඒක නිසා අපි හුගක් හිතන්න තියෙනවා. අන්න ඒක නිසා ඔබතුමා එක ස්ථාවරයක ඉන්නවා. නියෝජ්‍ය සභාපතිවරය ඉන්නවා. මම සභාපතිතුමත් එතන ඇතෙයි කියලා හිතනවා. අපේ මන්ත්‍රීවරුත් බහුතරයක් එතන ඇති. මේක තේරුම් නොගෙන මෙතන වාඩි වුනේ. ඒක නිසා අපි බුද්ධියෙන් සිතන්න. නාගොඩට එදා නිශාන්ත මන්ත්‍රීතුමා කිව්ව නාගොඩටම අර බාර් එක ගෙනැල්ල දැම්ම නම්, ඒක විවේචනය වෙන්න වගේ ඉතිහාසයට එකතු වෙන්න එපා. සභාපතිතුමා අතුරු ව්‍යවස්ථාව තුල මේක දාලා, මේක කොඩිවිනය අපට කපා ගන්න බැරි වුනොත්, එදාට අහිංසක දරුවො තමුන්නාන්සෙල එදා මේ තරුණ කැල තමයි එදාට සමහර විට මේකෙ සභාපතිකම් කරන්නෙ. අපි දැන් දීර්ඝ වශයෙන් අපේ ගමන ඇවිල්ල තියෙන්නෙ. ඒක නිසා අපි ඒ පාඩම අපි මේ

සභාවට කියා දෙන්න ඕන කියන එක තමයි මම කියන්නෙ. එහෙනම් ඒ පිළිබඳවත් මීට වැඩිය මම කතා කරන්නෙ නැහැ. දන්නා තේරෙන දේ තමයි මම මේ ප්‍රකාශ කළේ.

ඊලගට තුන්වෙනි කාරණය, තමුන්නාන්සෙලා පහුගිය කාලෙ රැකියාවල් දුන්නා. මම හිතන විදිහට ඒ අට පාස් ශ්‍රම බලකාය. ශ්‍රම බලකායක් කියන එකක් හදලා අද මොකක්ද වෙලා තියෙන්නෙ. ගෑස් එක, කිරිපිටි පැකට් එක වැඩි කරන්න වෙන්නෙ. මේ ශ්‍රම බලකායෙන් ශ්‍රමය ගන්නවද? මොකක්ද මේ ශ්‍රම බලකායෙන් කරන්නෙ කියන එක මම දැන ගන්න ආසයි. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියොත් මම හිතන්නෙ 100 කට ආසන්න පිරිසක් ක්ලීන් ෂූට් ගහලා. අපි මේ කාටවත් දෝෂාරෝපනය කරනවා නෙවෙයි. ශ්‍රම බලකාය කියන එකේ තේරුම කුමක්ද? එහෙමනම් මේ බලකායෙන් කුමක් වෙනවද? අද මාර්ග කම්කරු මහත්තුරු නැතුව අද උඩුගම උප කාර්යාලෙ සේවකයො අඩුවෙලා. අද කොම්පෝස්ට් එකේ පොහොර ටික හදා ගන්න බැරුව, කිසිම සේවකයෙක් ස්ථිර කරන්න බැරුව සභාවෙ අපි කතා කරනවා. ගනිපු සේවකයෙක් ස්ථිර කරන්න බැහැ. සභාපතිවරයට ඒ බලතල පාවිච්චි කරලා සේවකයෙක් බඳව ගන්න බැහැ. මාසෙට 20000 බැගින් විසි දාහෙ ඒව දිදී ලක්‍ෂ කෝටි ප්‍රකෝටි ගානක් අද ආණ්ඩුවෙ මුදල් කාබාසිනියා කරනවා. ඒක නිසා මේ රජයටත් තමුන්නාන්සෙල දැනුම් දෙන්න. අපිමේ සභාවෙ වාද විවාද වෙනවා. මාර්ග කම්කරුවො නැතුව සංවර්ධනය කරන්න බැරුව ඉන්නවා. අපේ අපේ අහිංසක සේවකයො ස්ථිර කරන්න බැරුව ඉන්නවා. අන්න ඒක නිසා එක්කො ඒ සේවකයො ටිකක් මෙහේට දෙන්න කියන්න. ඔය සේවකයන්ට ශ්‍රම බලකායනම් ඒ ශ්‍රමය අපේ මාර්ගවලට දෙන්න. අපේ සංවර්ධනයට දෙන්න. පාසල්වල සංවර්ධනයට දෙන්න. සෞඛ්‍ය සංවර්ධනයට දෙන්න කියලා ඒ ඉල්ලීම මේ ගරු සභාවෙ මම කරනවා. ඕක තමයි වෙන්න ඕන. තමුන්නාන්සෙල මේ සේරටම අත උස්සනව ඇති. මේක තියෙනවා කියලා. තමුන්නාන්සෙට අයිතියක් තියෙනවා. තමුන්නාන්සෙ හැම මාසෙකටම සැරයක් සංවර්ධන ගාල්ලෙ දිසිත්‍රික් සංවර්ධන කමිටුවට යනවා. වැඩක් නැහැ. දිසාපතිවරු සියලුම දෙනා එනවා. තමුන්නාන්සෙ සටහනක් දාගන්න. සභාවෙ මේ වගේ දෙයක් යෝජනා වුනා. අපට මාර්ගයක් සුද්ද කරන්න විදිහක් නැතුව ඉන්නවා. කසල ටික අර කොම්පෝස්ට් එකට ගිහිල්ල හලන්න බැරුව ඉන්නවා. මසෙට කොම්පොස්ට් එකෙන් මම කියනවා ලක්‍ෂ ගානක් උපයන්න පුලුවන්. නමුත් අපට උපයන්න බැහැ. එක කමකරුවයි ඉන්නෙ. මම හොයල බැලුවා .එයා තමයි පොහොර ටික එහාට දානවා. මෙහාට දානවා. කසල ටික තෝරනවා. කාඩ්බෝඩ් කැලිටික වෙනම දානවා. වීදුරු කටු ටික තව පැත්තකට දානවා. එක සේවකයෙක් තියාගෙන අපි මේ වාර්තා ඉල්ලනවා. මේ සිය ගානක් අපේ ජාතික ධනය විනාශ වෙන්න සිය ගානක් පඩි ගන්නවා. ඒක නිසා මම ඒ පිළිබඳවත් මීට වැඩිය කතා කරන්නෙ නැහැ. මම හිතන්නෙ සභාපතිතුමාටත් මන්ත්‍රීවරුන්ටත් පැහැදිලි වෙන්න ඇති.

ඒක නිසා මේ වෙලාවෙ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට පුංචි උත්තරයක් දෙන්න ඕන. තමුන්නාන්සෙ කිව්වා ආණ්ඩුව හොඳයි බඩු මිලයි කියලා. මට තර්ක කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සෙට ඒකට එකතු කරන්න මට තව ටිකක් තියෙනවා. අද සොරකම්, මෙහෙන් කසිප්පු, මත්පැන් ගැන කතා කරනවා. ගමක කෙහෙල් කැනක් තියා ගන්න බැහැ. ගහක පුවක් ගෙඩි ටිකක්, පොල් ගෙඩියක් තියා ගන්න බැහැ. තේ කැල්ලෙ තේ දල්ල තියා ගන්න බැහැ. කුරුඳු ගහ තියෙද්දි කුරුඳු ගහ තලාගෙන යනවා. අන්න එවැනි යුගයකට අද අපි නැකම් කියනවා. ගෙදරක දොරක් වහල යන්න බැහැ. ගෙදරක දොරක් වහල ගියොත් කුඩු ගහන එකා කසිප්පු ගහන එකා වෙන්න පුලුවන්, බඩගින්න නිසා වෙන්න පුලුවන්. බඩගින්නට මොන දෙයක් හරි කරනවා, රටේ ආර්ථිකයත් බඩු මිලත් මේ සියල්ලටම බලපෑවයි කියන එක මේ ගරු සභාවෙ මතක් කරනවා. අද හාල් ටික, පොල් ගෙඩිය ගන්න බැහැ. අද තුනපහේ ටික, කිරිපටි පැකට් එක ගන්න බැහැ. අද ආරථිකය කඩා වැටිල තියෙන්නෙ. සියලුම දෙනාට රාජ්‍ය සේවකයාට සමරව්ට මේක නොදැනෙනව වෙන්න පුලුවන්. අහිංසක කම්කරුවන්ට මේක දැනෙනවා. අන්න ඒක නිසා ඒ පිළිබඳව මම මීට එහා යන්නෙ නැහැ. ඒකත් මතක් කරනවා.

ඊලගට සංවර්ධනය සූදානමක් නැහැ. නමුත් කෙටියෙන් මතක් කරන්නම්, අද හෙට අනිද්ද වෙන කොට කන්න විතරක් නෙවෙයි හුස්ම ගන්නත් බැහැ. හුස්ම ගන්නත් බැහැ. කැලෙත් කපල ඉවරයි. සිහරාජෙ කැලේ කැපුවා. අන්න රුමස්සල කැලෙත් කපනවා. ඊට පස්සෙ අපේ වැදි ජනතාව ඉන්නෙ කොහේද දඹානෙ. කැලේ කපනවා ඒ විතරක් නෙවෙයි සීගිරියෙ,හම්බන්තොට කැලේ කපනවා. වාදෙකට එනවනම් ලිස්ට් එකම අරගෙන ආවෙ නැහැ. කැලෑව කපල මේවා දෙන්නෙ විදේශීය සමාගම්වලට. තව ටික දවසක් යන කොට හෙට හම්බවෙන දරුවට හුස්ම ගන්න විදිහක් නැහැ. මේ රටේ ඕක තමයි ඉතිහාසය. නමුත් මේ පනිවිඩය ඔය වාර්තාවෙන් හරි ඕක පොඩ්ඩ පොඩ්ඩ හරි ඉහලට යයි. අනාගත පරපුර වෙනුවෙන් මම ප්‍රකාශ කරන්නෙ. ඕක තමයි වර්ථමාන තත්වය. පුංචි පුංචි දේවල් අල්ලගෙන දැන් මම මෙතන කතා කරන්න යන්නෙ නැහැ. අන්න ඒක නිසා අපි සියලු දෙනාම සැලකිලිමත් වෙන්න ඕන යුගයක අද ඉන්නෙ. ප්‍රදේශයක් අඩා වැලපෙනවා. ඊයෙ පෙරේද මම දැක්කා කිරි ගොවියො දාස් ගානක් ඉන්න තැන විනාශ කරනවා. එවැනි යුගයක් අද බිහි වෙලා තියෙන්නෙ.

මත්පැන් ගැන කතා කරන්න දෙයක් නැහැ. අවසාන වශයෙන් කියනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා කිව්වෙ අපටත් වැඩිය ඇත්ත කතා කරනවා. අපටත් වැඩිය පුංචි මිනිහා ගාවට ලංවෙනවා. පුද්ගලයො හැටියට අපි ලැජ්ජ වෙන්න ඕන නැහැ. පැකිලෙන්න ඕන නැහැ. ඒ පවුලට සමෘද්ධිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් දීල නැත්නම්, ඒ කොට්ඨාසෙ එදා හිටපු සමෘද්ධි නියාමකත් වැරදි කරුවෙක් වෙනවා. අපි සුදු හුනු ගාන්නෙ නැහැ. ඔය කියන පොටෝ එක අපි දැක්කනම් කොයි එකා කළත් වැරැද්ද වැරැද්දමයි. එහෙම නම් සමෘද්ධි නියාමකට බලයක් නැහැ. ගමේ අහිංසක සිරිසේන පුංචි අකුරෙන් පුරවල ගිහිල්ල දීපු ඉල්ලුම් පත්‍රය ආපහු දෙන්න තරම් එයා ශක්තිමත් නැහැ මතක තියා ගන්න මේ ඉන්නෙ රාජ්‍ය සේවකයො, අහිංසක දරුවා මීට ඉහලයි. මේ ඉන්නෙ රාජ්‍ය සේවකයො රාජ්‍ය සේවකයෙක් හැටියට අහිංසක මිනිහ ගාවට ගිහිල්ල ඒ අදාළ කටයුතු කරන්න ඕන. ආපහු භාර දෙන්න බැහැ. ඒක යූ එන් පී ආණ්ඩුවද, වෙනත් ආණ්ඩුවද කියන එක අදාළ නැහැ. කොයි ආණ්ඩුවෙන් කළත් වැරැද්ද වැරැද්දමයි. ඒ පිළිබඳව මම මතක් කළේ, මොකද නැත්නම් තමුන්නාන්සෙල හිතයි ලක්ෂ හයක් සමෘද්ධිය දුන්නා. නමුත් සමෘද්ධිය දෙන කොට අඩුපාඩු වෙන්න ඇති. නමුත් ඕකත් අඩුපාඩුක් වෙලානම්, ගමේ ඒක තමයි මොනව හරි වුනානම් ඒකත් වරැද්දක් කියන එක කියනවා. අපි කරපු වරැද්ද මම ඉල්ලීමක් කරනවා තමුන්නාන්සෙල කරන්න එපා. අපි වැරදි කළයින් තමයි අපි පරාද වුනේ. එහෙමනම් මේ ආණ්ඩුවෙ ඒක කරන්න බැහැ. මීට වඩා ඒක නිවැරදි විය යුතුයි. එහෙමනම් අපේ වගකීම තියෙන්නෙ අර මහත්තුරු ඇවිල්ල විනාඩි හතකින් මේක ඉවර කරන්න පුලුවන්ද මේ පනිවිඩය කවුද ගෙනියන්නෙ? ගමේ සමෘද්ධිය කපපු එක, ගමේ කැලේ කපන එක, බිත්තර වී ටික නැති එක, විනාඩි හතකින් කතා කරල ඉවර කරන්න බැහැ. මාසෙකට දවසයි මෙතනට එන්නෙ. අපට යමක් දෙනවා අහිංසක මිනිස්සුන්ගෙ බදු මුදලින්. අන්න ඒක නිසා ඒකෙ වගකීම, ඒකෙ යුතුකම මේ ඉෂ්ඨ කරන්නෙ. අර එලිවෙන ජාමෙට හොඳ හොඳ සෙල්ලම් කිව්ව වගේ ගරු සභාපතිතුමනි ගරු අපේ මන්ත්‍රීතුමනි හෙට අනිද්ද වෙන කොට ලබන සභාව වෙන කොට තත්වෙ බලන්න මොකක්ද වෙලා තියෙන්නෙ කියලා. කිරිපිටි, ගෑස්, පෙට්‍රල් වැඩියි. අද රැටත් විශ්වාස නැහැ බඩු මිල වැඩිවෙන්න පුළුවන්. ඒකයි තත්වෙ. සර් පාස් වුනත් සර් ෆේල් වුනත් ජනතාව පාස් කරන්න. ජනතාව ෆේල් වුනොත් ජනතාව අහිංසකයි. ඒක නිසා තමයි අපි මේ කතා කරන්නෙ. එහෙමනම් අපි සභාපතිතුමාගේ අඩුපාඩු මම ඒව කතා කරන්න යන්නෙ නැහැ. තමුන්නාන්සෙ කොහොමත් අපි දන්නවා අපට බෙදන්නෙ නැතෙයි කියන එක. අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ. ඒක නිසා අපි ඒව බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. එකක් මතක තියා ගන්න. අපට හැල්ලු වෙන්න කියන්නත් එපා. ආත්ම ගරුත්වයක් තියෙනවා. තමුන්නාන්සෙ ඔය පුටුවෙන් ගිහිල්ලා මන්ත්‍රීවරයෙක් හැටියට මෙතන වාඩි වුනහම අන්න එදාට මම කියන්නම්. එදාට ඒක හදවතට දැනෙයි. නාගොඩ විතාන මන්ත්‍රීතුමා එයාට ගිහිල්ල කියලා එයාගෙන් ලියුම් කැල්ලක් ගේන්න ඔයා එකතුවෙලා, වැඩේ කරන්න කිව්වොත් හදවතට

දැනෙයි. හිටපු සභාපතිවරයෙක් හිටපු මන්ත්‍රීවරයෙක් විසි අවුරුද්දක සභාවෙ එදා අද ඊයෙ ආපු පුද්ලගයෙක් ගාවට ගිහිල්ල අපට අවසර ගන්න කියනවනම්, හදවතේ ගැස්ම එදාට දැනේවි. එදාට දැනේවා කියල ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා වරදවා හිතන්න එපා. මම එදා ඉඳලම කියන්නෙ එක් කොට්ඨාසෙක මන්ත්‍රීවරු ඉන්නවනම් දෙගොල්ලො සහයොගෙන් කතා බහ කරගෙන වැඩේ කරන්න. මෙතනට යෝජනාව දෙන්න කියලා. ඒකයි මම කිව්වෙ ගරු මන්ත්‍රීතුමා නැතුව එහෙම හැල්ලුවට පත් කිරීමකට නෙවෙයි. ඒ තත්වෙට මම වට්ටන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපේ ඇප්තොප් වත්තෙ පොල් ගස් 100 කට ආසන්න ප්‍රමාණයක් තියෙනවා. මම හිතන්නෙ පහුගිය සභා වාරවලදී පොල් ආදායම සභාවට ඉදිරිපත් කෙරුනා. නමුත් මේ පහුගිය දවස්වල මට දැනගන්න ලැබුනෙ නැහැ. දැන් පොල් ගෙඩියක් රුපියල් 100 කට විතර යනවා. දැන් ඒකෙ ආදායම ගන්නවද පොල් ටික කඩනවද? දැන් ඒ ඉඩමෙ පොල් ටිකට මොකක්ද වෙන්නෙ? ටෙන්ඩරය කාටවත් දීල නැද්ද? ඔය පොල් ඉඩමෙ කලින් ඉඳලා පොල් හොරු කැඩුවා. ඊට පස්සෙ නැවත මට මතකයි. මගේ පියා සභාපති වුන වෙලාවෙ, සභාවට අරගෙන, ඒ ආදායම සභාවට ගත්තා. ඒ දවස්වල පොල් ගෙඩියක් විකුනුවෙ රුපියල් 20 ට. දැන් පොල් ගෙඩියක් 100 යි. ඊට පස්සෙ ඒක නැවත අභාවයට ගිහිල්ලා, නැවත අර පෙර තත්වෙටම ඒ ඉඩම ඇවිල්ල තියෙනවා. ගරු හිටපු සභාපතිවරුන් මම වැරදිනම්, නිවැරදි කරාවි. ඉඩම් පවරා ගැනීමේ බලය මම හිතන්නෙ තියෙන්නෙ සභාපතිවරයෙකුට තමයි. රාජ්‍ය ආයතනයක බලය තියෙන ප්‍රධානම කෙනා තමයි සභාපතිවරයා. ඒ යටතේ ඉල්ලීමක් කරලා ඔබතුමා ඒ ඉඩම පවරා ගන්න කටයුතු කරන්න කියලා, මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අඩු තරමෙ පොල් ඉඩමවත් පවරගෙන, ආදායම අර ගන්න. මම දැනුවත්ව පොල් ගස් 100 ක් තියෙනවා.

ගරු සභාපතිතුමා ඊලගට මට දැන ගන්න අවශ්‍යයි සභාවෙ කැබ් රථයේ රක්‍ෂණ වාරිකය ගෙවීමක් කරන්නෙ නැහැ කියලා, මට ඒ රක්‍ෂණ සංස්ථාවේ මහත්තය දැනුම් දුන්නා. ඒ රක්‍ෂණ වාරිකය ගෙවන්නෙ නැති හේතුව, ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවට වෙන ඒජට් කෙනෙකුට ලබා දීමට ඒක ගෙවන්නෙ නැතුව මග ඇරලා කැන්සල් වුනාට පස්සෙ, වෙන ඒජන්ත වරයෙකුට ඔබතුමා ලබා දීමට කටයුතු කරන්න අදහස් කරගෙන ඉන්න බව සදහන් කරල තිබුනා. නමුත් සභාපතිතුමා, මම දැනුවත් වුන විදිහට, ඒක බ්ලැක් මාර්ක් කළාට පස්සෙ, ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවෙන් ඔබතුමාලට මේ කැබ් රථයට නැවත ඉන්ෂුවරන්ස් එකක් ලබා ගැනීමට නොහැකි වෙනවා. මම හිතන්නෙ ඉන්ෂුවරන්ස් එක නොගෙවා, ඉන්ෂුවරන්ස් එක නැතුව තමයි මම හිතන්නෙ සභාවෙ කැබ් එක දුවන්නෙ. එතකොට ඒ ගෙවීම් කරන එක සහ ඒ වෙනස් කිරීම ගැන විනිවිධ භාවයෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා .

ගරු සභාපතිතුමා විශේෂයෙන් මේ අවස්ථාවෙදි අපේ කණගාටුව ප්‍රකාශයට පත් කරන්න ඕන. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරයෙක් වශයෙන්, මගේ කණගාටුව, අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පළවෙනි සභාපතිතුමා, ඒ වගේම මම හිතන්නෙ දකුණු පළාත් සභාවෙ ලංකාවෙ අවුරුදු 15 ක්. එක දිගට අමාත්‍ය ධූරයක් දරපු යූ ජී ඩී ආරියතිලක මැතිතුමා, අභීත දේශපාලන නායකයෙක්. එදා දකුණ, වමට හරවද්දි අමරසිරි දොඩංගොඩ මැතිතුමන්ලත් එක්ක එතකොට රිචර්ඩ් පතිරණ, මහින්ද

රාජපක්ෂ මැතිතුමන්ලත් එක්ක මේ ගමනට ශක්තියක් වුන නායකයා යූ ජී ඩී ආරියතිලක මැතිතුමන්ගේ අභාවය පිළිබඳ අපේ බලවත් කණගාටුව, ශෝකය, ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වගේම මේ අවස්ථාවෙදි මම කියන්න ඕන. නව රජයට ස්තුති වන්ත වෙන්න ඕන. මේ වෙන කොට අපි ඇවිල්ලා තාම මාස නවයක්. ආණ්ඩුව පත්වෙලා අවුරුද්දක් වෙන්නෙ නැහැ තවම. මේ වෙන කොට අපි නිවාස නැති අයට ගෙවල් තුනක් හදල දීල තියෙනවා. දැනට මේ වසරෙ, අපි හැම ග්‍රාම සේවා වසමකම නිවාස පහක් හදන්න ලේස්තිවෙලා තියෙනවා. එතකොට මේ ලබාදෙන්නේ ණයක් නෙවෙයි. කොන්ත්‍රාත් කරුවෙකුට දීලා, ඉතා අවිධිමත් විදිහට හදපු ගෙයක් හදලා දීලා, නැවත ගන්න ණයක් නෙවෙයි. මේක ආධාරයක්. මේ ආධාරය, ලක්ෂ හය දෙන්නෙ, ඒ ගේ හදන්න ඕන ගෙදර අයිතිකාරයා එයා ඒ අවශ්‍ය වැලි ටික, ගල් ටික එයා ඒව ලේස්ති කර ගත්තට පස්සෙ, අපි ක්‍රම ක්‍රමයෙන් තමයි මේ මුදල දෙන්නෙ. විශේෂයෙන් මගේ කොට්ඨාසෙ ගත්තොත්, මගේ ගෝනදෙනිය කොට්ඨාසෙ නම් එක කොට්ඨාසයක ගෙවල් තුනක් විතර තමයි තියෙන්නෙ. අනිත් කොට්ඨාසෙ ගෙවල් පහක් විතර තමයි තියෙන්නෙ. මම හිතන්නෙ මේ වසරේ ඒ ගෝනදෙනිය වසම් දෙකේ මැටි නිවාසවල ඉන්න මිනිස්සුන්ගෙ නිවාස අංග සම්පූර්ණ වෙනවා. නමුත් හගරංවල තියෙනවා. ගෙවල් 26 ක්. දැන් ඒකෙනුත් ඉතාම දුප්පත්ම සහ තරුණ ළමයි ඉන්න පවුල් විශේෂයෙන් තෝරාගෙන නිවාස දෙන්න අපි තෝරගෙන තියෙනවා. මම හිතන්නෙ මේ රජයක් කිසි වෙලාවක බැදිල නැහැ නිවසක් දෙන්න. නමුත් මේ රජය මේ කරන කටයුත්තට විශේෂයෙන්ම අපි ස්තූති වන්ත වෙන්න ඕන.

ඒ වගේම මේ වෙන කොට ගෝනදෙනිය දිසානායක මාවත කිලෝ මීටර් දෙකක ප්‍රමාණයක් කාපට් කරනවා. මේ විදිහට ලංකාවෙම කිලෝ මීටර් ලක්ෂයක්, මම ඉතාම සන්තෝශයට පත් වුනා. අපි පහුගිය දිනක, ප්‍රාදේශීය සභාවෙ අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සමඟ මග නැගුම මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාත් එක්ක තිබුන සාකච්ඡාවෙදි, අනිත් ආසන වල කිලෝ මීටර් 25 30 තමයි කාපට් වෙලා තිබුනෙ. ගරු සභාපතිතුමා නමුත් හිනිදුම ආසනයේ කිලෝ මීටර් තුන්සිය ගානකට ආසන්න ප්‍රමාණයක්, ලංකාවෙ වැඩියෙන්ම කාපට් ඇතිරෙන ආසනය බවට මේ හිනිදුම ආසනය පත්වෙලා තියෙනවා. එතකොට නාගොඩ ප්‍රාදේශීය සභාවෙ අපි අයිති වෙන්නෙ හිනිදුම ආසනයට. බද්දෙගම කොටසත් එක්ක. එතකොට මේ විදිහට ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සම්පත් අතුකෝරල මැතිතුමාට ස්තූති වන්ත වෙන්න ඕන. මම මේ අවස්ථාවෙදි සභාවෙ දැන ගැනීම සහ ඔබ සියලු දෙනා වෙනුවෙන් ඒ මතක් කිරීම සිදු කරන්න ඕන.

ඒ වගේම තමයි දැන් මේ වෙන කොට කොවිඩ් වසංගත තත්වය යම් කිසි තැනකට ඇවිල්ල තියෙනවා. මම හිතන්නෙ ලෝකයේ රටවල් කිහිපයක පමණයි මේ එන්නත් ලබා දීම සිදු කරන්නෙ. දැන් මම අහගෙන යම් යම් අඩුපාඩු තියෙනවා. චෝදනා කරනවා. ජනාධිපතිට ඕනවටවත්, අගමැතිට ඕනවටවත් ගෙනාපු එන්නතක් නෙවෙයි. මේ එන්නත ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්දේශ කළාට පස්සෙ, අපේ ලංකාවෙ වෙනම තියෙනවා. සෞඛ්‍ය අංශයක්. ඒ අංශ නිර්දේශ කළාට පස්සෙ තමයි මේ එන්නත ලංකාවට ගෙනත් දීල තියෙන්නෙ. එතකොට ලෝකෙ කොරෝනා මර්ධනය කරන රටවල් අතරින් පළවෙනි රටවල් දහය ඇතුලත ලංකාව ඇවිල්ල තියෙනවා. ඉතිං මේ එන්නත මමත් විදල තියෙන්නෙ. ගරු සභාපතිතුමනි, මුලින්ම රාජ්‍ය ආයතන විශේෂයෙන්ම කොළඹ පිහිටි ප්‍රධාන රාජ්‍ය ආයතනවලට ලබා දෙනවා. කොළඹ එම් ඕ එච් කාර්යාලය ඉදිරිපිට ගම්වල මිනිස්සු පෝලිම් ගැහිල ඉන්නවා. මේ එන්නත ලබා දෙන්න කිසිදු අය කිරීමකින් තොරව ඉතාමත්ම සාර්ථක විදිහට ඒ එන්නත ලබා දෙනවා. ඒ එන්නත ලබා දීලා විනාඩි 20 ක් අපි එම ස්ථානයේ ඉන්න ඕන. ඒ ස්ථානයෙදි ඒ එන්නතේ අතුරු ආබාදයක් ඇති වුනෝතින්, දැඩි සත්කාර ඒකක, ඒ අවශ්‍ය වෛද්‍ය කණ්ඩායම්, ඒ විදිහට ඉතාමත්ම සාර්ථක ලෙස ඒ ස්ථානවල ස්ථාන ගත කරලා තියෙනවා. ඒ ස්ථාන ගත කිරීමත් එක්ක ඉතාම සාර්ථකව මේක බෙදා හැරීම කරල තියෙනවා. මම හිතන්නෙ මේ උඩුගම අපේ රෝහල් මේ නාගොඩට මේ හැම තැනටම ඉතාම සාර්ථක ලෙස මේ එන්නත

ඇවිල්ලා තියෙනවා. ඒ වගේම ඔබ තමුන්නාන්සෙලට මතක ඇති. තව නොබෝ දිනකින් ඒ අඳුරු දවස උදා වෙනවා. ඒකත් මතක් කරන්න ඕන. ලබන මාසෙ අප්‍රේල් 21 වෙනිදා මතක ඇති. ඔබ තමුන්නාන්සෙලට මේ රටේ ඇතිවෙච්ච ඛේදවාචක තත්වය, මේ රටේ ජාතික ආරක්ෂාවට සිදු වුන දේ මොකක්ද කියන එක. තමුන්නාන්සෙලට නැවත නැවතත් මතක් කරන්න අවශ්‍යතාවයක් නැහැ. නමුත් අද රට කොරෝනා වලට මේ විදිහට මුහුන දෙන ගමන් රටේ ජාතික ආරක්‍ෂාව අංක එකට ඇවිල්ල තියෙනවා. පහුගිය දවස්වල මම කොළඹ හිටියා ගුවන් හමුදාවට වසර 70ක් පිරීම නිමිත්තෙන් ඉතාම දැවැන්ත සංදර්ශයක් පැවැත්වුනා. යුද්ධයක් නැති වුනත් අපට තියෙන යුධ ශක්තිය සහ ආරක්‍ෂක තත්වය ගැන ඇත්තටම අපි සියලු දෙනාම සෑහීමකට පත්වෙනවා. භය නැතුව එලියට බැහැල අපි ගමන් කරනවා.

ඒ වගේම මට තව දෙයක් මතක් කරන්න ඕන. අර උඩුගම හිටපු ස්ථානාධිපති ගැන සඳහන් කළා. උඩුගම හිටපු ස්ථානාධිපතුමා කපල පටවපු ලී ලොරි දෙකක් මම ඇල්ලුවා. මම නතර කළා. නඩුත් දැම්මා. එකක් අරගෙන ගියා. එකක් නතර කළා. එතකොට ස්ථානාධිපතිතුමාගෙ විනය ගැන මම කතා කරනවනම්, උඩුගම ඉස්පිරිතාලෙ ප්‍රදේශයෙදි ගෑනු මනුස්සයෙක්ගෙ ගෙට රිංගල ගමේ මිනිස්සු ගහල එලෙව්වෙ යුනිෆෝම් එක ඇඳ ඇඳ තමයි ස්ථානාධිපති තුමා දිව්වෙ. එතකොට වතු සමාගම් එක්ක ගනුදෙනු කරන විදිහ අපි කටුපොල් වලට විරුද්ද වෙද්දි, කටුපොල් වතු සමාගම් එක්ක ගනුදෙනු කරපු විදිහ ඉතාම නින්දිතයි. නීචයි කියන එක මේ අවස්ථාවදි මතක් කරන්න ඕන.

ඊට පස්සෙ ගරු සභාපතිතුමා, අපි මතක් කරන්න ඕන. ඉදිරියෙදි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම කර්මාන්ත ශාලාවක් ඉදිවෙනවා. මේ කර්මාන්ත ශාලාව හරහා ගමේ මිනිස්සුන්ට රැකියා දෙන්න වැඩසටහනක් යනවා. ඒ වගේම හැම ග්‍රාම සේවා වසමකම අදූර ගත්ත යම් කිසි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. දැන් උදාහරනයක් විදිහට ගෝනදෙනියෙ මම යෝජනා කළා. ගෝනදෙනියෙ එක කොට්ඨාසයක බතික් කර්මාන්ත ශාලාවකුත්, අනිත් කොටසෙ හැන්ඩ් ලූම් අත් යන්ත්‍ර ව්‍යාපෘතියකුත්. ඒ කියන්නෙ ඒ දෙක එකට යන වැඩසටහනක්.මේ සමෘද්ධියට දිරි දෙන්න මේ ආණ්ඩුව සූදානම් නැහැ. විශේෂයෙන් ගත්තහම, සමෘද්ධිය තියෙන සමෘද්ධි ලාභීන්ට අපි රුපියල් 50000 ක දීමනාවක් ලබා දීලා, මේ සමෘද්ධි ලාභීන් යම්කිසි තැනකට ගේන්න, ඒ කියන්නෙ මේ සමෘද්ධිය දෙන එක නෙවෙයි රජයක් දුප්පත් මිනිස්සු නැති කරන එකයි කරන්න ඕන. එතනට අපි යම්කිසි ප්‍රාග්ධනයක් දීලා, ඒ තැනට ගේන්න ඕන. දැන් විශේෂයෙන්ම ලොකුම ප්‍රශ්නයක් තමයි මේ කඩවල් වල බඩු මිල. බඩු මිල සම්බන්ධව කතා කළා. බඩු මිල සම්බන්ධව රජයේ චක්‍ර ලේඛන යටතේ, මේ ආණ්ඩුවෙ නව ව්‍යාපෘතියක් තියෙනවා හැම ගමකම රජයේ පාලන මිල යටතේ ක්‍රියාත්මක කරන කඩයක් නිර්මාණය කරනවා. එම ස්ථානයට අපි ගෙයකුත් එක්ක කඩයක් දෙනවා. ඒ පුද්ගලයට තරුණ කාන්තා ව්‍යවසායිකාවකට රුපියල් ලක්ෂ 20 ක මුදලක් දෙනවා. ඒ මුදල දෙන්නෙ ඒ කටයුතු සිදු කරන්න. ඒ කඩේ බඩු විකුන්නෙත් චක්‍ර ලේඛ අනුව රජයේ පාලන මිල යටතේ.

ඊට පස්සෙ අපි අගමැතිතුමාගේ වර්ෂ පූර්ණය සහ නාමල් රාජපක්‍ෂ මැතිතුමාගේ යෝජනාවක් පරිදි හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම, දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනයක් ඉදි කරනවා. ඇත්තටම මේ වසරකටත් ආසන්න කාලයකදි තමයි මේ කටයුතු සියල්ලම මුල ආරම්භ කරල තියෙන්නෙ. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට විශේෂ අවස්ථාවක් ලැබුනා. විශේෂයෙන් ඉසුරු දොඩංගොඩ මැතිතුමාගෙ මැදිහත් වීමෙන්, නාගොඩට එකක් වුනාට, උඩුගම දකුණ ප්‍රදේශයේ අපේ චන්ද්‍රසිරි වනිගරත්න මැතිතුමාගේ කොට්ඨාසයටත් ක්‍රීඩාංගනයක් ලබා ගන්න අපට හැකියාව ලැබුණා. මම හිතන්නෙ උනන්විටිය ප්‍රදේශයේ අනිත් ක්‍රීඩාංගනයේ වැඩ ආරම්භ කළා. සභාපතිතුමාල සම්බන්ධ වුනා. එතකොට මේ විදිහට හැම පැත්තකින්ම සංවර්ධනය සිදු කළා. මේ කොවිඩ් වසංගතය කියලා සංවර්ධන කටයුතු පැත්තකට දැම්මෙ නැහැ.

ඒ වගේම මට අහන්න ලැබුනා මේ ශ්‍රම බලකාය පිළිබඳව. මේ ශ්‍රම බලකාය ඒ ජී ඔෆිස් එකේ ඉන්නෙ. තවම ඒ මිනිස්සු පුහුණු කරනවා. මේ පුහුණුවෙන් පස්සෙ හැම ක්ෂේත්‍රයකටම මේ පිරිස යොමු කරනවා. වෙනද වගේ මේ මන්ත්‍රීගෙ ලියුමට රැකියාවල් දෙන්නෙ නැහැ. ගෝනදෙනිය ප්‍රදේශයේ අපි සම්බන්ධ වෙච්ච තරුණ පිරිස මේ වෙන කොට වැඩ කරන්නෙ පෝද්දල ගොවි පොලේ. ඒ ගොවි පොලේ ඔවුන්ට වෙනම ඒරියා එකක් වගා කරන්න ලබා දීල තියෙනවා. තව කොටසක් උඩුගම ඩිපෝවෙ පුහුණුව ලබනවා. මේ විදිහට පුහුණුව ලබලා, යම් යම් ස්ථානවල පුරප්පාඩුත් එක්ක ඒ ස්ථානවලට සුදුසු අය තෝර ගන්නවා. මේ සභාවටත් සෞඛ්‍ය කම්කරුවන් අනිත් කම්කරුවන් ඉදිරියෙදි මේ තෝරාගැනීමත් එක්ක අපට ලැබෙන්න සලස්සාවි. ඉතාම සාර්ථක වැඩ පිළිවෙලක්. මොකද අපි දැක්ක පහුගිය දවස්වල මන්ත්‍රීගෙ ලියුමට රැකියාවල් දුන්නා. දැන් උඩුගම විද්‍යාලයේ ඉන්නවා ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් වැඩ කරනවා. ඔහුගේ තනතුර සෞඛ්‍ය කම්කරු. හැබැයි ඔහු ඇවිල්ල තියෙන්නෙ දේශපාලන අධිකාරියෙන් නිසා ඔහු සෞඛ්‍ය කම්කරු තනතුරේ වැඩ කරන්නෙ නැහැ. ඔෆිස් එකට වෙලා වාඩිවෙලා ඉන්නවා. මම හිතන්නෙ මේක මේ හැම ආයතනයකටම තියෙන ගැටලුවක්. තනතුර එකක් කරන්නෙ තව එකක්. එතකොට එහෙම වුනාම, උදාහරණයක් විදිහට මට මතකයි. ඒ දවස්වල සභාවෙත් මාර්ග කම්කරු පත්වීම් තියෙන අය ඔෆිස් එකේ හිටියා. එතකොට මාර්ග කම්කරුවො නැහැ. මේ ගැටළුව හැම රාජ්‍ය ආයතනයකම තියෙනවා. මම වැඩ කරන පෙට්‍රෝලියම් ආයතනෙත් එහෙමයි. උපාධි ධාරීන් ඉන්නවා කම්කරුවො විදියට. එතකොට සමහර වෙලාවට මේ ගොල්ලන්ට කම්කරුවො විදිහට වැඩ කරන්න කියන එකත් ඒකත් ගැටලුවක්. එතකොට මේ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කරලා, කම්කරුවන් අවශ්‍ය තැන්වලට ඒ කම්කරුවො යොදලා, විශේෂයෙන් අඩු ආදායම් ලාභීන්ට මේ රැකියාව ලැබීමත් එක්ක මුලු පවුලක්ම ජීවත් වෙනවා. එතකොට ඒ පවුලෙ තව ජීවත්වෙනවනම් ඉලෙන ගන්න නංගිලා මල්ලිලාටත් මේක විශාල ශක්තියක් බවට පත්වෙනවා. මේ තත්වය වැරදි දෙයක් විදිහට දකිනවනම්, ඇත්තටම ඒක බොහොම කණගාටුවට කරුණක්.

ඒ වගේම දෙන්න බැහැ කියපු උපාධි ධාරීන් 60000 කට රැකියා දීල ඉවරයි. ගුරු හිගය ඇතුලු සියලු ක්ෂේත්‍ර වලට 60000 ක් මේ වෙනකොට පත්වීම් දීලා ඉවරයි . මීට අමතරව අපනයන බෝග, තේ කුරුඳු සම්බන්ධව විශේෂ වැඩසටහන්, විශේෂයෙන් රමේෂ් පතිරණ මැතිතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා අපේ ප්‍රදේශයට තේ සම්බන්ධව විශේෂ වැඩසටහන් කිහිපයක්ම කරලා තියෙනවා. වැඩිදුරටත් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ කියන්න තියෙන්නෙ මේච්චරයි. 'කවුරු විකසිත කරලමු නෙලුම් පොහොට්ටුව බැදී සිටින් මිතුරේ, අන් අයගේ හිස් කතා ඉවත හැර දැය නංවමු මිතුරේ' කියල තමයි කියන්න තියෙන්නෙ. ඒක කියන ගමන් මේ කොවිඩ් මැද මේ සුලු කාලෙකින් මේ කරන සංවර්ධනය මේ පත්කරපු ආණ්ඩුව ගැන, මේ කරපු සටන ගැන, අවුරුදු පහක් තිස්සෙ කරලා මේ පත්කරපු ආණ්ඩුව ගැන තියෙන්නෙ, බොහොම ආඩම්බරයක්. බොහොම ශක්තියක්. බොහොම ජවයක්. ගැම්මක් කියන එකත් ප්‍රකාශ කරමින්, මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, අපට දැන් ඇප්තොප්වත්තෙ පොල් ඉඩමෙ අයිති නැහැ. ඒක අපි ටෙන්ඩර් එකෙන් ගත්තෙ නැහැ. මොකද ඉල්ලුව ගානට දුන්නෙ නැහැ. ප්‍රා දේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් එක 65 පන්දාස් ගණනක්. මෙම ඉඩම පෙර තිබුන තත්වයටම අභාවයට ගිහිපු බව මම පිළිගන්නවා. දැන් ඒ ඉඩමෙ අක්කර 05 ක ප්‍රමාණයක් සභාවට අත් කර ගැනීම සඳහා වට මැනීමට මුදල් ගෙවලා තියෙනවා. දැන් පොල් ඉඩම පවරා ගැනීමේ කටයුතු කරගෙන යනවා. අක්කර 35 ක් අපට දීල තිබුනා. නමුත් අක්කර 35 මේ වෙලාවෙ ලැබෙන්නෙ නැහැ. අක්කර පහක අයිතිය ලබාගැනීම සඳහා දැන් රුපියල් පනස් හතර දාහක් මිනින්දෝරු ගාස්තු බැදලා තියෙන්නෙ, දැන් වට මනින්න එනවා.

වට මැන්න ගමන් වැට ගහනවා. ඊට පස්සෙ තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අපට අයිතිය දෙන්නෙ. එතකොට අපට කිසි ප්‍රශ්නයක් නැහැ. දැනට අපට අයිතියක් නැහැ.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, උඩවැලිවිටිය කොට්ඨාසයේ, නෙරංජලී මන්ත්‍රීතුමිය චෝදනාවකුත් කළා. ඥාති මළ ගෙදරකට වීපී පහන් සවි කර, මාර්ගය ශුද්ධ කලා කියලා. ඔබතුමාට මමයි සඳහන් කළේ. උඩවැලිවිටියෙ අපේ මන්ත්‍රීතුමියල යන පාරෙ ඉදලා මෝදර කඩේ දක්වා කිලෝ මීටර් හතරක් විතර පාර යන්නම බැරුව තිබුනා. ඒ සේවකයො ටිකත් කැප වෙලා වැඩ කළා. මළ ගෙදර අදාල නැහැ. ඒකට මළ ගෙදරට දාපු ලයිට් එකත් අපි ගැලෙව්වෙ නැහැ. ඒ වගේම මන්ත්‍රීතුමියගෙ ගේ ඉස්සරහ ලයිට් එකත් අපි එදාම හදල දුන්නා. ඒ වගේම කොට්ඨාසය තුලම විදුලියත් සකස් කළා. මළ ගෙදර අදාල තාවයක් නැහැ. ඊට කලින් අපි ඒ වැඩේ පටන් ගත්තෙ. ඒකෙදි මන්ත්‍රීතුමියගෙ නිවසට යන පරෙත් තණකොළ කැපුවා. ඒ සම්බන්ධයෙන් ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම ඒ පාරෙ එතුමිය සඳහන් කළා වගේම සුභාෂි මන්ත්‍රීතුමියත් සඳහන් කරාවි. ගම්මැද්දෙගොඩ අලුත් පාලම දාපු තැන ඇත්තමට ඒ සඳහා කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මොකද අපේ සභාවෙ කම්කරුවන් ටික දාලා හරි, අපි පොඩි කොන්ක්‍රීට් එකක් දාල හරි ඒක කළොත් හොදයි කියල හිතෙනවා. එක පාරටම බයිසිකලයක් පාරට දාන්න තියෙන්නෙ. එතකොට එක පැත්තකින්වත් වාහනය නවත්ව ගන්න බැහැ. සුභාෂි මන්ත්‍රීතුමිය ඒ පාර පිළිබඳව මීට පෙර සභා දෙකකට කලින් යෝජනාවකට දාලා ඇස්තමේන්තුත් කරලා තියෙන්නෙ. ඒ නිසා මම විශ්වාස කරනවා. මම ඉල්ලීමක් කරනවා. එම මාර්ගය කිලෝ මීටර් දෙකකට ආසන්න ප්‍රමාණයක් තියෙනවා. ඒ අදාල යෝජනාව මේ සභාවෙ යෝජනාවක් හැටියට, සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන්න. මම හිතන්නෙ සුභාෂි මන්ත්‍රීතුමිය ඒ පාරට රුපියල් ලක්ෂ පහක් පමණ මෙවර යොමු කරල තියෙනවා. ඒ පාරෙ මමත් රුපියල් ලක්ෂ දහයක් එහා කොනෙන් දාල තියෙනවා. නමුත් ඒ මාර්ගයේ වැඩ අවසන් කරන්න ඒක ප්‍රමාණවත් වෙන්නෙ නැහැ. ඒ නිසා සම්බන්ධීකරණ කමිටුවට ඒ යෝජනාව දාලා, කාපට් ව්‍යාපෘතියට ඒ මාර්ගයත් ඇතුලත් කර දෙන්න කියන ඉල්ලීම මේ වෙලාවෙ කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩවැලිවිටිය ප්‍රජාශාලාව සභාවට පවරල තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එහි විදුලිය ලබා ගැනීම සඳහා අවශ්‍ය පෝරම ලබාගෙන අවශ්‍ය කටයුතු සිදු කරලා තියෙනවා. මම හිතනවා ඒ සඳහා ඔබතුමාගෙ අනුග්‍රහය ලබා දීලා, විදුලිය ලබා ගැනීමට සහ එය පින්තාරු කිරීමට අවශ්‍යතාවයක් තියෙනවා. මොකද හිරිකඩ ගහලා, දැල් එහෙම දැන් දිරායන තත්වයට පත්වෙලා තියෙනවා. ඒක නිසා දැන්ම අපි ඒක පින්තාර කළොත්, ඒකෙ දැල් ටික පරිස්සම් කර ගැනීමේ හැකියාවක් තියෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ විශේෂ අවදානය යොමු කරන්න කියන ඉල්ලීම මේ වෙලාවෙ කරනවා. ඒ වගේම කැප්පිටියාගොඩ සිට උඩවැලිවිටිය දක්වා යන කොන්ක්‍රීට් පාලම අධියර කීපයක් ඇවිල්ලා, ඒක නිරීක්ෂණය කළා. දැන් මාස හයක් විතර කාලයක් ගත වුනා. ඒ පාලම තව ඉතා නොදුරු දිනකින් ගඟට කඩාගෙන වැටෙන තත්වයට පත්වෙලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒ පිළිබඳව, අදාල අංශ දැනුවත් කරලා, ඒ පිළිබඳව කටයුතු කරනු ඇතැයි කියලා බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම විශේෂයෙන්ම සමෘද්ධි සහනාධාරය පිළිබඳව දැවැන්ත චෝදනා සහ විවේචන වෙච්ච අවස්ථාවෙ, සෑම රජයක්ම පත් වුනාට පස්සෙ ඒ රජය පත් කරන්න වෙහෙස මහන්සි වුන මිනිස්සුන්ට උදවු කිරීම ස්වභාවයක්. ඒක පක්ෂ පාට බේදයෙන් තොරව කවදත් වෙන වැඩක්. ඒ වගේම පහුගිය වකවානුවෙදි මේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, මේ වන විට සමෘද්ධි සහනාධාරය ලබා දීලා, එක්දහස් තුන්සිය ගණනක අතිරික්තයක් තියෙනවා. ඒ කියන්නෙ සමෘද්ධි කාඩ් වැඩි ප්‍රමාණයක් අපි මේ වන විට නාගොඩ ප්‍රා දේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දීලා තියෙනවා. මේ මොන විදිහට කවුරු මොනව කිව්වත්, මේ සමෘද්ධි සහනාධාරය වැඩි කිරීමේ හැකියාවක් මේ වන විට නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල නැහැ. ඒ සඳහා අපේ රජය මේ සමෘද්ධි වැඩසටහනේ චක්‍ර ලේඛය වෙනස් කරලා අපි වෙන සැරවල්වල කළේ, කණ්ඩායමකින් කොටසක් ඉවත් කරලා, තවත් කණ්ඩායමකට සමෘද්ධි සහනාධාරය ලබා දීම. ඒක මේ සැරේ වෙනස් කරලා, රුපියල් 50000 හෙ ඉදලා ලක්ෂ 20 දක්වා සමෘද්ධි සහනාධාරය ලැබෙන සෑම පවුලකටම සමෘද්ධි සහනාධාරය ඉවත් කරනවනම්, ඒ සමෘද්ධි සහනාධාරය ඉවත් කරන පවුල සවිබල ගැන්වීමේ වැඩපිළිවෙලක් සූදානම් කරල තියෙනවා. ඒ සඳහා රුපියල් 50000 හෙන් පටන්ගෙන රුපියල් 20000 දක්වා එක සමෘද්ධි පවුලකට රුපියල් 20000 ක ආධාරයක් නෙවෙයි ඒ පවුල සවිබල ගන්වන්න 4.78 පොලියට රපියල් ලක්ෂ 20 ක මුදලක් දක්වා ඒක 100000 දක්වා සමෘද්ධි බැංකු මගින් ඒ කටයුතු කරන්න පුලුවන් කම ලැබිල තියෙනවා. ඊටත් එහා ගිය දේවල් සම්බන්ධී කරණ කමිටුවෙ අනුමත කළාට පස්සෙ, සම්බන්ධී කරණ කමිටුව අනුමත කරලා ඒ ඕනෑම පවුලකට , පක්ෂ පාට බේදයෙන් තොරව සමෘද්ධි සහනාධාරය භාර දෙන අයට, ඒ වගේම සමෘද්ධි සහනාධාරය හිමි නොකියන කණ්ඩායමකට, සමෘද්ධිය ලැබිල තියෙනවනම් ගමේ ග්‍රාමීය කමිටුවක් මගින් තීරණය කරලා, ඒක ගමේ විදුහල්පතිවරයා ඒ වගේම පළාත් පාලන නියෝජිතයා විහාරස්ථානයේ හාමුදුරුවො ඒ වගේම ග්‍රාම නිලධාරිතුමා සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමා, ආර්ථික සංවර්ධන නිලධාරී, ඒ වගේම කෘෂි පර්යේශන නිලධාරී, පවුල් සෞඛ්‍ය සේවිකාව ඒ වගේ ගමේ ග්‍රාමීය කමිටුවක් මගින් ඒක පැහැදිලිව තීරණය කරලා, සමෘද්ධි සවිබල ගැන්වීමේ වැඩපිළිවෙලක් සූදානම් කරල තියෙනවා. ඒ නිසා පහුගිය වකවානුවෙදි පොරොත්තු ලේඛනයේ විශාල දූප්පත් පිරිසක් ඉදිද්දි, ඒ පිරිස පොඩ්ඩකට අමතක කරලා, වෙනත් කණ්ඩායමකට සමෘද්ධිය ලබා දෙන්න කටයුතු කරලා තිබුනා. ඒක ස්වභාවයක්. ඒක පත්වෙච්ච ආණ්ඩුවෙ ඉදිරි පැවැත්ම සඳහා කරන දෙයක්. ඒවට දොස් කියලා, අපි ඒව කතා කරන්න යන්නෙ නැහැ. නමුත් මෙවර වැඩපිළිවෙලක් සූදානම් කරල තියෙනවා. පක්ෂ පාට බේදයෙන් තොරව ඒක සවිබල ගැන්වූ පවුල් හැටියට ඉවත් කරලා, ඒ අයට කතා කරලා, ඒ අය කරන්න මොකක්ද ලබාපොරොත්තු වෙන්නෙ කියලා සාකච්ඡා කරලා, ඒ අය වෙනුවෙන් යම් වැඩපිළිවෙලක් සූදානම් කරල තියෙනවා. ඒක නිසා ඒක ඉතාම හොඳ දෙයක් හැටියට මම දකිනවා.

ඒ වගේම ග්‍රාම නිලධාරී වසමකට රුපියල් ලක්ෂ 20 ගානෙ, මාර්ග සංවර්ධනය සඳහා මේ වෙන කොට ප්‍රතිපාදන ලැබිල තියෙනවා. බලාපොරොත්තුව මැයි මාසෙ 15 වෙනිදට කලින් වැඩ අවසන් කරන්න. ඒ නිසා කඩිනම් සංවර්ධන ක්‍රියාවලියක් අපේ රජය තුලින් සෑම ග්‍රාම නිලධාරී වසමකම, ලක්ෂ 20 යෝජනා මේ වෙන කොට අරගෙන, ඒ සඳහා කොන්ක්‍රීට් සහ කුට්ටි ගල් ඇතිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙනවා. ඒ සඳහා මේ වන විටත් අදාල කොට්ඨාසවල ජන සභා තියලා, ඒ ජන සභා වලින් යෝජනා අරගෙන, ඒ කටයුත්ත සූදානම් කරමින් පවතිනවා. ඒ නිසා ඒ පිළිබඳවත් සඳහන් කරමින් විශේෂයෙන්ම අපේ කොට්ඨාසය පිළිබඳ, නාගොඩ පොලීසිය පිළිබඳව සඳහන් කරමින් කතා කල අපේ ජයවීර මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා. මේ පිළිබඳව මටත් ඒ ප්‍රදේශයේ මිනිස්සුම තමයි ඒ සිද්දිය පිළිබඳව සඳහන් කළේ. අපේ නාගොඩ පොලීසියෙ ස්ථානාධිපතිතුමා එදා රාජකාරි කළේ නැහැ. එතුමා නිවාඩු ගිහිල්ලා හිටියෙ. ඒ නිවාඩු ගිහිල්ල ඉන්න අතරතුරේදි මේක බරපතල වැරැද්දක්. මේ වැරැද්ද කාටවත් ඇගිල්ල දික් කිරීමක් නෙවෙයි. නමුත් අපි මන්ත්‍රීවරු 27 දෙනාම කොයිම මොහොතකවත් මත්ද්‍රව්‍ය සඳහා ඒ වගේම නරක වැඩවලට අනුබල දෙන

කණ්ඩායමක් නෙවෙයි. මේ අපේ කණ්ඩායම තුල එහෙම අය නැහැ. නමුත් මීට වෙනත් පරිසරයක් තමයි දේශපාලඥයො ලග තියෙන්නෙ. ඔවුන් ගස් කපන්න, කසිප්පු පෙරන්න, හොරකම් කරන්න ඒ වගේ ඒව තමයි ඇතැම් අවස්ථාවල අපට අහන්න දකින්න ලැබෙන්නෙ. නමුත් අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ, අපි මන්ත්‍රීවරු හින්ද කතා කරනව නෙවෙයි. නමුත් ඉතාම හොද කණ්ඩායමක්. අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මේ 27 දෙනාම උත්සාහ දරනවා. තමන්ගේ කොට්ඨාස තුල තිබෙන මේ නීති විරෝධී මත්පැන්, ඒ වගේම ගස් කැපීම්, වැනි දේවල් නවත්වන්න. නමුත් කණගාටුදායක සිදුවීම, එක්තරා නිවසකට පොලීසියෙන් හොර මත්පැන් අල්ලන්න යන කොට පොලීසියෙ වගකිව යුත්තෙක් ඒ නිවසෙ, ඒ වෙලාවෙ මත්පැන් පානය කරලා. මම ඇස් දෙකෙන් දැක්කෙ නැහැ. නමුත් මත්පැන් පාවිච්චි කර කර ඉදලා. එයා බයිසිකලෙත් අරගෙන එළියට බැහැල ගියාට පස්සෙ කසිප්පු පැකට් පෝර බෑග් එකක් විතර සමඟ ඒ අදාල පුද්ගලයත් අත් අඩංගුවට අරගෙන ගෙනාවා. මේ පිළිබදව ඇත්තටම කණගාටුයි. ඒ පිළිබද මම ඊට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මොකද අප්‍රසන්නයි. ඒ නිසා ඒක ඇත්තටම සත්‍ය සිදුවීමක්. ඒ පිළිබද එච්චරයි. මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ.

ඒ වගේම මේ රටේ අධ්‍යාපන රටාව, නිපුනතාවය පදනම් නොකරගෙන , මේ රටේ අධ්‍යාපනය පොතපතේ දැනුමට කණ්ඩායමක් බිහි කරලා, අද නිර්මාණශීලී අදහස් තියෙන අය බිහිවෙන්නෙ නැහැ. මොන රැකියාව, මොන තත්වෙට, මොන තැන ලබා දුන්නත්, නිර්මාණ ශීලී අදහස් තියෙන තරුණ පිරිසක් අද අපෙන් ඈත් වෙලා යනවා. ඒක මේ සමාජයේ අධ්‍යාපන ක්‍රමය තුල තියෙන ඉතාම දුර්වලතාවයක් හැටියට මම දකිනවා. නිපුනතාවය පදනම් කරගෙන අධ්‍යාපනය නොමැති වීම නිසා අද කොච්චර විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබුවත්, ඊට එහා අධ්‍යාපනය ලැබුවත්, පතපොතට සීමා වෙලා, අත් දැකීම් වලින් පරිපූර්ණ නොවීම, අද මේ රාජ්‍ය තන්ත්‍රය විශාල වශයෙන් කඩා වැටෙන්න පළවෙනි හේතුව ලෙස මම දකිනවා. ඒක නිසා තමන්ට පැවරෙන කාර්යය නිර්මාණශීලීව, හැම රාජ්‍ය ආයතනයකම මේ ඉන්න පරන මිනිස්සු ටික නැතිවුනාට පස්සෙ, මම හිතන්නෙ නැහැ. ඉදිරියෙදි මොන වගේ තත්වයක් මේ රාජ්‍ය ආයතන තුල සිදු වේද කියලා. ඒ කියන්නෙ නිර්මාණශීලී අදහස් ඒ වගේම නිර්මාණ ශීලී වැඩ පිළිවෙලක්, විශේෂයෙන් අපේ ප්‍රාදේශීය සභාව ගත්තම, අපේ ප්‍රාදේශීය සභාව මේ වන විට අංග කීයපයකින් අනිවාර්යයෙන් සම්පූර්ණ විය යුතුයි. ඒ කිසිම අංගයක් මම දකින්නෙ නැහැ. මාර්ග නඩත්තු ඒකකයක් අපට අනිවාර්යයෙන් තියෙන්න ඕන. යම් හෙයකින් මොනව හරි දැන් අපි ඉතා විශාල වපසරියක් තියෙන බල ප්‍රදේශයක්. ඒ වගේම අපේ අර කාපට් මාර්ගවලින් අපේ පාරවල් මම එදත් සම්බන්ධීකරණ කමිටුවටත්, අපේ ගරු සභාපතිතුමාට ඉල්ලීමක් කළා. අපට නඩත්තු කර ගන්න බැරි විශාල පාරවල් ප්‍රමාණයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ පාරවල් ප්‍රමාණය ඔබතුමා නෙවෙයි කවුරු සභාපති වුනත්, ඒ පාරවල් ටික අපට නඩත්තු කර ගන්න බැහැ. ඒ තාක්ෂණය අපි ලග නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි, හදුනාගත්තු පාරවල් කීපයක් හරි සම්බන්ධී කරණ කමිටුවට යොමු කරලා, මධ්‍යම ආණ්ඩුවට හරි පවරලා, ඒ නඩත්තු කිරීම් කටයුතු, අඩුතරමින් තණ කොල ටික කපලා, තාර දාලා, වලවල් ටික වහන්න හරි පුලුවන් තත්වෙකට හදා ගන්න. අපට බැරි ටික අපි ඒ අයට පවරන්න ගරු සභාපතිතුමාගෙ අවදානය යොමු කරන්න කියන ඉල්ලීමත් මේ වෙලාවෙ කරනවා. අපි මොනව කතා කළත්, අපි මොනව හරි වැඩ පිළිවෙලක් හදලා, මේ නිලධාරිත් එකතු කරගෙන හරි ගමනක් යන්න කියන ගෞරවණීය සිහිපත් කිරීම කරනවා.

අවසාන වශයෙන් අපිට විශාල සේවාවක් කරපු, මට මතකයි එදා අපි දේශපාලනය කරන කාලෙ, අපි වෙනුවෙන් පොලීසියේ ඒ වගේම යම් අවස්ථාවකදි කරදරයක් වුනහම, මොන දේශපාලන අධිකාරිය තිබුනත්, අපි එදා විපක්ෂෙ ඉන්න කාලෙ අපට පොලීසියට කතා කරන්න, ඒ වගේම අපට යම් දුක් ගැනවිල්ලක් කියන්න හිටපු එකම මන්ත්‍රීවරය තමයි ආරියතිලක මැතිතුමා. අද කවුරු මොනව කතා කළත්, මම විශ්වාස කරනවා. එදා අපි අර 89 කාලෙත් එතුමන් යම් ලොකු සේවාවක් අපේ ජනතාව

වෙනුවෙන් කළා. පොලීසියට ගිහිල්ලා, පොලීසියෙදි යම් ප්‍රශ්නයක් වුනානම්, එතනදි කතා කරලා, ඒ වගේම මහා මාර්ග ඇමතිවරයා හැටියට එදා ඒ මළගම අවස්ථාවෙත් නන්දන මන්ත්‍රීතුමයි මමයි කතා කළේ, මහා මාර්ග ඇමතිතුමා කාලෙ ඉතා විශාල සුවිශේෂී මාර්ග පද්ධතියක් අපේ නාගොඩ ප්‍රාදේශීය සභාව තුල සංවර්ධන කටයුතු කරන්න එතුමන් පළාත් මහා මාර්ග ඇමතිවරයා හැටියට ලොකු කාර්යය භාරයක් අපට එදා ඉෂ්ඨ සිද්ද කරලා දුන්නා. ඒ නිසා එතුමන් දීර්ඝ කාලයක් දේශපාලනයේ ඉදලා, මේ දේශපාලනයේ තියෙන අඩු ලුහුඩු කම් නිසා, එතුමට පාර්ලිමේන්තුවට යෑමේ වරම අහිමි වුනත්, මේ ගාල්ල දිස්ත්‍රික්කය තුල බිහි වෙච්ච ශ්‍රේෂ්ඨතම දේශපාලඥයෙක් හැටියට යූ ජී ඩී ආරියතිලක මැතිතුමන් ඉතාම සද්භාවයෙන් මේ වෙලාවෙ සිහිපත් කරන ගමන්ම, මේ මුලු ගරු සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාම ගරු සභාපතිතුමන්ටත් ස්තූති වන්ත වෙනවා. මැදිහත් වෙලා ඒ අවසන් කටයුතු සඳහා මේ ස්ථානයට ගෙනැල්ලා අපටත් අවසන් ගෞරව දක්වන්න, අපිත් ඒකට කොටස් කාරයන් කරන්න ඔබතුමා යම් ශක්තියක් යෙදෙව්වා. ඒ නිසා අපි යූ ජී ඩී ආරියතිලක මැතිතුමන්ට උතුම් අජරාමර අමාමහ නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, විශේෂයෙන්ම අපි අවසාන වශයෙන් සඳහන් කරන්න ඕන. අර විදුලිය නොමැති ජනතාවට විදුලිය ලබා දීම සම්බන්ධව. ඒ ලබා දෙන විදුලිය වෙනුවෙන් මුදල් කොයි වෙලාවකවත් අය කර ගැනීමක් කොහෙන්වත් කරන්නෙ නැහැ. ඒක සමෘද්ධි සහනාධාර කියල නෙවෙයි ග්‍රාම නිලධාරීතුමා අඩු ආදායම් ලාභී කියලා අනුමත කරනවනම්, හැම දෙනාටම ඒ විදුලිය ලබා දීමේ කටයුත්ත සූදානම්. මේ වෙන කොටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා අවස්තාව තියෙනවා. අඩු ආදායම්ලාභී සියලු දෙනාට ලොකු අවස්තාවක් ලැබිල තියෙන්නෙ. විදුලිය නොමිලෙ ලබාදෙනවා වගේම සමෘද්ධි වැඩපිළිවෙල යටතේ ගෙයක් වයරින් කර ගන්න අඩු පොලියට ණය මුදලක් හැටියට රුපියල් 20000 දෙනවා ඒ සඳහාත් විශේෂ සුවිශේෂී වැඩපිළිවෙලක් සූදානම් කරල තියෙනවා. ඒ සඳහාත් සියලු දෙනා යොමු කරන්න. පක්ෂ පාට බේදයෙන් තොරව, තමන්ට ඒ අවස්තාව උදාකර ගැනීමේ හැකියාව තියෙනවා. ඒ සඳහාත් අපි ආරාධනා කරමින්, අවස්තාව ලබා දීම පිළිබඳව ගරු සභාවට ස්තූති කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා ඔය ප්‍රකාශ වගකීමෙන් ප්‍රකාශ කරන්න. මොකද දන්නවද මම දැක්ක ඊයෙ පෙරේද පත්තරේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමෙක් ජනාධිපතිතුමාගෙ නම් සඳහන් කරලා, ඒ පාර ඒක සී අයි ඩී එකට දීලා, අපි මේව කතා කල යුතු ප්‍රශ්න. නමුත් අපි යම් යම් ඒව ප්‍රකාශ කිරීමෙදි වගකීමක් ගන්න වෙනවා. ඒ ප්‍රකාශයන් ඉතා බැරෑරුම්. ඕවා ප්‍රශ්නකාරී වෙනවා ඒ නිසා මත ප්‍රකාශ කිරීමෙදි වගකීම ගන්න.

**ගරු මන්ත්‍රී වසන්ත පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. සභාපතිතුමනි, නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන ඌරල ලහිරු පෙරපාසලේ පසුගිය දවසක තිබුනු සුළු උත්සවයකට ඔබතුමත් මමත් සහභාගි වුනා. ඒ පෙර පාසල අපේ සභාව මගින් පාලනය වුනත්, ඒ ශාලාව ගැමිදිරිය ශාලාව. ගැමිදිරිය සමිති සමාගම සතු ඒ ගොඩනැගිලිවල තමයි පෙරපාසල පවත්වාගෙන යන්නෙ. ඒත් අර ආරක්ෂිත දැල් කිහිපයක් දිරාගොස් තියෙනවා. ඒ ආචාර්යය මහත්මියත්, දෙමාපියනුත් ඒ අවස්ථාවෙදි අපෙන් ඉල්ලීමක් කළා. පුලුවන්නම් ඒ දැල් ටික ලබා ගැනීම සඳහා සභාවේ අනුග්‍රහයක් දක්වන්න කියලා. ඒ ගැන ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම මීට සභා වාර දෙක තුනකට ඉහතදී සඳහන් කළා. මේ පොල් මිල ඉහල යෑමත් අප ප්‍රදේශයේ පොල් ගස් කැපීමත් සම්බන්ධව. මම නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කළා. ඒක සම්බන්ධී කරණ කමිටුවට යොමු කරන්න කියලා. ඊට පසුව පැවති සම්බන්ධී කරණ කමිටුවටත් ඒ යෝජනාව

ගිහින් තිබුනෙ නැහැ. ඇත්තටම සභාපතිතුමනි, ඔබතුමාට බලය තියෙනවා. මේ අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේවත්, මේ පොල් ගස් කැපීම නතර කරන්න. මොකද දිනකට පොල් කඳන් ලොරි දෙකක් ගාල්ල ප්‍රදේශයට ප්‍රවාහනය කරනවා. ඉතිං මේකත් අප ප්‍රදේශයේ පොල් මිල ඉහළ යාමට එක් හේතුවක් කියල තමයි මම දකින්නෙ. ඒ නිසා ඔබතුමාට කරන්න බැරිනම්, මේක දිස්ත්‍රික් කමිටුවට හරි යොමු කරලා, මේක පිළිබඳ අවධානය යොමු කරන්න. මේ සඳහා තීරණයක් ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද අපි මේක මාස දෙක තුනකට කලින් කතා කරලා, යලිත් කතා කරන්න ඕන. මොනම දෙයක්වත් සිද්ද වෙන්නෙ නැහැ. ඒ ගැන සඳහනක් කළා නම්, අපිට ලිඛිතව දැනුම් දීමක් කරන්න කියල තියෙනවා. මේ වනතුරු මොනම දෙයක්වත් නැහැ. මන්ත්‍රීවරු හැමදාම ඔය ප්‍රශ්න තමයි කතා කරන්නෙ.

ඒ වගේම මම කතා කරන්න කැමතිත් නැහැ. අපේ සහබන්දු මන්ත්‍රීතුමා කතා කළා ඌරල වල් බිහි වුන පොදු ලිඳ සම්බන්ධව. ඒක දැන් මම සභාවට ඇවිල්ල මාස දෙකකින් පස්සෙ ඉඳල කතා කරනවා. තව වෙනතුරු විසඳුමක් ලැබුනෙ නැහැ. දැන් එතන ලිඳට උඩින් විශාල ජල ටැංකියක් වගේ වලක් හැදිල තියෙනවා. එතන මදුරු කීටයො ඉන්නවා. ලොකු ප්‍රශ්න. ඇයි මේ මිනිස්සුන්ට එක්කො නඩු පවරන්නෙ නැත්තෙ. මේ ඩෙංගු මදුරු ව්‍යාප්තිය රටේ හැම ප්‍රදේශයකම තියෙනවා. ඒ ගැන මොනවත් හෙවිල්ලක් බැලිල්ලක් නැහැ. අපේ නිලධාරි මහත්තයෙක් යන්නෙත් නැහැ. මොනම දෙයක්වත් නැහැ. විශාල ජල ටැංකියක් වගේ ලීටර් හාර පන්දාහක වතුර ඒ ස්ථානයේ තියෙනවා.

ගරු සභාපතිතුමනි, මම දන්න ආකාරයට ඕක රිෂිවේශන් පටියක් තියෙන්නෙ. ඔතනින් මෙහා තැපැල් කඩේ ගිල්බට් මහත්තය තමයි භුක්ති වින්දෙ. නමුත් එතුමා මිය ගිහින්. ඒ හරිය ප්‍රාදේශීය සභාව සතු පොදු නාන ලිඳ. ඉතිං ඕක පාවිච්චි කරන්න බැහැ කියන්නෙ ලිඳ කැඩිල නිසා. නැත්නම් අපේ හිටපු සභාපතිතුමා සාක්ෂි දරාවි. විශාල පිරිසක් ඕක ප්‍රයෝජනයට ගත්තා. නමුත් සභාපතිතුමනි, ඔය ඉදිකිරීම් කළ පුද්ගලයා හැමදාම කියනවා. ළිඳ හදල දෙනවා කියල කිසිම ලිඛිත පොරොන්දුවක් දීලා නැහැ. අපේ සභාකාලය වසරක් තියෙන්න පුලුවන්. මාස හයක් ගත වෙන්න පුලුවන්. ඊට පස්සෙ ඔබතුමා නැතුව වෙන සභාපතිවරයෙක් මෙතනට පත් වෙන්න පුලුවන්. ඒව කියන්න බැහැ. නමුත් ඔබතුමා මේක නිරාකරණය කරල දුන්නොත්, ඉදිරියෙදි අපේ ගමෙන් මේ ස්ථානයට එන මන්ත්‍රීවරයෙක් ඔබතුමාට දොස් පැවරීමක් කරන එකක් නැහැ. ඒ නිසා තමයි මම ඔබතුමාට කියන්නෙ. මේක පුලුවන්නම් කරන්න. මම කතා කරන්නම කැමති නැති මාතෘකාවක්. නමුත් මෙතුම කතා කළ නිසා මම ඒ අදහස් ටික ප්‍රකාශ කළේ.

ඒ වගේම සභාපතිතුමනි, තවම අපේ අර පූට්ටු පාලමේ ඇදි දෙක සවි කළේ නැහැ. මාර්ගයත් අබලන්. දෙපැත්තෙන් ලොකු අනාරක්ෂිත භාවයක් තියෙනවා. ඒ ඇදි සභාවට ගෙනැල්ල තියෙන්නෙ. ඒ නිසා එයත් ඉක්මනින් කරල දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම ඔබතුමා අපේ බල ප්‍රදේශයේ විදුලිය 90% ක් විතර සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරල දුන්නා. එකක් දෙකක් හැර අර නිවන්නෙ නැති තැන්වල ඒවා දැම්මෙ නැහැ. මගෙනුත් ඇහුවා. මම කිව්වා මම දන්නෙ නැහැ. ඇත්තටම දිවා කාලයේදී නිවන්නෙ නැති ලයිට් කීපයක් තියෙනවා. අපිත් කිව්වා ඒව ගලවන්න කියලා. ඔබතුමා අවසරයක් දෙන්න. ඒ වගේ ස්ථානවල තියෙන වීදි පහන් ගලවලා, අවශ්‍ය තැනකට සවි කරන්න. එහෙම කීපයක් අත හැරියා. පැය 24 ම ක්‍රියාත්මක වෙන බල්බ් කීපයක් තියෙනවා. ඒව අලුත් වැඩියා කළේ නැහැ. දින කීපයක්ම අපේ ඌරල කොට්ඨාසය තුල සේවකයන් යොදවලා, විදුලිය යථා තත්වයට පත් කර දීම සම්බන්ධව ඔබතුමාට ස්තුති වන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුලවත්, මේ පොල් ගස් කැපීම නතර කරල දෙන්න. ඔබතුමාට තියෙන බලයත් එක්ක කරන්න පුලුවන්. ඒනිසා මම මේ ඉල්ලීම කරන්නෙ. ඒ ගැනත් සිහිපත් කරමින්, සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඌරල ළිඳ සම්බන්ධයෙන් කතා කරනවනම්, දවසක් පෞද්ගලිකව මම ගිහිල්ලා බැලුවා. ලිද පාවිච්චි කරන්නෙ නැහැ කිව්වා. මම ඇහුවා ලිද පාවිච්චි කරන්නෙ නැත්තෙ ඇයි කියලා. ඒ ඉඩම අයිති එක්කෙනා සභාපතිතුමා මේකයි මම මෙතන වැට ගහනවා. මම කිව්ව එහෙම කරන්න යන්න එපා. ඔතන ලිදක් තිබුනා. ඒ ලිද තියෙනවා. අපි ඒ ලිද සංවර්ධනය කරනවා. එතන ඉදිකිරීම කරන පුද්ගලයා කිව්වා ළිඳ සංවර්ධනය කරනවයි කියලා. ඔය අදාල පුද්ගලයා පසුගිය දිනක සභාවෙ හිටියා. මම එයාට ළිඳ පිළිබඳ කිව්ව ගමන්ම, මම එතන මගේ ඉදිකිරීම ඉවර කල ගමන්, ඔය ලිද සම්පූර්ණයෙන් හදල දෙනවා සභාපතිතුමා , කියලා කිව්වා. මම කිව්වා කරුණා කරල ඒක කරන්න කියලා. ඒවගේම ඔය ඉඩම අයිති එක්කෙනාට මම කිව්වා. කරුනාකරල ඔතන ඉඩමක් තිබුණා. ලිදක් තිබුනා. ඒක නිසා ඒ වපසරිය අතහැරලා වැට ගහන්න කියලා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ කීර්තිමත් දේශපාලඥයෙකු, ඒ වගේම කීර්තිමත් පවුලක ඉපදිලා, මේ ප්‍රදේශයටත් රටටත් අතිමහත් සේවයක් කළ අපගේ යූ ජී ඩී ආරියතිලක මැතිතුමා වෙනුවෙන් මගේ ශෝබය ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා. අපේ ගමට නම හැදිල තිබුනෙ යට ඇල මත්ත, උඩ ඇල මත්ත අපේ ගමේම කොටසක් තමයි. උඩලමත්ත වුනේ. එතුමා උඩලමත්තෙ ඉතා පාරම්පාරික ප්‍රභූ පවුලක ඉපදිලා, ඒ වගේම කැප්පිටියගොඩ ප්‍රදේශයේ ඉතාමත් ප්‍රභූ පවුලකින් විවාහ වෙලා, ප්‍රදේශයේ ජනප්‍රිය නීතිඥයෙකු මෙන්ම දේශපාලඥයෙකු වුන ආරියතිලක මැතිතුමා, අපි දන්න කාලෙ ඉදලා එතුමාගේ පියාගේ කාලෙ වෙච්ච සේවාවට අමතරව, එතුමත් ඒ මහජන සේවය අපි වෙනුවෙන් කළා. විශේෂයෙන් යටලමත්තෙ අස්සක් මුල්ලක් නැර, එතුමාගේ ආධාර, පාලම් බෝක්කු, ඒ වගේම ජනතාවට දුකේදි සැපේදි, මළ ගෙදරට මගුල් ගෙදරට හැම දේටම අල්ලපු ගමේ නියෝජිතයා වශයෙන් එතුමා අති මහත් සේවයක් කළා. එතුමා අපේ ගමේ කොටහලු මංගල්ලෙට, පිරිත් ගෙදරට, මළ ගෙදරට කිසි දෙයක් අත් ඇරියෙ නැහැ. අපි දන්න කාලෙ ඉදලා මනුස්සයො වෙනුවෙන් කරන්න පුලුවන් හැමදෙයකදිම, නඩුවකදි එතුමාට මනුස්සයෙක් ගිහිල්ල කිව්වොත් විශේෂයෙන් පීඩිත පංතියෙ ජනතාව වෙනුවෙන් නොමිලේ එතුමාගෙන් කරන්න ඕන සේවය කලා. එතුමා දේශපාලනය කළේ සමාජ සේවය වෙනුවෙන් මිස රැකියාවට දේශපාලඥයෙක් වුනේ නැහැ. එතුමා කළේ එතුමා දැනගෙන හිටිය දේශපාලනය, සමාජ සේවය. එතුමා යුතුකම ඉහලින්ම ඉෂ්ඨ සිද්ද කළා. එතුමා කනු කැටිය පාලම ඒ වගේ අපේ ප්‍රදේශයේ පාලම්, බෝක්කු, පාසල්, පන්සල් හැම එකකම හැම තැනම, එතුමා කළ සේවය අපි ගම්වාසීන් වෙනුවෙන් විශේෂයෙන් සිහිපත් කරනවා. ඒ වගේම යෝජනා වුනා. එතුමා වෙනුවෙන් මාවතක් ඉදිකරන්න. මමත් ඒ යෝජනාව අගේ කරනවා. ඒවගේම එතුමා වෙනුවෙන් එතුමාගේ නමින් මාවත් ඉදිකරන්න අවශ්‍ය කටයුතු ක්‍රමානුකූලව කරන්න කියලා මම සභාපතිතුමාට කියනවා. අපේ සමන් මන්ත්‍රීතුමා කිව්ව වගේ ඒ කටයුතු කරන්න අපි කටයුතු කරමුයි කියන යෝජනාවත් කරමින්, එතුමා වෙනුවෙන් බොහෝ කතා අපේ සභාවෙ මන්ත්‍රීතුමාලගෙන් කියවුනා. ඒ නිසා මම වැඩිදුර එතුමා වෙනුවෙන් කතා කරන්න යන්නෙ නැහැ. එතුමාගේ පවුලේ එතුමාගේ බිරියටත්, එතුමාගේ පුතනුවන්ටත් අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අද සභාවෙ දීර්ඝ වශයෙන් කතා කළා. මන්ත්‍රීවරු අදහස් දක්වපු වෙලාවක තවත් කාලය වැය කිරීම සුදුසු නැහැ. මත්ද්‍රව්‍ය ගැන පොඩ්ඩක් මටත් කියන්න හිතෙනවා. අපේ ගයාන් මන්ත්‍රීතුමා කිව්ව වගේ මත්ද්‍රව්‍ය ගැන අපි හැමදාම විරුද්දව කටයුතු කලා. හැම තැනම අපි ඒ වෙනුවෙන් පෙනී සිටියා. ඒත් මේ පොලීසිය මත්ද්‍රව්‍ය ඇල්ලීම කරන්නෙ, මත්ද්‍රව්‍ය ජාවාරම් කාරයා එහෙම නැත්නම් ව්‍යාපාරිකයා නෙවෙයි අල්ල ගන්නෙ. එතනට බොන්න යන මිනිහ අල්ල ගන්නවා. එදිනෙදා කුලියක් හම්බ කරගෙන බීලා එනකම් මග බලාගෙන ඉදලා ඒ මනුස්සය අල්ලල

දඩයක් ගහනවා. ඉතිං සමහර වෙලාවට ඒ මනුස්සය වෙනුවෙන් අපටත් කතා කරන්න වෙනවා. මොකද මුදලාලි අල්ලන්නෙ නැහැ. බොන්න යන අහිංසක මනුස්සය අල්ලනවා. මේ වගේ සමාජයක් තමයි තියෙන්නෙ. ඒව ගැන අපි ප්‍රමාණවත් විදිහට සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමාල කතා කළා. ඒ පිළිබඳ අවධානය යොමු කරමින්, ඒ වගේම අපේ අතිගරු ජනාධිපතිතුමගේ සංවර්ධන යටතේ, අපේ ගම්වල හැමතැනම ගෙවල් මංමාවත් ඉදිරියෙදි හැදෙනවා. ඒ වගේම වැඩසටහන් දැක්කම, අපට ලොකු බලාපොරොත්තුවක් තියෙනවා. යම් යම් අඩුපාඩු ඇති. හැම තැනම එහෙමයි. ඒ පිළිබඳ දීර්ඝ වශයෙන් කතා කළා. ඒ වගේම මට තව කිවයුතු දේවල් තිබුනත්,  මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම සුබ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය**

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මේ බල ප්‍රදේශයට, දිස්ත්‍රික්කයට ඉමහත් සේවාවක් කළ යූ ජී ඩී ආරියතිලක ඇමතිතුමාගේ අභාවය පිළිබඳ ශොකය ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම තමයි ලක්රුවන් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට ගම්මැද්දෙගොඩ උඩවැලිවිටිය මාර්ගය මේ වන විට ඉතා අවදානම් තත්වයේ පවතින්නෙ. ඒ නිසා මම මේ සැරේ යෝජනාවලට, ඒ මාර්ගය සංවර්ධනයට යම්කිසි මුදලක් යෝජනා විදිහට ඉදිරිපත් කළා. ඒ ප්‍රමාණය ඒ මාර්ගය සඳහා ප්‍රමාණවත් නැහැ. මොකද ඒ මාර්ගයේ හදන්න මගේ බල ප්‍රදේශයේ මීටර් 500 කට එහා කොටසක් තියෙනවා. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමාගෙ බල ප්රදේශයේ කොන්ක්‍රීට් කරපු කොටසෙන් එක කොටසක් අබලන් තත්වයේ පවතිනවා. තව කොටසක් සංවර්ධනය කරන්න තියෙනවා. ඒ නිසා ලක්රුවන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු විදිහට, ඒක දිස්ත්‍රික් සම්බන්ධී කරන කමිටුවට කාපට් යෝජනාවක් විදිහට ඉදිරිපත් කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කළා අද යෝජනාවක් විදිහට ගම්මැද්දෙගොඩ දකුණ, එකම පොදු ගොඩනැගිල්ල විදිහට තියෙන්නෙ ප්‍රජාශාලාව විතරයි. ඒක අපේ පඤ්ඤාලෝක හාමුදුරුවො මන්ත්‍රී ධූරය දරන කාලෙ උන්වහන්සේ විසින් ඉදිකරපු ගොඩනැගිල්ලක්. ප්‍රාදේශීය සභා අරමුදලෙන් හෝ  ප්‍රාදේශීය සභාව තුලින් ඉදිකරපු ගොඩ නැගිල්ලක්.  ඒකෙ මේවන විට ඉඩමේ අයිතියක් ප්‍රාදේශීය සභාව සතුත් නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුත් නැහැ. මම ප්‍රාදේශීය ලේකම් තුමියත් දැනුවත් කළා. ඔබතුමාවත් දැනුවත් කරනවා. ඒකෙ නීත්‍යානුකූල භාවය ලබා ගන්න ඉදිරියෙදි කටයුතු කරන්න කියලා. ඒ වගේම දැනට අපේ පවුල් සෞඛ්‍ය නිලධාරීතුමිය, පොඩි ළමයින්ගෙ බර කිරන්නෙත් එම ස්ථානයේ. ඒක නිසා ඒකෙ එතුමියට කාර්යාලය පවත්වාගෙන යන්න ඉල්ලීමක් කළා. එම ගොඩනැගිල්ලෙ කාමරයක් තියෙනවා. ඒකෙ වහල දෙවෙනි වතාවක් අලුත්වැඩියා කළා. අලුත්වැඩියා කරද්දි තිබුන පරන උළු ටික ලී ටික ගොඩනැගිල්ල ඇතුලෙ තියෙනවා. ඒවා සභාවෙන් ඉදිකරපු නිසා ඒව සභාව සතු ද්‍රව්‍ය. ඒ ටික සභා භාරයට අරගෙන මට ගොඩනැගිල්ල නිදහස් කරල දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම මේ ඉඩමෙ අයිතිකරු දැන් මිය ගිහිල්ලා. එතුමිය පවරපු දිව්රුම් ප්‍රකාශයක් විතරයි දැනට තියෙන්නෙ. ඒක ග්‍රාම සේවක රාලහාමි තමයි ඒ විස්තර ටික හරියටම දන්නෙ. ගරු සභාපතිතුමනි එම ගොඩ නැගිල්ල මට නිදහස් කරල දෙන්න කියලා ඉල්ලල සිටිනවා.

ඒ වගේම තමයි තවත් අවදානම් සහිත කාරණයක් කියන්න ඕන. සමහර විට මේ බල ප්‍ර දේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ලගේ පුරප්පාඩු ඇති. ඒ වුනාට ඒක නිදහසට කාරණයක් වෙන්නෙ නැහැ.  ගම්මැද්දෙගොඩ දකුණෙත්, ගම්මැද්දෙගොඩ උතුරෙත් කොවිඩ් තත්වය නිසා නිරෝධායනය කරන නිවාසවල  මේ ප්‍රශ්නෙ වුනා. මම ප්‍රාදේශීය ලේකම් තුමියත් දැනුවත් කළා. ගෝනදෙනියෙ ඉස්කෝලෙ විදුහල්පතිතුමාට කොවිඩ් පොසිටිව් වුනාට පස්සෙ, ඒ ඉස්කෝලෙ ගුරුවරු නිරෝධායනයට පත් කළා. 18 වෙනිද නිරෝධායනයට පත් කරපු නිවාසවල, නිරෝධායනය වන නිවසකි කියලා බෝඩ් එක ඇලෙව්වෙ 25 වෙනිදා.  ඒ වෙන කොට සම්බන්ධකම් පවත්වල ඉවරයි.

සාමාන්‍යයෙන් ගම්වල මිනිස්සු අල්ලපු ගෙදරට යනවා. කතා බහ කරනවා. ඒ වගේම ගම්මැද්දෙගොඩ උතුර 25 වෙනිද බෝඩ් එක ඇලෙව්වෙ පී සී ආර් එක ගත්තට පස්සෙ. 27 වෙනිද ඒ පුද්ගලයා පොසිටිව් කියලා වාර්තාවත් ආවා ඒ ගැටලුව නිසා බොහෝ පිරිසක් නිරෝධයනයට පත්කරන්න සිදු වුනා. ඒ වගේම ගම්මැද්දෙගොඩ උතුර බන්ධනාගාර ගතව සිටපු පුද්ගලයෙක් නිදහස් වෙලා ඇවිල්ලා, 27 වෙනිද නිදහස් වෙලා ආපු එක හතර වෙනිද තමයි 27 දිනේ දාල බෝඩ් එක ගැහුවෙ. ඒ ගැටලුවත් තියෙනවා. අඩු ගානෙ පරප්පාඩු කෙසේ වෙතත් ගමේ කොට්ඨාසයේ හෝ ග්‍රාම සේවා වසමේ රාජ්‍ය නිලධාරි නිලධාරීන් පිරිසක් ඉන්නවා. ඒ රාජ්‍ය නිලධාරි නිලධාරීන් පිරිස හරි දැනුවත් කරලා, මහජනතාව දැනුවත් කරන්න කියලා අදාල ස්ථානවලින් ඉල්ලීම් කරන්න. ඔබතුමා ඒ ඉල්ලීම කරලා, ඒ දේත් නිරාකරණය කරල දෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඔබ සැමට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ප්‍රධාන සභාවේ ලේකම් තුමිය ඇතුලු සියලුම දෙනාගෙන් අවසරයි. මම දීර්ගව කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මගේ යුතුකමක් ඉෂ්ඨ සිද්ද කරන්න තමයි බලාපොරොත්තු වෙන්නෙ. මොකද පහුගිය දවස්වල අපි අතරින් හදිසියේම වියෝවුනු, ප්‍රදේශයේ හිටපු ශ්‍රේෂ්ඨ දේශපාලඥයෙක් යූ ජී ඩී ආරියතිලක මැතිතුමන්, එතුමන් සමග අතීතයේ දශක කීපයකට ඉස්සෙල්ලා, එතුමත් මමත් එක දේශපාලන භූමිකාවක හිටියෙ. ඒ කාලෙ ඉදලා ලොකු බැදීමක් තිබුනා. ඒ බැදීම මිය යන තෙක්ම අප අතර තිබුනා. මළගම සිදුවුන අවස්ථාවෙත් මම ගිහිල්ලා ඒ වේදනාව ශෝඛය ප්‍රකාශ කළා. ඒ වගේම මේ සභාවට පැමිණි වෙලාවෙත්, අවසාන කටයුතු සිදු කරන අවසන් වෙලාව වෙනකනුත්, දේහය විතකය කරා ගෙනයනකනුත්, මම එතන රැදී හිටියා. මොකද අවුරුදු හැට ගණනක් වැනි කාලයකදි, එතුමා අප අතරින් සමුගැනීම පිළිබඳව අපි දැඩිසේ කම්පාවට පත්වෙනවා. මොකද එතුමා අති විශාල වැඩ කොටසක් කරල තියෙනවා. අපේ ප්‍රදේශවලත් විදුලිය නැති අයට විදුලිය ලබා දීලා, පාලම් ඒ වගේ සියලු වැඩසටහන් වලදි අවශ්‍ය සහයෝගයන් අපේ ප්‍රදේශවලට දීල තියෙනවා. ඒ නිසා මේ වෙලාවෙ මගේ පෞද්ගලික සංවේගයත්, අපේ ප්‍රදේශයේ සියලු ජනතාවගේ සංවේගයත්, මේ අවස්ථාවෙ පුද කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, තව එක දෙයක් කතා කරන්න ඕන. මොකද පහුගිය දවස්වල නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පරිසර කමිටුවක් පිහිටෙව්වා. මමත්, රංජිත් ජයවීර මන්ත්‍රීතුමත්, අපේ ගයාන් මන්ත්‍රීතුමත් විතරයි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හැටියට සම්බන්ධ වුනේ. ඒ පරිසර කමිටුව පිහිටවන කොට අපි අරමුණ නොදැන තමයි එතනට ගියේ. ඇත්තටම අපේ ප්‍රදේශයේ පරිසරයට අපි ආදරෙයි. මේක ආරක්ෂා වෙන්න ඕනෙයි කියලා, අපේ හදවතේ තියෙනවා. නමුත් එතනට ගියාට පස්සෙ අපිට ඇත්තටම කිසිම පැහැදීමක් ඇතිවුනේ නැහැ. කතා කරපු දේවල් රංජිත් ජයවීර මන්ත්‍රීතුමා, ගයාන් මන්ත්‍රීතුමා එහෙම ප්‍රශ්න යොමු කළා. හැබැයි කමිටුව පිහිටෙව්වා. හැම මාසෙකම නැවත රැස් වෙනවයි කිව්වා. නමුත් ඊට පස්සෙනම් රැස්වුනෙත් නැහැ. මේ වෙලාවෙ විශේෂයෙන් සිහිපත් කරන්න ඕන. පරිසර කමිටු පිහිටවන්න ඉස්සර වෙලා, පරිසරය පිළිබඳ පහුගිය යහපාලන ආණ්ඩුව කාලෙ විවිධ නීති රීති ගෙනාවා. හැබැයි අද වෙන කොට මේ සියලු නීති රීති වලපල්ලට ගිහිල්ලා. ඒව එකක්වත් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා ඒ කියපු කතාවල් හරි. පහුගිය කාලෙ සිරිසේන ජනාධිපතිතුමා ඉන්න කාලෙ, මේ පරිසරය ආරක්ෂා කරන්න. තමන්ගෙ බල ප්‍රදේශය ආරක්ෂා කරන්න. විවිධ නීති ගෙනාවා. හැබැයි අද මේ ආණ්ඩුව බලයට පත්වුනාට පස්සෙ සියල්ල කැලේට දාලා. අද පස් කපනවා. වැලි ගොඩ දානවා. කැලෑ කපනවා. සියල්ල සිදු වෙනවා. එහෙම කරන ආණ්ඩුවක් තමයි මේ පරිසර කමිටුවක් පිහිටවලා, මේක ආරක්ෂා

කරන්න හදන්නෙ. අපිට විහිලුවක්. ඇත්තටම මේවයින් ඉස්සෙල්ල ආණ්ඩුව නිදහස් වෙන්න ඕන. ආණ්ඩුව මේවයින් වලකින්න ඕන. මේව කරන අයට දඬුවම් දෙන්න ඕන. අද මම දන්නවා. අපේ ප්‍රදේශවල දැන් නැදුන් ගස්, කොස් ගස්වලට කිසිම පෝමිට් එකක් ඕන නැහැ. කැපුවා ගෙනිච්චා. අපේ ආණ්ඩුව කාලෙ ගෙනිච්ච නම්, මේ ඉන්න නිලධාරිත් පොලීසියත් සියල්ල ඇවිල්ලා කුදලගෙන ගිහින් නඩු දානවා. පස් එකක් අරන් ගිහිල්ලා හදිසියෙ අහුවුනානම් ඒ අරන් ගිහිල්ලත් උසාවි දානවා. අද ඒ මොකක්වත් නැහැ. අද ඕන වෙලාවක මේ ප්‍රධාන පාරෙ, කාපට් පාරෙ ඕන විදිහට පස් කපල අදින්න පුලුවන්. මෙන්න පරිසරය ආරක්‍ෂා කරන විදිහ. ඇත්තටම අපිට කණගාටුයි. මේ අපට රටට වෙනදේ. ඉහල තැන්වල කරන දේවල් ගැන මම කතා කරන්න යන්නෙ නැහැ. මේ අපේ ප්‍රදේශයේ වෙන දේවල්.

මම තව එක දෙයක් කියනවා. අපේ කීප දෙනෙක් සමෘද්ධිය පිළිබඳ කතා කලා. අපි ලක්‍ෂ හයකට පහුගිය කාලෙ සමෘද්ධිය දුන්නයි කිව්වා. හැබැයි අපට සමෘද්ධිය දෙන්න අවශ්‍යතාවය තියෙන පුද්ගලයන්ට සමෘද්ධිය දෙන්න අවශ්‍ය බලය දුන්නෙ නැහැ. මොකද කොට්ඨාසෙ ඉන්න නිලධාරි යාන්ත්‍රණයක් හරහා තමයි ක්‍රියාත්මක වුනේ. දේශපාලන සුදුසුකම් මත මේ අය විවිධ කොන්දේසි ගෙනැල්ලා, අපේ හදවතේ දෙන්න ඕන අවශ්‍ය කෙනාට සමෘද්ධිය දෙන්න ඉඩ දුන්නෙ නැහැ. මොකද අපේ දේශපාන ධාරාවෙ නෙවෙයි මේ නිලධාරි හිටියෙ. රජයේ නිලධාරි වුනත් මම මේ කතාව කියන්න ඕන. බොහොම සුලු පිරිසකට වගේ තමයි දුන්නෙ. නමුත් මේ අපට දිය යුතුම අහිංසක මිනිස්සුන්ට, ඒ සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න හැකියාව ලැබුනෙ නැහැ. ඒකත් අපට සමහර කොට්ඨාසවලට, දැන් මාපලගම අලුත් ඉහල, අලුත් පහල, කුඹුරුහේන කොට්ඨාසවල එක සමෘද්ධි කාඩ් එකක්වත් දෙන්න ලැබුනෙ නැහැ. ඒ සියල්ල රජය වෙනස් වීමත් එක්ක මේක ඇද ඇද ඉදලා. අන්තිමට ඒ හරියට සමෘද්ධිය දෙන්න වුනේ නැහැ. පරණතානායම්ගොඩ පහල, පරණතානායම්ගොඩ ඉහල, පරණතානායම්ගොඩ මධ්‍යම වසම්වලට සමෘද්ධි කාඩ් කීපයක් දුන්නා. අනිත් ඒවට දෙන්න ඇරියෙ නැහැ. මේ වගේ තත්වයක් තමයි තිබුනෙ. එහෙම කරල තමයි, මේ අය බලය ගත්තෙ. අද මේ අලුත් ආණ්ඩුව ගෙන යන වැඩසටහන් පිළිබඳව, මේ වෙලාවෙ ගොඩක් අය කතා කළා. දැන් මිනිස්සු රැවටිලා ඉවරයි. ඒ රැවටිල්ලට රැවටිල ඉවරයි. දැන් මිනිස්සු හූංලලා ඉන්නවා. මොකක්ද කරන්නෙ කියලා.

ඒ වගේම සභාපතිතුමනි, මම දැක්කා නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල හැම කොට්ඨාසෙකටම වගේ දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩා පිටි හදනවයි කියලා ඔබතුමා කිව්වා. මම මේ වෙලාවෙ ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මාපලගම මහජන ක්‍රීඩාංගනයේ දිවා රාත්‍රී අත්පන්දු ක්‍රීඩා කරන්න ස්ථානයක් අපට හදල දෙන්න. මොකද ඒ ප්‍රදේශයේ තරුණයන් ක්‍රීඩා කරන්නෙ මාපලගම ප්‍රධාන මහජන ක්‍රීඩාංගනයේ. ඒක නිසා මේ වෙලාවෙ ඒ බවත් සිහිපත් කරනවා. මම මේ වෙලාවෙ මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ඔබතුමන්ලගෙ අලුත් ආණ්ඩුව බොහොම හොදයි. මිනිස්සුන්ට සියලු වරප්‍රසාද ලැබිල තියෙනවා. මොකද අර අභාග්‍යයේ දැක්ම ක්‍රියාත්මක වෙනවා. ඒ දැක්ම ක්‍රියාත්මක වෙනකොට අද ඒ දැක්මෙ තිබුන සියල්ල කන පිට කරකැවිල යන්නෙ. ඒක නිසා අපට බලන් ඉන්න පුලුවන්. මොකද පහුගිය කාලෙ මිනිස්සු 69 ලක්‍ෂයක් ඡන්දෙ දුන්නෙ ඕව බලාගෙන නෙවෙයි. නමුත් අද ජනතාවට ඒක පාරාවලල්ලක් වෙලා. අද ඒ මිනිස්සු දුක් විදිනවා. ඒ නිසා මේ වෙලාවෙ අපි ඔබතුමන්ලගෙ රජයට ස්තූති වන්ත වෙනවා. බොහොම කෙටි කාලයකදි ජනතාව නොමරා මරාගෙන ඉදිරියට පාලනය ගෙනියන වකවානුවක, ඉදිරියෙදි ඒ ජනතාව ඔබතුමන්ලා වෙනුවෙන් ප්‍රතිඋත්තර ලබා දෙයි කියලා විශ්වාස කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීවරුනි, මම හිතුවෙ සභා රැස්වීම දහවල් එක වගේ වෙන කොට අවසන් කරයි කියලා. නමුත් දීර්ඝ වුනා. මොකද අද දහවල් එකට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවුල් 325 කට නොමිලේ විදුලිය ලබා දීම සිදු කරනවා. මේ මොහොත වෙන කොට. නමුත් එතනට අපට සහභාගි වීමට බැරි වුනා. ගරු මන්ත්‍රීවරුනි මන්ත්‍රීතුමියනි, අපි යථාර්තය අවබෝධ කරගෙන කටයුතු කරන්න ඕන කාල වකවානුවක්. අපේ දේශපාලන මතිමතාන්තර වෙනස් වෙන්න පුලුවන්. නමුත් සත්‍ය දකින අපි එක එක්කෙනාට බෝලෙ පාස් කර කර ඉන්නවට වඩා. සත්‍ය දැකලා, අවංකව මත ප්‍රකාශ කරන එක තමයි, මම හිතන්නෙ යුතුකම හා වගකීම. තිස් අවුරුදු යුද්ධයක් තිබුනා අපට මතකයි. නමුත් මෙවැනි තත්වයකට රට මුහුන පෑවෙ නැහැ. මොකද කොළඹ බෝම්බයක් පිපිරුවත්, ගාල්ලෙ බොම්බයක් පිපිරුවත් මේ නාගොඩට ප්‍රශ්නයක් ඇත්තෙ නැහැ. ජන ජීවිතය අඩාල වුනේ නැහැ. ජන ජීවිතය ඒ ආකාරයෙන් ගෙවුනා. ලෝක යුද්ධ වලදිත් එහෙමයි. නමුත් වර්ථමානෙ මේ කොවිඩ් වසංගත තත්වය තුල, අපි කිසිවෙක් නොසිතූ ලෙස සමාජය අඩපන වුනා. ඒ අඩපන වීම තුල මේ ශ්‍රී ලංකාවෙ අපි පමණක් නෙවෙයි. මුලු ලෝක වාසී සියලු දෙනාම  අසරණභාවයට පත් වුනා. ලෝකයේ ධනවාදීම රට ඇමරිකාවටත් මේ තත්වයමයි. ඒක මේ අපට විතරක් නෙවෙයි. ඒ නිසා අපි සද්භාවයෙන් සිතන්න ඕන දෙයක් තමයි, එක එක අයට බෝල පාස් නොකර, මේක පොදු ධර්මතාවයක්, පොදු දෙයක්. බඩු මිල ඉහල යාම පිළිබඳ, ඇත්තට අද ජීවත් වීමේ අපහසුතාවය තියෙනවා. නමුත් මේකත් අපට එක දවසක් හරි දරාගන්න සිදු වෙනවා. අපේ ජනතාව නිතරම බලාපොරොත්තුව බඩ. මට දැන් අධ්‍යාපන ක්‍රමවේදය ගැන කතා කරන කොට මතක් වුනේ. 1970 වසරේ සිරමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලෙ, වැඩපිළිවෙලක් කරගෙන ආවා. ඒකට අපේ මිනිස්සු මිරිස් පොලු, හාල් පොලු කියලා නම් දැම්මා. අධ්‍යාපන ක්‍රමවේදයක් ආවා. හොඳම අධ්‍යාපන ඇමති කියල මම හිතන්නෙ බද්යුදීන් මහම්මුද් අමාත්‍යතුමා. එතුමා රටට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් ඇති කළා ප්‍රාකෘති විෂය, මැටි විෂය කියලා එක එක විෂයයන් අද කාලෙට ගැලපෙන ආකාරයට කරගෙන ආවා. නමුත් 1977 න් පසුව පත්වුන ඒ ආණ්ඩුව ඒක නතර කරලා. වෙනත් ක්‍රමයකට යන්න ගියා. ඒ ආණ්ඩුව පත්වුනෙත් බඩ ගැන කියලා, ධාන්‍ය වර්ග 8 ක් දෙනව කියලා. ඒත් අපි ගියා. ඊලගට හඳෙන් හාල් දෙන්නත් කතා කළා. ඊට පස්සෙ ආණ්ඩුත් ඔය ආකාරයෙන් බඩ පෙන්නල තමයි මේ රට වෙනස් කළේ. නමුත් අපි යථාර්ත වාදීව හිතන කොට අද පවතින මේ බඩු මිලේ තත්වය අපිට මෙල්ල කරන්න හැකි වෙන්නෙ. අපි අපිම සද්භාවයෙන් කටයුතු කළොත් පමණයි. තනියෙන් රජයකට හැමදේම කරගන්න බැරි බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා අපි මෙතන කතා වුන බඩු මිල, වර්ථමාන තත්වය පිළිබඳ මම වැඩියමක් කියන්න යන්නෙ නැහැ.

ගරු මන්ත්‍රීවරුනි, මේ කොවිඩ් වසංගත තත්වය තුල වර්ථමාන රජය, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් සෞභාග්‍යයේ දැක්ම තුල ඔබ නොදකින. ඔබ  කතා නොකරන. බොහෝ දේවල් වෙනවා. ඔබතුමාල මෙතන කතා කරද්දි මම  අපේ බල ප්‍රදේශයේ වෙච්ච සිදු වීම් පිළිබඳ සිහිපත් කළා. මේ මොහොතෙ දස කෝටි හැට ලක්ෂයකට ආසන්න ප්‍රමාණයකට එහා ගියපු, අප බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය කරල තියෙනවා. ඒ එක්කම මේ අප්‍රේල් මාසෙ අවසන් වෙන කොට ග්‍රාම සේවා වසම් 53  මාර්ග 53 ක් වැඩ නිම කරන්න ලක්ෂ 20 ගානෙ මුදල් ප්‍රතිපාදන ලැබිල තියෙනවා. එතනත් දස කෝටි හැට ලක්ෂයක් යනවා. ඊලගට ගරු මන්ත්‍රීතුමනි, ගෙවල් 53 ක් මේ බල ප්‍රදේශයේ හැදිල ඉවරයි. තව ගෙවල් 53 ක් හදාගෙන යනවා. දල වශයෙන් තිස් කෝටියක් ඒ වෙනුවෙන් වියදම් කරනවා. එක නිවසකට ලක්ෂ හයක් දෙනවා. ඒක ආධාරයක්. ඒ වගේම බල ප්‍රදේශයේ අපේ යෝජනා හැටියට කිලෝ මීටර් 25 ක දුර ප්‍රමාණයට කාපට් ඇතිරෙනවා. අපේ බල ප්‍රදේශයේ කිලෝමීටර් 25 ක විතර ප්‍රමාණයක, මම නිවැරදිනම් ප්‍රාදේශීය සභාව හැටියට කිලෝ මීටර් 10 ක්, පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් කිලෝ මීටර් 10 හෝ 15 ක් මේ බල ප්‍රදේශයේ මාර්ග කාපට් වෙනවා.

අපි නිකන් දල වශයෙන් බැලුවොත් කෝටි 25 කට එහා පැත්ත. ඒ නිසා කෝටි 65 ක 70 ක විතර මූල්‍ය ප්‍රතිපාදන මේ බල ප්‍රදේශයට මේ රජය ලබා දීල තියෙනවා. ඒ මම සාමාන්‍ය තත්වෙ කිව්වෙ.

ඒ වගේම තමයි, ගරු මන්ත්‍රීවරුනි, ප්‍රාදේශීය සභාව හැටියට පසුගිය අවුරුද්දෙ විදුලි ලාම්පු 2751 ක් දාල තියෙනවා. මම නිකන් ගණන් හැදුවා. දොලොස් ලක්ෂ පනස් දාහක්. ඊලගට හය ලක්ෂ විසිපන්දහසක් අර කෝබ්‍රා ලයිට්වලට. දෙලක්ෂ පනස්දහසක් අර අලුත් කොකු වලට වියදම් කරලා තියෙනවා. මිලදීගත් බල්බ් ප්‍රමාණය 1983 යි. මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 281 ක් ලැබිල තියෙනවා. වගකීම් සහතික සහිත මාරු කිරීම් 427 ක් කරල තියෙනවා. ලේඛන හදල තියෙන්නෙ. මම හිතන විදිහට මේකේ ඕනනම් පොඩි වෙනසක් ඇති. ඔය ආකාරයෙන් තමයි වැඩකටයුතු සිදු වුනේ. මම මේ කියන්නෙ සාරාංශ ගතකිරීමක්. සභාවෙ මේ ආණ්ඩුව තුල, අපි ආපු කාලවකවානුව තුල, වැඩකටයුතු කරල තියෙන්නෙ ඔන්න ඔවැනි කටයුතු තමයි. මම මේ කිව්වෙ බොහොම සුළු ප්‍රමාණයක් පමණයි. පසුගිය සභාවේ චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා අනුමත වීපී ලාම්පු කීයද? වැඩිපුර කීයක් තියෙනවද? වීපී ලාම්පු කීයකට විදුලි බලමණ්ඩලයෙන් මුදල් ගෙවනවද කියලා ඇහුවා. ඒ අනුව අපට අනුමත වීපී ලාම්පු ගණන 243 යි. වැඩිපුර සවි කර ඇති වීපී ලාම්පු ගණන 1158යි. ඒ අනුව බල ප්‍රදේශයේ මුළු ලාම්පු ගණන 1401යි. 2020 වර්ෂයේ ජනවාරි මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා විදුලිබල මණ්ඩලයෙන් වීපී පහන් නඩත්තු දීමනාව වශයෙන් රු. 93852.00 ක මුදලක් අප වෙත ලබා දී තියෙනවා.

ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලගෙන් මත බොහොමයක් ප්‍රකාශ වුනා. අපි පිළිගන්නවා. අපේ වනමල් මන්ත්‍රීතුමා සමෘද්ධි සහනාධාරය දීපු ආකාරය පිළිබඳ කතා කළා. අපට හිනා යනවා. මේ මන්ත්‍රීතුමාල දන්නවා. අපි ඒ ගැන කතා කරන්න යන්නෙ නැහැ. අපේ ජයවීර මන්ත්‍රීතුමා කියපු ඒ පවුල අපට මුන ගැහුනෙ නැත්තෙ කොහොමද කියලා. ඇත්තටම කණගාටු වෙනවා. ඒ පවුල මේ අවුරුදු දෙකේ දුප්පත් වෙච්ච පවුලක් නෙවෙයි. එහෙනම් මුලදි ඉදලම මොනව හරි අඩුපාඩුවක් වෙලා ඇති. මේ සමහර නිර්ණායකවල යම් ගැටලු කාරී තත්වය නිසා. අපහසුතාවයට පත්වෙනවා. මම නම් පෞද්ගලිකව සමෘද්ධියට විරුද්ධයි. යැපෙන්නො ඇති කරන්න ඕන නැහැ. අද කවුද සමෘද්ධියෙන් දියුනු වෙලා තියෙන්නෙ. සමෘද්ධියෙන් සවිබල ගැන්විච්ච එකම පවුලක් කියන්න. දැන් අවුරුදු ගණනක ඉදන් සමෘද්ධිය දෙනවා. මේ අය යැපෙන්නො බවට පත්වෙලා මිසක් ඒකෙන් දියුනු වෙලා නැහැ. කවුරුවත් ඒකෙන් හැදිල නැහැ. අපේ මිනිස්සු හෙම්බිරිස්සාව වුනත් නිකන් දෙනවනම් ගන්නවා. සමෘද්ධිය කියන්නෙ වෙනත් විකල්පයකට හදාපු දෙයක්. පෞද්ගලික මගේ මතය, මම ඕන වෙලාවක මේක කියනවා. දේශපාලන වශයෙන් අපට පහරක් වෙන්න පුලුවන්. නමුත් සමෘද්ධිය දිය යුතු නැහැ. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව වගේ, ඒ අය සවිබල ගැන්වීම සඳහා යථා කාලෙදි අපේ හොද වැඩසටහනක් තියෙනවා. ඒ සවිබල ගැන්වීමේ ක්‍රමවේදයක් තියෙනවා. ඒකටයි අපි යායුත්තේ. අද සමෘද්ධිය පෙන්නල මිනිස්සු රවට්ටන්න හොද නැහැ. ඒකයි සමෘද්ධිය පිළිබද මම යමක් කතා කරන්නෙ. මොකද සමෘද්ධිය ලැබිය යුත්තො සමහර විට ගෙදර. අද අපි දන්නවා කතා වෙනවා. නමුත් මේ දේශපාලන මතිමතාන්තර හේතු නිසා සමෘද්ධිය කපා ගන්න බැරි වෙනවා. යාන වාහන ටැක්ටර් ඩෝසර් තියෙන අයට සමෘද්ධිය තියෙනවා. මේ සමෘද්ධි නිලධාරි නෙවෙයි, ඔබතුමා කිව්වට කොළඹ ගිහිල්ලා ලිස්ට් එක හදල ආපු සිද්දි තියෙනවා. ඒක අපිත් කරන්න ඕනද? ඒක වැරදියි කියලා කියනවා නෙවෙයි. නමුත් සුදනො වෙන්න යන කොට අපිටත් ඒවා කියන්න වෙනවා. ඒක නිසා සමෘද්ධිය දිය යුත්තේ, සමෘද්ධිය ලැබිය යුත්තෙකුට මිසක් ඒක නැතෙයි කියල කියන්නෙ නැහැ. නමුත් ඒකත් මම නම් කියන්නෙ අනවශ්‍යයි කියලා. සමෘද්ධිය ගත්තම ඒ පුද්ගලයා දවස් තුනක් සමෘද්ධි වැඩසටහන් වලට ගියාම තමන් දන්නෙ නැහැ. තමන්ට රුපියල් 3000 ක් පාඩුයි කියලා. නමුත් සමෘද්ධිය හම්බ වෙන්නෙ 2500 යි. ඒ සමෘද්ධිය ලබන කෙනා දේශපාලකයට, සමෘද්ධි සංවර්ධන අංශයට වැදගෙන යන්න ඕන. මිනිස්සුන්ට මේක තේරෙන්නෙ නැහැ. නිකන් දුන්නොත් ඔන්න හරි. ඒක තමයි වටිනාකම. ඒ නිසා මගේ නම් පෞද්ගලික මතය සමෘද්ධිය වැනි

දේවල්, මොනවත් නිකන් දෙන්න එපා. ශ්‍රමයක් ගන්න ඕන. ඒකයි මම පෞද්ගලිකව සිතන සිතුවිල්ල.

ඒ වගේම අපේ මන්ත්‍රීතුමාල කතා කළා. අතුරු ව්‍යවස්ථා පිළිබඳව. ඒක ගරු මන්ත්‍රීතුමන්ලා වුනේ, මීට මාසෙකට එකහමාරකට විතර කලින් මෙම පළාත් පාලන සංසදයෙන් ඇවිල්ලා මාව දැනුවත් කළා. මෙන්න මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා මේ පොත් පිංච දීලා, මන්ත්‍රීවරු දැනුවත් කිරීම ආදී කටයුතු කරලා දෙන්නම් කියලා. මම එක බැලුවම ඒක හරි වටිනවා. මොකද අපි වෙනත් තැන්වල ගිහිල්ලා පුහුණු වෙන එක, මෙහේටත් ඇවිල්ලා තව පුහුණුවක් දෙනවනම් හොදයි කියලා හිතලා,

**මෙන්න මේකයි එයාල කියන්නෙ. ශ්‍රී ලංකාව තුල පළාත් පාලන ක්ෂේත්‍රය තුල, උන්නතිය උදෙසා විශාල දායකත්වයක් සලසමින්, ශ්‍රී ලංකා පළාත් පාලන සංසදය මෙතෙක් පැමිණි ගමන් මග තුලින්, පළාත් පාලන ආයතන අභිමුඛ කරගත් ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය. සභාවන්හි ආදායම් හා අවශේෂ කර්තව්‍යයන් විධිමත් කිරීම් සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය. සභිකයන් හා මහජනතාව සහ සම්බන්ධතාවයන් ගොඩනැංවීම. පළාත්පාලන කාර්ය මණ්ඩල සඳහා වූ ධාරිතා වර්ධනය. සභාවන්හි කාර්යය හා කර්තව්‍යයන් විධිමත් කිරීම. කාර්යක්ෂමව පවත්වා ගැනීම හා තාක්ෂණික උපදේශනය. පළාත් මැතිවරණ ක්‍රම හා කාන්තා නියෝජනය ශක්තිමත් කිරීම. පළාත් පාලන ආයතනයන්හි සභිකයන් සහ නිලධාරීන්ට ජාතික ජාත්‍යන්තර අත්දැකීම් ලබා දීම. හරහා...**

ඒ කටයුතු පිළිබඳව අපිව දැනුවත් කරලා යම් දෙයක් කරන බව තමයි, මාව දැනුවත් කළේ. මම බොහොම කැමැති වුනා. ඒ පාර එයාලම දිනයක් මගෙන් ඉල්ලුවම මම දිනයක් දුන්නා. පුලුවන්නම් එන්න කියලා. මට ඕන කම තිබුනේ මේ සභාවෙ මන්ත්‍රීවරු දැනුවත් කරන්න. නමුත් එතුමන්ලගෙ අදහස අතුරු ව්‍යවස්ථා, ඒක අපට අදාල නැහැ. අදාල නැත්තෙ නැහැ. නමුත් අපට පොඩි ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා ඒක මම යෝජනාවකට දැම්මෙ නැත්තෙ සාකච්ඡාවකට බදුන් කරල තමයි, ඒක කරන්න ඕන. ඒ නිසා ඒ ගැන කතා කළේ. නැතුව අපට අවශ්‍යතාවයක් නැහැ. යම් යම් ආයතන කියන ඒවා කරන්න.

ඊලගට මත් ද්‍රව්‍ය පිළිබදව කතා කළා. මත් ද්‍රව්‍ය නිවාරණ අංශයකිනුත් ඇවිත් අපිව දැනුවත් කරලා 2006 යේ අංක 27 දුංකොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිනාරී පනත කියලා. පොත් පංචකුත් අපිට දීල ගියා. මේක දැනටත් පාර්ලිමේන්තුවෙ සම්මත වෙන්න යෝජනා කරපු පනතක්. පාසල්වල සිට මීටර් 100 ක් දුර දුම්වැටි විකිනීම කරන්න බැහැ. මේ සියලු දේවල් අපි සභාව හැටියට සාකච්ඡාවට බදුන් කරලා, අවශ්‍යතාවය අනුව ඒක ක්‍රියාත්මක කිරීම සහ යෝජනා කිරීම තමයි අපේ යුතුකම. ඒක නිසා අපි ඉදිරියෙදි සාකච්ඡා කරල මේව කරනවා, මිසක් හිතුමතේ අපි කරන්න යන්නෙ නැහැ. ඒකයි මම මේ පිළිබඳව සභාවට දැනුවත් කරන්න කටයුතු කළේ.

ඒ වගේම අපේ ගරු වෙරංග මන්ත්‍රීතුමා, පුරනැගුම පරිශ්‍රයේ තාප්පෙ බඳින්න සහ සියලුම දේ කරන්න. මම ගිහිල්ලා බැලුවා. පුරනැගුමෙ ඒ කටයුත්ත යතා කාලෙදි වෙනවා. ඇත්තටම මට අවශ්‍යතාවය තියෙන්නෙ. කොන්ත්‍රාත් දීල කරන්න නෙවෙයි. මේක ඍජු ශ්‍රමයෙන් කරලා යම් මුදලක් ඉතිරි කරන්න. මොකද අපේ සභාවෙන් වැය කරන නිසා ඒක සාධාරණව වියදම් කරන්න. සිවිලිමේ අලුත්වැඩියා කටයුතු අපට කරන්න බැහැ. මම ගිය සුමානෙ ගිහිල්ලා ඒක බැලුවා. ඒක ටිකක් ලොකු වැඩක්. ඒකට මම තාක්ෂණ නිලධාරීට කියලා ඇස්තමේන්තුවක් හදා ගන්න ඕන. ඒ සියල්ල එකට යතා කාලෙදි, තව මාසයක් දෙකක් ඇතුලත කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද ඔය සියලු කටයුතු කරන්න තමයි මම අපේ සභාවෙ මුදල් ඉතුරු කරගෙන ඉන්නෙ. ඒ වගේම පොල පිළිබදව කතා කළොත්, මම ගියා ඇත්තටම මේ අවස්ථාවෙ පොලේ මුදලාලිලාගෙ ප්‍රශ්නයක් තියෙනවයි කයලා, පොල කරන කෙනා කිව්වා. දැන් පොලේ කඩ එක එක අල්ලගෙනෙයි කියලා. මම කිව්වා මේ තාවකාලිකව මිසක් තවම කඩ දෙන්නෙ නැහැ. හැදුවට පස්සෙ සාධාරණව ඒ

කටයුත්ත සිදු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. සියලු මන්ත්‍රීවරු ඒක දැනුවත් වෙන්න. මොකද මන්ත්‍රීවරුත් සහභාගි කරගෙන, කඩ හදල ඉවර වුනාට පස්සෙ තමයි කඩ ටික සාධාරණව බෙදල දෙන්නෙ. තව අඩුපාඩු තියෙනවා ඒවත් කරලා මම හිතන්නෙ ඒක කරගන්න පුලුවන් වෙයි. ගරු මන්ත්‍රීතුමා ගමේ අය කඩ ගන්න බලාපොරොත්තුවෙන් හිටියට මුලින්ම ඒ අයට දෙන්න බැහැ. පොලේ එදා ඉඳලා ආපු අයට දීල තමයි ගමේ අයට දෙන්න ඕන. අපි එතනදි සාධාරණ වෙන්න ඕන. පොලේ එදා ඉඳලා හිටපු, එදා ඉඳල ආපු අය සභාවෙ නිලධාරීන් දන්නවා. ඒ කට්ටියට වෙන් කරල තමයි. ගමේ අයටත් වෙන්කරන්න වෙන්නෙ. ඊලගට තව එතන ත්‍රීවිල් පාර්ක් එකකට ඉල්ලුවා. මම කිව්වා සලකල බලල එතන ඉස්සරහ දෙන්නම් කියලා. තව අපේ බලාපොරොත්තුවක් තියෙනවා. එතන තව කඩ පේලියක් දාන්න. සමහරවිට යථා කාලෙදි පුලුවන් වෙයි.

ඊලගට ගරු මන්ත්‍රීතුමාලා අපි පවර ගත්ත තල්ගස්වල ඉඩමේ වෙළඳ සංකීර්ණයක් ඉදිකරන්න ලක්ෂ 100 ක් අපට ලැබිල තියෙනවා. ඒ ලක්ෂ 100ට ඇස්තමේන්තු හදලා අමාත්‍යාංශයට ලබා දෙනවා. අමාත්‍යාංශෙන් ඇවිල්ල බලල ගියා. ඒක අනුමත වුනා. ඒකෙ ඇස්තමේන්තු හදලා හෙට ලබා දෙනවා. ඒ කටයුතුත් එහෙම වෙනවා. ඊලගට පොල සංවර්ධනය සඳහා ලක්ෂ 15 ක මුදල් වෙන් වෙලා තියෙනවා. ඇස්තමේන්තු හදාගෙන ඉදිරියෙදි අඩුපාඩු තියෙනවනම් ඒව කරන්න ඕන කොහොමද කියලා අපේ මන්ත්‍රීවරු අපිව දැනුවත් කරන්න. එතකොට අපි ඒ සියලු දෙනාගෙ අදහස් උදහස් අරගෙන තමයි කටයුතු කරන්නෙ. ඒ වගේම ආදාහනාගාරය පිලිබඳව නිතර කතා කරනවා. දැන් ඒකෙත් අවසන් අධියරට ඇවිල්ල තියෙන්නෙ. ඒ ඉඩමෙ තක්සේරු වාර්තාව, තක්සේරුව ලක්ෂ 20 ක් ඇවිල්ලා. මම ඒකට විරෝධයක් පෑවා. මොකද ලක්ෂ 20 ක් තක්සේරු කරන්නෙ මොනවත් ඉන්දන්න බැරි ස්ථානයක්. නමුත් තක්සේරුව ඒක ඇප්තොප් වත්තටනම් අඩු තක්සේරුවක් එන්නෙ. ඒ ලැබුණු මුදල ඉතුරු කරගෙන ඒක අපට කරන්න පුලුවන්. අනිත් ඒවත් කරන්න පුලුවන්. අපි තක්සේරු මුදලින් 25%ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැම්පත් කරන්න ඕන. මට ඒත් අමාත්‍යාංශයෙන් කිව්වා ඒක ප්‍රශ්නයක් නෙවෙයි ඔයා තක්සේරු වාර්තාව ගන්න කියලා. මෙම මුදල නොගෙවා නිදහස් කර ගන්න බැහැ. බද්දෙගම ප්‍රාදේශීය සභාවටත් ලක්ෂ 18 ක් ගෙවන්න කියලා එතනත් ප්‍රශ්නයක්. ඒක වැවිලි සමාගමෙන් නඩු කියනවා. නඩු කියලා ගන්නවා. මම ටිකක් සුහදව කතා කළ නිසා වැවිලි සමාගමෙන් කිව්වා. සභාපතිතුමා, ඔබතුමාලනෙ මේ ලෙඩේ ඇද ගන්නෙ. අපිට පොඩි තක්සේරුවක් දෙන්න. නමුත් තක්සේරු අය අඩුවට තක්සේරු කරන්නෙ නැහැ. ඒක එයාල නියම තක්සේරුව කරන්නෙ. මම ඊයෙත් තක්සේරු කාර්යාලයට ගියා. එයාලත් පොඩි ආරවුල් කාරයො. මම බොහොම සමබරව එකේ කටයුත්ත කර ගන්න බලන්නෙ. මට අමාත්‍යාංශයේ හොඳ ලේකම් වරයෙක් හමු වුනා. සභාපතිතුමා, දැන් අවුරුදු කීයක්ද මේ කටයුත්තට කියලා ඇහුවා. මම හිතන්නෙ හුගක් දුරට ඒක මේ අවුරුද්දෙම කටයුතු කරගන්න පුලුවන් වෙයි කියලා හිතෙනවා. ඔන්න ඔය වගේ කටයුතු තමයි අපි කරගෙන යන්නෙ. ඒ නිසා අපේ වරදි අඩුපාඩු ඇති. අපි මහ හයියෙන් සද්දෙ දාගෙන වැඩ කරන්නෙ නැහැ. නමුත් අපේ නිලධාරින්ගෙ අඩුපාඩු තියෙනවා. මට කියන්න වෙනවා. දැන් මටම ඇඟිලි ගහ ගහ ඉන්න බැහැ. ලියුමක් ආවාම මේ ලියුම අසවල් තැනට යන්න ඕන කියලා මට කියන්න බැහැ. මටත් ඕව මතක තියාගෙන ඉන්න බැහැ. මට වැඩ ගොඩක් තියෙනවා. මළ ගෙදරක් වුනාම බල්බ් එක ගැනයි, පාරවල් හදන කටයුතුයි සියළුම දේ මේ නිලධාරින්ට නෙවෙයි මටම තමයි කියන්නෙ.

ඊලගට දැන් කොවිඩ් වසංගතෙත් එක්ක පෞද්ගලික ගෙවල්වල, ආයතනවල විෂබීජහරණය කරන්න ඉල්ලනවා. ඊයෙ පෙරේදා මම පොඩ්ඩක් නිවාඩුවක් ගන්න හැදුවා. කෝල් එනවා, මේ අත්සන් කරන්න තියෙනවා කියලා. ඊට පස්සෙ මම බස් එකේ ඇවිල්ලා අත්සන් කරලා, ඒ අවශ්‍ය කටයුතු කළා. මට තමයි හැම දේම කියන්නෙ. ඊලගට මේ වොලි බෝල් ක්‍රීඩාංගන ගැන කතා කළා. අපේ අමාත්‍ය නාමල් රාජපක්ෂ තරුණ අමාත්‍යතුමා එතුමාගේ හොඳ සංකල්පයක්. ක්‍රීඩාවට හොඳ ආදරයක් තියෙන තරුණ අමාත්‍යවරයෙක්. එතුමා ලංකාවෙම දිවා රාත්‍රී ක්‍රීඩා කළ හැකි වොලි බෝල්

ක්‍රීඩා පිටි 343 ක් ඉදිකරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට එකයි. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුල නාගොඩ ප්‍රාදේශීය සභාව හරහා එකයි. මම ලිස්ට් එක බැලුවා. ලිස්ට් එක බලන කොට නාගොඩ වොලි බෝල් ක්‍රීඩා පිටිය, බද්දෙගමට ක්‍රීඩා පිටියක් දීලා. උඩුගම දකුණ ක්‍රීඩා පිටියත් නම් වෙලා තියෙනවා. මම කිව්වා ඒකත් දෙන්න ඕන. මොකද ආසන දෙකක්. බද්දෙගම ආසනේ සහ හිනිදුම ආසනේ. උඩුගම දකුණ ක්‍රීඩා පිටිය බද්දේගම ආසනේ. සභාපතිතුමා වැරදීමක් වෙලා. මම කිව්වා දැන් යෝජනා කරලා, ඇස්තමේන්තුත් හදල ඉවරයි. ඊයෙ කිව්වනම් අද ඇස්තමේන්තු හදල ඉවර කරන්න කිව්වා. වොලිබෝල් පිටි සඳහා ඇස්තමේන්තු හදන්න අපේ ටී ඕ මහත්තයල දන්නෙ නැහැ. හැම තැනටම කතා කරල ඇස්තමේන්තු හදලා පස්සෙන්දම යැව්වා. ඊට පස්සෙ තමයි මේ විස්තරේ කියන්නෙ. කරුණාකරලා ඒක දෙන්න කියලා මම කිව්වා. ඒ පාර සම්පත් මහත්තයටත් කතා කළා. සම්පත් මහත්තයත් කිව්වා එකයි දෙන්නෙ කියලා. ඊට පසු අපේ ඉසුරු මන්ත්‍රීතුමාට කතා කරලා, අපට මේක කරගන්න ඕන කියලා මම කිව්වා. ඉසුරු මන්ත්‍රීතුමා කතාකරලා කොහොමහරි එහෙම කර ගන්න හැකියාව ලැබුණා. වසන්ත මන්ත්‍රීතුමා කිව්ව මාපලගම කීඩා පිටිය තමයි අපි යෝජනා කලේ. නමුත් එතන ලක්‍ෂ 50 ක්. හැම අවුරුද්දෙම ලක්ෂ 50 බැගින් වෙන් වෙලා, ප්‍රධාන ක්‍රීඩා පිටිය හැටියට යෝජනා වෙලා, ඒක සංවර්ධනය වෙනවා. එතන වොලි බෝල් ක්‍රීඩා පිටිය කරන්න බැහැ. ඒ පාර උනන්විටිය පාසලේ ක්‍රීඩා පිටියයි, උඩුගම ක්‍රීඩා පිටියයි තමයි අපි යෝජනා කරල දැන් කරන්න බලාපොරොත්තු වෙන්නෙ.

ඊලගට ප්‍රදේශයේ හැම ක්‍රීඩා පිටියක්ම සංවර්ධනය කරන්න රුපියල් ලක්‍ෂ 10 ක මුදලක් එනවා. ඊලගට තව ක්‍රීඩා පිටි දෙකක් තියෙනවා. අපට පවරගන්න බැහැ. තක්සේරු වාර්තාව වැඩියි. උඩුගම දකුණෙ සුදුවැලිපොත ක්‍රීඩා පිටි දෙකක් ලක්‍ෂ 19 යි. ලක්‍ෂ 14 යි, තක්සේරු කරල තියෙන්නෙ. අපිට කර ගන්න විදිහක් නැහැ. මම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගියාට පස්සෙ, මම කිව්වා අපට අඩු තක්සේරුවක් දෙන්න කියලා. උඩුගම මහජන ක්‍රීඩාංගනය ලගදි සංවර්ධනය කරන්න අපි යෝජනා දීල තියෙනවා. ඔන්න ඔය වගේ තමයි කටයුතු වෙන්නෙ. සංවර්ධන ක්‍රියා දාමයන් වෙනවා. කාපට් ව්‍යාපෘති, පාරවල්වල යම් යම් අඩුපාඩු අපහසුතාවයන්ට පත්වෙලා තියෙන්නෙ. එක කොන්ත්‍රාත් කරු කීපයක් අරගෙන එක එක තැන කටයුතු කරන නිසා ඒ අවස්ථාවෙ පොඩ්ඩක් පරක්කු වීමක් වෙනවා. පසුගිය දා අපේ ලාන්සා ගරු රාජ්‍ය අමාත්‍යතුමා අපේ සියලුම මන්ත්‍රීවරු මේ පිළිබඳව සාකච්ඡාවකට කැඳවලා තිබුනා. එතනදි අපට ප්‍රකාශ වුනා. මේ 2025 වෙනකම් යන කාපට් ව්‍යාපෘති මේ අවුරුද්දෙ මේ කටයුතු සම්පූර්ණයෙන් ඉවර කරලා, නැවත ලක්‍ෂ ව්‍යාපෘති ඊලග අධියරේ කරනවයි කියලා. ඒ නිසා අපෙන් යෝජනා ඉල්ලලා අපි ඒක දැන් ලබා දීල තියෙනවා. ඒ කටයුත්ත යථා කාලයෙදි වෙයි. අපි කවුරුත් දැනගෙන ඉන්න, මේ රටේ මේ තියෙන වසංගත තත්වයත් එක්ක මේ සේරම කරන්නෙ. අපේ අය අඩුපාඩු දැක්කම තමයි කතා කරන්නෙ. හොඳ දෙයක් කතා කරීම අඩුයි. ඒ නිසා මේ රජය ගෙන යන වැඩපිළිවෙල හොඳයි. කැලෑ කැපීම කවුරු කළත් වැරදියි. අපි දන්නවා පහුගිය කාලෙත් කැලෑ කැපුවා. දැන් දඩුවම් දෙන්නෙ නැහැ කියල තමයි මේ ආණ්ඩුවට බනින්නෙ. හිටපු අමාත්‍යවරයෙකුට කැලෑ කැපුවයි කියලා, චෝදනා තිබුණා. නමුත් එදා කවුරුවත් කතා කළේ නැහැ. නෙළුවෙ ලංකාගම පාරක් හදනවා. කිසිම කැලෑවක් කපල නැහැ. ඒ පාර සංවර්ධනය කරල තියෙනවා. පාරක් කපද්දි ගහක් දෙකක් කැපෙනවා. රුමස්සල පිළිබඳ මම දැනුවත් වීමක් නැහැ. ඒකත් මම ඊයෙ පෙරේද පත්තරෙන් දැක්කෙ. ගරු මන්ත්‍රීතුමා ඒවත් ඉතින් හිටපු රජයේ බලධාරීන් බලය දීපුව තමයි. රටක් දියුනු වෙන්නත් ඕන. රටේ සංවර්ධනය වෙන්නත් ඕන. පරිසරය ආරක්‍ෂා වෙන්නත් ඕන. ඔය සේරම සමබරව කෙරෙන්න ඕන. අපි නිතරම වැරැද්දම දකින්න හොඳ නැහැ. හොඳ දේ හොඳයි කියමු. කොහොම නමුත් මම හිතනවා මීට කලිනුත් කිව්ව වගේ, එන මාසෙ වෙන කොට මේ රටේ අපේ ඇතිවෙලා තියෙන මේ වසංගත තත්වය 100% කෙසේ වෙතත් 99% යක්ම මර්ධනය කරගත හැකි වෙතැයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මොකද අපේ රට එහෙමම අවාසනාවන්ත නැහැ. අපි බුදු දහම අදහන රට හැටියට දෙවියො විසින් හැම එකකින්ම අපි ආරක්‍ෂා කර ගන්නවා. ඒ නිසා අපට ඒ බලාපොරොත්තුව තියෙනවා.

ගරු මන්ත්‍රීවරුනි, මම අවසන් වශයෙන් කියනවා. මම ඒක නොබියව කියන එකක්. කොට්ඨාශ 15 වේ මන්ත්‍රීවරු 15 දෙනෙක් ඉන්නවා. මතිමතාන්තර වෙනස් ඇති. නමුත් මගේ යුතුකමක් තියෙනවා. ඒ 15 දෙනා මූලික කරගෙන කටයුතු කරන්න. ඒ මන්ත්‍රීවරුත් දැනගන්න ඕන තමන්ගෙ බල ප්‍රදේශයේ අනිත් මන්ත්‍රීවරුත් එක්ක සහයෝගෙන් සාමූහිකය වැඩ කරන්න. නමුත් මම කාටවත් කෙනෙහිලි කම් කරන්නෙ නැහැ. මම මීට වඩා යමක් කතා කරන්න යන්නෙ නැහැ. කාල වේලාව ඉක්ම ගියා එහෙමනම් අද බොහෝ වේලාවක් සභාවෙ කටයුතු කළා. සියලු දෙනාම සහයෝගය දැක්වූවා. සියලු දෙනාගේ යම් අදහස් ප්‍රකාශ වුනා. ඒ ප්‍රකාශ කිරීම්වලට ගරු කරමින් සභාවේ වැඩ කටයුතු මෙතෙකින් නිමා කරනවා. සභාවේ ලේකම් තුමියට, නිලධාරීන්ට මම කියනවා මන්ත්‍රීවරුන්ගෙන් වචන අහන්නෙ නැතුව, ඒ අදාල කර්තව්‍යයන් හරියට ඉටු කරන්න කියලා ඉල්ලා සිටිමින්,

පසුගියදා අභවප්‍රාප්ත වූ මේ සභාවේ ප්‍රථම සභාපති අධිනීතිඥ යූ ජී ඩී ආරියතිලක ඇමතිතුමා පිළිබඳව කියන්න, මම මෙය අවස්ථාවක් කර ගන්නවා. යූ ජී ඩී ආරියතිලක ඇමතිතුමා අපි ආශ්‍රය කරන්න පටන් ගත්තෙ, හුගාක් ඉස්සර දේශපාලනයට එන්න කලින්. නුග දූවෙ ඉස්කෝලෙ මහත්තයයි කියලා, උඩලමත්තෙ හිටපු ගෞරවනීය ඉස්කෝලෙ මහත්තය මේ සභාවෙ ගම් සභාව හැටියට නියෝජනය කරපු ඉස්කෝලෙ මහත්තයෙක්. එතුමාගේ පුත්‍ර රත්නය තමයි යූ ජී ඩී ආරියතිලක මැතිතුමා. එතුමා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලෙ අධ්‍යාපනය ලබලා තමයි ක්‍රියාකාරී දේශපාලනයට යොමුවුනේ. එම් එම් මන්ත්‍රීතුමා, උපසභාපතිතුමා දන්නවා. එතුමා හොද ක්‍රීඩකයෙක්. ක්‍රිකට් ක්‍රීඩාවට බොහොම ඇල්ම බැල්ම තිබුන ක්‍රීඩකයෙක්. ඒ වකවානුව තුල ක්‍රීඩාවට එකතු වෙලා අපි බොහොම ලෙන්ගතු වුනා. ඒ කාල වකවානුවෙ තමයි මෙතුමා සමාජ සේවයට එන්නෙ. මොකද ක්‍රීඩාව අපිට කාටත් සමාජ සේවාවන්වලට මූලික වුනා. අපි මේ මන්ත්‍රීවරු වුනේ වර්ථමානයේ පාර්ලිමේන්තුවෙත්, පළාත් සභාවෙත් ප්‍රාදේශීය සභාවලත් හුගක් දෙනා ක්‍රීඩාව නිසා, සමාජ සත්කාරයට ඇවිල්ලා. මේ දේශපාලනයට අවතීර්න වෙච්ච යොමු වෙච්ච අය. නියාගම පැත්තෙන් චමිලි මහත්තය වුනත්, සම්පත් මහත්තය වුනත්, අපේ ගයන්ත මහත්තය වුනත්, අපට මතකයි නියාගම අපි ක්‍රීඩා කළා. ක්‍රිකට් ගැහුවා. බද්දෙගමත් එහෙමයි. අපේ සුසන්ත උප සභාපතිතුමා, ක්‍රීඩාවෙන් දැනහදුන ගත්තෙ. අපේ ඥාති සම්බන්ධතා එක්ක බොහොම ලෙන්ගතු වුනා. එතුමා මේ සභාවේ පළමු සභාපති වෙද්දි 1991 මට එතුමට ඡන්දෙ දෙන්න බැරි වුනා. මම හිටියෙ නැහැ. පසුකාලීනව පළාත් සභා යද්දි, අපි එතුමා වෙනුවෙන් බොහොම ඇප වෙලා, කැපවෙලා වැඩකටයුතු කළා. අපි බලාපොරොත්තු වුනා මහ ඇමති කරන්න. නමුත් අපට ඒ හැකියාව වුනේ නැහැ. අපේ අවාසනාව වෙන්න ඇති. එතුමා මහ ඇමති කරන්න ගිය නිසා අපට වෙනත් අයගෙන් ලැබෙන්න තිබුන වරප්‍රසාධ ලැබුනෙත් නැහැ. අපි එතුමා මහ ඇමති කරන්න ගියෙ හැබැයි එතුමා මහ ඇමති කරන්න ගියාට, එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී කරන්න ගියාට, එතුමාගෙන් අපි ලබාගත්ත වරප්‍රසාදෙකුත් නැහැ. එතුමා ඇත්ත ඇති සැටියෙන් කතා කළා. අපි හම්බ වුනත් මල්ලියෙ කොහොමද මොකක්ද කරන්නෙ මෙහෙමයි කියනවා මිසක්, අපි එතුමාගේ ගුණ වයන්නෙ මතක තියා ගන්න එතුමාගෙන් ලාභ ප්‍රයෝජන ලබා ගත්ත කෙනෙක් හැටියට නෙවෙයි. එතුමා අවංකව වැඩකටයුතු කළා. තමන්ගෙ මතයේ හිටියා. ඒ අවස්ථාවෙ සමහර ඒවට අපි දොස් කිව්වා. එතුමා ජීවිතයෙන් සමුගැනීම කාටවත් වලක්වන්න බැහැ. හැබැයි රාජ්‍ය ඇමති කෙනෙක් වෙලා එතුමට අවසන් ගමන් යන්නට තිබුනා. මෙතුමා 1991 වර්ෂයේ සභාවට ඇවිල්ලා, 1993 පළාත් සභාවට ගිහිල්ලා, 1997 සභා නායක වෙලා, ඊට පස්සෙ වසර 15 ක් අඛණ්ඩව අමාත්‍ය ධුර ලබපු අමාත්‍ය වරයෙක්, කෘෂි කර්ම ඇමති, සමූපකාර ආහාර ඇමති, වාරි මාර්ග ඇමති, ඔය ලොකු අමාත්‍ය ධුර රැසක් දරලා, අපේ ගමට අපේ ප්‍රදේශයට එතුමා කැටපිලර් එකක් දීලා, මාස ගණනක් අපි මේ පාරවල් කැපුවා. ඒකෙන් අපි හරි ජනප්‍රිය වුනා අපට හොද ලකුණු වැටුනා. එතුමා ඒක අපට කළා. ඒ පොදු වැඩවලදි එතුමා අපට උදවු කළා. පෞද්ගලිකව අපි වාසි අරගෙන නැහැ. එතකොට කෘෂි කර්මෙට එතුමා බොහොම උනන්දුවෙන් වැඩ කළා. නමුත් අපේ මිනිස්සු දැනගත්තෙ නැහැ ඒකෙන්

ප්‍රයෝජන ගන්න. එතුමා අපට ඇලවල් කපන්න, ප්‍රතිපාදන ලබා දුන්නා. හැබැයි කුඹුරු කළේ නැතුව, ඒකෙන් අපි බැනුම් ඇහුවා. ඇමතිතුමයි මමයි දවසක් අමාත්‍යාංශයෙදි කතා බහක් වුනා. හොඳ ඇමති කෙනෙක්. කෙනහිලිකම් එතුමාට වුනා. එතුමා ගාල්ල ආසනයේ සංවිධායක කමට පත් වුනා. අක්මීමන ආසනයේ සංවිධායක කමට පත් වුනා. බද්දෙගම ආසයේ වැඩ බලන සංවිධාක ලෙස හිටියා. ඒවගේම තමයි කාටවත්ම නොලැබෙන වාසනාවක්, අවසන් ගෞරව දක්වන මොහොතෙ එතුමාට ලැබුනා. ඒ තමයි ජනාධිපතිවරු තුන්දෙනෙක්ගෙ අවසන් බුහුමන් ලබපු, මම හිතන්නෙ එකම මෑතකාලීන දේශපාලඥයෙක් තමයි. අතිගරු අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, හිටපු ජනාධිපතිනී අපේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, අපි සිටින වෙලාවෙම ඇවිල්ලා ශෝකය ප්‍රකාශ කරලා, පැය ගණනක් ඉදලා ගියේ. අපේ හිටපු කතා නායක, වත්මන් අමාත්‍ය චමල් රාජපක්ෂ ඇමතිතුමා, මහින්ද අමරවීර අමාත්‍යතුමා අවසන් බුහුමන් දක්වන්න අපේ සභාවට ඇවිල්ල ගියා. එවැනි වාසනාවක් එතුමා ලැබුවා. ජීවත් වෙලා ඉන්න කාලෙ, යම් කෙනහිලිකම් වලට යොමු වුනාට, එතුමා මුදලට යට වුන කෙනෙක් නෙවෙයි. තමන්ගෙ රැකියාව හැටියට නීතිඥ වෘත්තියෙදි, මුදලට ඒ සේවය කළාට, අපි දන්නවා එතුමා ඡන්දය ඉල්ලද්දි උඩලමත්තෙ අය දන්නවා එතුමගෙ ඉඩමක් විකුණන බව. හැම ඡන්දෙකටම එතුමා ඉඩමක් විකුණනවා. මිනිස්සු දන්නවා මෙතුමා ඡන්දෙ ඉල්ලනවනම් ඉඩමකුත් විකුණනවා කියලා. උඩලමත්තෙ වැඩිම ඉඩම් හිමියෙක් හැටියට හිටියෙ එතුමාලා. පසුව ඒවා මේ දේශපාලනේ නිසා නැති කර ගත්තා. ඒ කොහොම නමුත් තමන්ට තමන් හදා ගත්ත ගේත් තවම වැඩ ඉවර කර ගන්න බැරි වුනා. අපේ ගෙදර ඉස්සරහමයි ගේ තියෙන්නෙ. එකම පුත්‍ර රත්නය ඇමරිකාවෙ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලබලා, මාසයයි ඇවිල්ලා. මට එතුමා ප්‍රකාශ කළා තාත්ත එක්ක විනාඩි පහකට වැඩිය කතා කරන්න හම්බ වුනේ නැත කිව්වා. ඒ පුතණුවන් ඇත්තටම හොඳ රත්තරං පුතණුවෙක්. ආරියතිලක මැතිතුමා සභාපතිවෙලා, විවාහ වුනේ සභාවෙ පුස්තකාලාධිපතිනී නිලධාරිනියක් සමග. අපේ සභාව එතුමාගේ දේශපාලන ජීවිතයේ හැරවුම් ලක්ෂක් වුනා. අපි ගරු කළේ. අදත් ගරු කරන්නෙ ඒ නිසා. එහෙමනම් යූ ජී ඩී ආරියතිලක කියන කෘතහස්ත දේශපාලඥයාට අපි කවුරුත් අමා මහ නිර්වාන සම්පත්තිය ප්‍රාර්ථනා කරමින්, ශෝක යෝජනාව, සම්පූර්ණ වාර්තාව එතුමාගේ ආදරණීය බිරිද සෙනෙවිරත්ත මැතිනියට යොමු කරන හැටියට ඉල්ලා සිටිමින්, සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. සැමට සම්මා සම්බුදු සරණයි. බොහොමත්ම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී 　　　　　　　　　　　දිනය:-